# පිරිවෙස් මානත් පිරිමේදී දතයුතු කරුණු, චතුර්විධ කර්ම

## සහ

### අටුවාව පිළිබඳ කෙටි හැඳින්වීමක්

මකුලෑවේ සුදස්සන හිමි

# පිරිවෙස් මානත් පිරිමේදී

# දතයුතු කරුණු, චතුර්විධ කර්ම

## සහ

### අටුවාව පිළිබඳ කෙටි හැඳින්වීමක්

**මකුලෑවේ සුදස්සන හිමි**

ප්‍රථම මුද්‍රණය : උඳුවප්/2559 ( 2015 දෙසැම්බර් )

Copyright © Ven. Makulewe Sudassana Thero

## ශ්‍රී සද්ධර්ම මන්දිරයෙන් ප්‍රකාශිත/සංරක්ෂිත වෙනත් ධර්මග්‍රන්ථ

- විස්තර සහිත අභිධම්මමාතිකා පාළි ව්‍යාඛ්‍යානය
(සධම්මපාල රත්නායක දසසිල් උපාසක තැන)

- පාරුපනනය (චීවරප්‍රමාණාදිය සහිතයි)
(අතිපූජනීය ශ්‍රී සීලරතන සරණජොතිස්සාභිධාන මහනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ)

**ප්‍රකාශනය**
ශ්‍රී සද්ධර්ම මන්දිරය
'සදහම් සෙවණ'
134/A, ගලගෙදර වත්ත,
වැල්හේන පාර, මාතම්මන,
මිනුවන්ගොඩ.

**පොත් ලබා ගැනීම සහ නැවත මුද්‍රණය සඳහා, සියලු විමසීම්,**
දහම් මැදුර භාවනා මධ්‍යස්ථානය
නෙළුම් පෙදෙස,
කලපළුවාව,
රාජගිරිය.

Tel **: 071-9374002, 071-4417813**
E-mail **: info@sadaham.net**
Web **: www.sadaham.net**

# පිදුම

*භදන්තාචාර්ය බුද්ධඝෝෂාභිධාන මහාස්වාමීන් වහන්සේගේ ශ්‍රී නාමයටත්*

*අප ගුරුදේවෝත්තම නුවරඑළියේ ඤාණසීලාභිධාන මහාස්වාමීන් වහන්සේටත්*

*බැතියෙන් පුදනෙමි.*

## 'සබ්බ දානං ධම්ම දානං ජිනාති'

(සියලු දානයන් අතරින් ධර්මදානය උතුම් වේ.)

**පුණ්‍යානුමෝදනාව**

මාතර, හිත්තැටිය නැගෙනහිර, කිරිගෙදර වත්තේ විසූ

**එච්. ජී. චාර්ලිනාහාමි, හක්මන ලියනගේ**

**අන්ද්‍රයස් අප්පු,**

**එච්. එල්. ධර්මාවතී, කේ. ඒ. දයාපාල**

සහ

ගම්පහ විජය පාරේ විසූ

**කේ. ජී. චන්ද්‍රදාස මහතාට**

නිවන් සුව පිණිසත්,

**සත්මි කවිත්මා කොඩිතුවක්කු දියණියගේ**

අධ්‍යාපන කටයුතු සාර්ථක වී

තෙරුවනේ අනන්ත මහා සූවිසි ගුණ බලයෙන්

නිදුක් නිරෝගී චිර ජීවනය ලැබ

උතුම් ධර්මාවබෝධය පිණිස හේතු වේවා!

---

**OCEAN LINKS LOGISTICS (PVT) LTD.**

**ආයතනයේ කාර්ය මණ්ඩලය, ගණුදෙනුකාර පිරිස**

**ඇතුළු සියළු දෙනාට ම**

**උතුම් නිවන් සුව පිණිස හේතු වේවා**

සනත් කොඩිතුවක්කු
රසිකා මාලගේ
අංක 67/7, දඹුව වත්ත, කිණිගම, බුත්පිටිය.

# කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| අං.නි. | : | අංගුත්තර නිකාය |
| බු.ජ.ත්‍රි. | : | බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා |
| බෞ.ස.ම. | : | බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය |
| ම.ඡ.ස. | : | මරම්ම ඡට්ඨ සංගායනා |
| සම. පා. | : | සමන්තපාසාදිකා |
| හේ.මු. | : | හේවාවිතාරණ මුද්‍රණය |

# පටුන


i. ප්‍රස්තාවනා ---------------------------------------------------- viii

ii. හැඳින්වීම ----------------------------------------------------xviii

1. පිරිවෙස් මානත් පිරීමේදී දතයුතු කරුණු --------------------- 01
- ❖ ඇවැත් ---------------------------------------------------- 03
- ❖ දසවිධ පච්ච්ඡන්නභාවය ------------------------------ 07
- ❖ පටිච්ඡන්න පිරිවෙස හා පටිච්ඡන්න මානත ------------- 11
- ❖ ඡන්දය දීම ------------------------------------------- 13
- ❖ අත්පස ----------------------------------------------- 15
- ❖ නික්ඛිත්ත අනික්ඛිත්ත භේදය -------------------------- 16

2. සුද්ධන්ත පිරිවෙස ----------------------------------------- 19
- ❖ චූලසුද්ධන්තය ------------------------------------- 19
- ❖ මහාසුද්ධන්තය ------------------------------------ 20

3. සමෝධාන පිරිවෙස --------------------------------------- 21
- ❖ ඕධානසමෝධාන ----------------------------------- 21
- ❖ අග්ඝසමෝධාන -------------------------------------- 23
- ❖ මිස්සකසමෝධාන ---------------------------------- 24
- ❖ අපටිච්ඡන්නමානත ------------------------------- 26
- ❖ පක්ඛමානත ------------------------------------------ 26
- ❖ සමෝධානමානත ---------------------------------- 27

4. පිරිවෙස් පුරන භික්ෂුවගේ රාත්‍රිච්ඡේද -------------------------- 28
- ❖ සහවාසය -------------------------------------------- 28
- ❖ විප්පවාසය ----------------------------------------- 29
- ❖ අනාරෝචනය ---------------------------------------- 29

5. මානත පුරන භික්ෂුවගේ රාත්‍රිච්ඡේද --------------------------- 39
- ❖ ඌනගණ චරණය ---------------------------------- 39
- ❖ 'දේවසිකං ආරෝචේතබ්බං' යන්න.---------------------- 43

6. නාම සම්මුති ---------------------------------------- 44
❖ වැදගත් කරුණක් ---------------------------------------- 46

7. චතුර්විධ කර්ම ---------------------------------------- 48
❖ විවාදධිකරණ ---------------------------------------- 48
❖ අනුවාදධිකරණ ---------------------------------------- 49
❖ ආපත්තාධිකරණ ---------------------------------------- 49
❖ කිච්චාධිකරණ ---------------------------------------- 50
❖ අපලෝකන කම්ම ---------------------------------------- 50
❖ ඤත්ති කම්ම ---------------------------------------- 50
❖ ඤත්තිදුතිය කම්ම ---------------------------------------- 55
❖ ඤත්තිචතුත්ථ කම්ම ---------------------------------------- 56

8. චතුර්විධ කර්ම අසිද්ධියට පත්වන අයුරු -------------------- 59
❖ වස්තු වශයෙන් කෝප්‍යවීම ---------------------------- 59
❖ ඤත්ති වශයෙන් කෝප්‍යවීම -------------------------- 61
❖ අනුසාවන වශයෙන් කෝප්‍යවීම ---------------------- 61
❖ සීමා වශයෙන් කෝප්‍යවීම ---------------------------- 65
❖ පරිස වශයෙන් කෝප්‍යවීම ---------------------------- 68
❖ ඡන්දපාරිවාසිය ---------------------------------------- 69
❖ පටික්කෝසනය ---------------------------------------- 71

9. අටුවාව පිළිබඳ කෙටි හැඳින්වීමක් -------------------------- 75
❖ අටුවාව ---------------------------------------- 75
❖ අටුවා පිළිබඳ ටීකාවෙන් පිළිබිඹුවන කරුණු ------------ 83
❖ වැදගත් කරුණු කීපයක් ------------------------------ 93

# ප්‍රස්තාවනා

**'පිරිවෙස් මානත් පිරීමේදී දත යුතු කරුණු, චතුර්විධ කර්ම සහ අටුවාව පිළිබඳ කෙටි හැඳින්වීමක්'** යන නමින් භික්ෂූන් වහන්සේ වෙත පිරිනැමෙන මෙම ග්‍රන්ථය ථේරවාදී විනයෙහි පැනෙන සංඝාදිසේස ගරුකාපත්තිවලින් නැගී සිටීම සඳහා වත් මානත් පිරීම සම්බන්ධව පෙළ, අටුවා, ටීකා හා තදනුගත සාහිත්‍යය ඇසුරින් සම්පාදිත භික්ෂූන්ගේ ශීල පාරිශුද්ධිය සඳහා උපකාරවත් වූ ග්‍රන්ථයකි. පිරිවෙස් මානත් පිළිබඳව ථේරවාදී විනයට අදාළව කරුණු ගෙනහැර දක්වන මෙම ග්‍රන්ථය මගින් මේ පිළිබඳ දැනුවත්වනු රිසි භික්ෂූන් වහන්සේලාට පොත්පත් ගණනාවකින් ලබා ගත යුතු වූත් අප්‍රකට වූත් තොරතුරු රැසක් මෙය පරිශීලනයෙන් ඉතා නිරවුල්ව ලබා ගැනීමේ අවස්ථාව සැලසේ. කිසියම් කරුණක් ඉදිරිපත් කිරීමේ දී පෙළ, අටුවා, ටීකා ආදි සියල්ල අනුපිළිවෙළින් තබා නවීන තාක්ෂණය ආදියෙහි බලපෑම ද සසඳමින් කතුවරයා කරුණු ඉදිරිපත් කරන ආකාරය නිවැරදි විනය විනිශ්චයන් කරා යාමේ දී බෙහෙවින් වැදගත් වේ. එමෙන් ම අදාළ තැන්හි විධිමත් ලෙස උද්ධෘත දක්වා තිබීම නිසා වැඩි විස්තර සඳහා පෙළ, අටුවා, ටීකා ග්‍රන්ථ නිවැරදිව හා පහසුවෙන් අධ්‍යයනයට ද මෙය මහඟු මග පෙන්වීමක් සිදු කර ඇත. එමනිසා ශීල පරිශුද්ධිය මෙන් ම ශාසනික අභිවෘද්ධිය අපේක්ෂාවෙන් ක්‍රියා කරන සංඝයා වහන්සේට මෙම ග්‍රන්ථය හස්තසාර වස්තුවක් වනු ඇත.

බුදුරජාණන් වහන්සේ සම්බුද්ධත්වයට පත් පළමු වසර 20ක කාලය තුළ ශාසනය නිරර්බුද කාලයක් වූ අතර ඉන්පසුව භික්ෂූන් වෙත (ලාභ බහුලවීම, පිරිස බහුලවීම ආදි) ආසවට්ඨානීය ධර්ම පහළවීමත් සමඟ විනය ශික්ෂාපද හඳුන්වාදීමට භාග්‍යවතුන් වහන්සේට සිදුවිය. භික්ෂූන් අතරෙහි කිසියම් නිමිත්තක් පැනනඟින තෙක් ශික්ෂාපද නොපැනවූ අතර ආදිකම්මිකයාට නිදහස හිමි විය. ඉන්පසු යමකු අතින් කිසියම් විනය කඩවීමක් වූ විට ඒ ඒ ශික්ෂාපදයන්හි බරපතලකම අනුව ඊට අදාළ කාර්ය හෝ ප්‍රතිකර්ම කිරීමේ මාවතක් ද භික්ෂු විනයෙහි දක්වා තිබේ. බුදුදහමෙහි පව් සමාකිරීමක් නොමැත. අදාළ වරදට අනුව තමන්

සිටින තත්ත්වයෙන් පහළට යාම හෝ පිරිවෙස් මානත් පුරා පිරිසිදු වීම නොහොත් ආයති සංවරයෙහි පිහිටීම ආදි ක්‍රම මගින් ඊට පිළියම් යොදා තම ආධ්‍යාත්මික ගමන් මගෙහි ඉදිරියට යාමේ ක්‍රමයක් අනුදන වදරා ඇත.

මහාප්‍රඥාවෙන් හෙබි භාග්‍යවතුන් වහන්සේ මහාකරුණාවෙන් යුතුව හඳුන්වා දෙන ලද විනය ශික්ෂාපද තුළින් නිවන් මගට හානිදායී වූත් අප විසින් නොයායුතු වූත් සීමාවන් හඳුනා ගැනීමට මහත් අත්වැලක් සපයා ඇත. තම ශ්‍රාවකයන් කෙරෙහි අපමණ කරුණාවෙන්, දෙව්මිනිසුන් කෙරෙහි අසීමිත දයාවෙන්, අනාගතය පිළිබඳ විශද ප්‍රඥාවෙන්, ශාසන චිරස්ථිතිය පිළිබඳ බලාපොරොත්තු සහගතව බුදුරදුන් පනවා වදාළ හැම ශික්ෂාපදයක් ම නිවන් මග ගමන් කරනු රිසි සැදැහැවත් ශ්‍රාවකයාට මහත් රැකවරණයක් වනු ඇත. බුදුරජාණන් වහන්සේ නොමැති උන්වහන්සේගේ අග්‍රශ්‍රාවක, මහාශ්‍රාවකයන් වහන්සේලා පිරිනිවන් පා ඇති කල්‍යාණ මිත්‍රයන් විරල මෙවන් සමයක භික්ෂූන් වහන්සේ වටා ආරක්ෂාවට සිටින මහාප්‍රාකාරයක් බඳු රැකවරණය වන්නේ විනය ශික්ෂාපදයි. නිවන්මග වඩන සැදැහැවත් භික්ෂුව කුඩා වූ ද වරදෙහි බිය දකිමින් (අනුමත්තේසු වජ්ජේසු භයදස්සාවී) සීලය පිළිබඳ මනා අවධානයෙන් කටයුතු කිරීමේ දී තමන් රකින ශික්ෂාපද තමාට කිසිවිටෙකත් කරදරයක් හෝ නිදහස සීමා කිරීමක් වශයෙන් නොදකින අතර සෑම ශික්ෂාපදයක් ගැන ම සිතන විට ශාස්තෘ ගෞරවය ද දියුණු වේ. තවද ශ්‍රද්ධාවෙන් විනය හදාරා ප්‍රතිපත්තිගරුකව එය ජීවිතයට සම්බන්ධ කරගත් පමණට තම ආධ්‍යාත්මික දියුණුව වේගවත් වන අතර එමගින් ශාසනික කටයුතුවලට මහත් පහසුවක් මෙන් ම ආශීර්වාදයක් ද වනු ඇත. ඒ අතර බුදුරදුන් පනවා වදාළ සෑම ශික්ෂාපදයක් ම ශාසන චිරස්ථිතියට බෙහෙවින් උපකාරී වනු ඇත. තවද එය නොපැහැදුණවුන්ගේ පැහැදීම පිණිසත් පැහැදුණවුන්ගේ අධිකතර ප්‍රසාදය පිණිසත් හේතු වනු ඇත. මෙකී විනය ශික්ෂාපදයන්හි පවත්නා වටිනාකම වැටහෙන්නේ ඒවා පනවා නොතිබුණා නම් අද ශාසනයට වන්නේ කුමක්ද යන්න සිතා බැලීමෙනි.

බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන ලොවට ඇති උතුම් ම රුවන් තුනයි. ශාස්තෘන් වහන්සේ පිරිනිවන් පා ඇති මෙවන් සමයක බුද්ධ

රත්නය හඳුනා ගත හැකි වන්නේ ධර්මය තුළිනි. ධර්මය අසා දරා ගත හැකි වන්නේ ශ්‍රාවක සංඝ රත්නය වැඩ සිටීමෙනි. සංඝයා නැති කල ධර්මය හෝ ශාස්තෘන් වහන්සේ සජීවී නොවේ. එබැවින් තෙරුවන ජීවමාන කරවන දෘශ්‍යමාන රත්නය වන්නේ සංඝරත්නයයි. සංඝරත්නයේ චිර පැවැත්ම රඳා පවත්නේ උන්වහන්සේලා විනයවත් වූ පමණටයි. විනය සාසනයේ ආයුෂ වශයෙන් සංගීතිකාරක මහරහත් උතුමන් සඳහන් කර ඇත්තේ එබැවිනි (විනයෝ නාම සාසනස්ස ආයු). විද්‍යාවිමුක්තිය නිෂ්ඨාව කොට ඇති ශාසන බ්‍රහ්මචර්යාවෙහි අවසාන පරමාර්ථය සීලය නොවේ. නිවන සඳහා හික්මෙන ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂාවෙහි ශීලය යනු ආරම්භක පියවරක් පමණි. මහාසාරෝපම සූත්‍රයෙහි සඳහන් පරිදි යමකු ශීලයෙන් පමණක් සෑහීමට පත්ව සීලය පරම නිෂ්ටාව කොට සිටී නම් ඔහු 'ගසක අරටුව අපේක්ෂාවෙන් වනයට ගිය තැනැත්තකු ගසෙහි පිට පොත්ත පමණක් රැගෙන යන්නෙකු මෙන්' බ්‍රහ්මචර්යාවෙහි පිටපොත්ත පමණක් ගන්නකු වශයෙන් දක්වා තිබේ (මහාසාරෝපම සුත්ත, ම.නි. 1). එමනිසා සීලය අවසාන නිෂ්ඨාව කර නොගෙන සීලය සමාධියටත් සමාධිය ඥාන දර්ශනයටත් ඥානදර්ශනය (අසමයවිමොක්ක නම් වූ) ආශ්‍රව ක්ෂය කිරීමටත් උපකාර පිණිස යොදාගත යුතු බව බුදුදහමේ අනුශාසනයයි.

අතිශය දීර්ඝකාලයකට වරක් ලොව පහළවන සම්බුදු සසුනෙහි ශ්‍රාවක භික්ෂු පිරිසක් නිර්මාණය කිරීමෙන් බුදුපියාණන් වහන්සේ අපේක්ෂා කළේ හුදෙක් නිවන් දකින කණ්ඩායමක් තැනීම පමණක් නොව පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධ ශාසනය තව බොහෝ කලක් දෙව්මිනිසුන්ගේ යහපත උදෙසා ලොව පවතිනු දකීමයි. එහිලා පරමාදර්ශී පිරිසක් ලොවට ඉදිපත් කිරීමටත් ඒ පිරිස දෙව්, මිනිස්, බඹ, මර යන කිසිදු කෙනෙකු අබියස දෙවෙනි නොවන ලෙසත් ඒ හැමට අනුත්තර පින් කෙතක් වනු සඳහාත් ඇදිලි බැඳ ඒ සැමගේ වන්දනමානනයට සුදුසු වනු සඳහාත් උපරිම ශික්ෂණයකින් ක්‍රියා කරනු දකීමත් උන්වහන්සේගේ අපේක්ෂා විය. ඒ අනුව ශාසන බ්‍රහ්මචර්යාව මැනැවින් සපුරා ගැනීමටත් සම්බුදුසසුන තව බොහෝ කලක්

නිරුපද්‍රැතව පවත්වා ගැනීමටත් භාග්‍යවතුන් වහන්සේ පනවා වදාළ විනය ශික්ෂාපදයන්ගෙන් මහත් උපකාරයක් සැලසෙනු ඇත.

පාරාජිකා, සංඝාදිසේස යනාදි ප්‍රධාන ශික්ෂාපදයන් පනවා නොතිබුණු බුදුරදුන් සම්බුද්ධත්වයට පත් පළමු වසර 20 තුළ සංඝයා අතරෙහි සීලය ආරක්ෂා වූයේ කෙසේදැයි කෙනෙකුට ප්‍රශ්නයක් පැන නැඟිය හැකිය. ප්‍රථමාභිසම්බුද්ධ සමයෙහි ශාසන අර්බුද විරල සමයක් වූ අතර විනය ශික්ෂාපද පනවා නොතිබුණ ද අදාළ ශික්ෂණය, ධර්මය තුළින් ම ආරක්ෂා විය. තථාගත දහම මනාව අසා එය තේරුම් ගෙන සම්මාදිට්ඨියට පත්ව මැනැවින් සිත රැකගෙන දහම් මගෙහි ගමන් කරන්නේ නම් එමගින් කායික වාචසික සංවරයෙන් යුත් සීලය සම්පූර්ණ වන අතර නිරායාසයෙන් ම විනය ශික්ෂාපද ද ආරක්ෂා වනු ඇත.

බුදුදහමින් ප්‍රකාශිත නිර්වාණාවබෝධයට උපකාරවත් වූ සීලය සම්පූර්ණ වන්නේ එය සම්මාදිට්ඨිය පෙරටු ව පැවතීමෙනි ***(සම්මාදිට්ඨි පුරේ ජවං)***. 'සම්මාදිට්ඨි' (ම.නි.) ආදි සූත්‍රයන්හි දැක්වෙන පරිදි සම්මාදිට්ඨිය සම්පූර්ණවීමට නම් දස කුසලයන් හා දස අකුසලයන් පිළිබඳවත් එම කුසලයන්ට හා අකුසලයන්ට මුල්වන අලෝභ, අද්වේෂ, අමෝහ, ලෝභ, ද්වේෂ, මෝහ යන කුසලාකුසල මූලයන් පිළිබඳවත් මනා දැක්මක් පැවැතිය යුතු ය. එනම් ඒ ඒ සිල්පද සුරක්ෂිතවීමට හේතුවන කුසල මූලයයන් පිළිබඳවත් එම සිල්පද කඩවන්නේ නම් ඊට හේතු වූ අකුසල මූලයන් පිළිබඳවත් පැහැදිලි අවබෝධයක් තිබීම අවශ්‍ය කෙරේ. ඒ අතර කර්ම, සච්ච, ආහාර ආදි කරුණු පිළිබඳවත් ජරාමරණ, ජාති, භව ආදි පටිච්චසමුප්පාදයේ අංග පිළිබඳවත් යන මේ කවර හෝ අංගයක ස්වභාවය, එහි සමුදය, නිරෝධය, නිරෝධගාමිනී පටිපදාව ආදි වශයෙන් යථා ස්වභාවයෙන් අවබෝධ කර ගැනීමට සමත් වුවහොත් සම්මාදිට්ඨියට පත් ව සීලය සම්පූර්ණ කර ගනිමින් ආර්ය මාර්ගයේ සෙසු අංගයන් ද සපුරා ගැනීමට  අවස්ථාව උදාවේ.

බුදුදහමින් අපේක්ෂිත ශීලය සම්මාදිට්ඨිය පෙරටු කොට ගමන් කරන්නක් වන විට කුසලාකුසල පිළිබඳවත් විශේෂයෙන් පටිච්චසමුප්පාදය පිළිබඳවත් මනා දර්ශනයක් තිබීම අවශ්‍ය කෙරේ. ***'දිට්ඨිං ච අනුපගම්ම සීලවා දස්සනෙන සම්පන්නෝ'*** (මෙත්ත සුත්ත, ඛු.පා./සු.නි.) යනුවෙන් දැක්වෙන පරිදි දෘෂ්ටීන්ට නොපැමිණ දර්ශනයකින් යුක්ත

සීලය බුදුදහමින් නිර්දේශ කොට තිබේ. එසේ නම් ශාශ්වත උච්ඡේද නැතහොත් 'ඇත-නැත' අන්තයන්ගෙන් මිදුණු පටිච්චසමුප්පාද දර්ශනයෙන් යුක්ත සීලය කුමක්දැයි දැනුවත්වීම ද මෙහිලා වැදගත් වනු ඇත. සත්ත්ව ජීවිතයක පැවැත්ම යනු රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පංචකයේ පැවැත්මයි. නැතහොත් චක්ඛායතන, රූපායතන ආදි අභ්‍යන්තර හා බාහිර දොළොස් ආයතනයන්ගේ ක්‍රියාකාරීත්වයයි. එසේත් නැතහොත් චක්ඛුධාතු, රූපධාතු, චක්ඛුවිඤ්ඤාණධාතු ආදි අටලොස් ධාතුන්ගේ පැවැත්මයි. මේ ආදී විග්‍රහයන්ගෙන් දැක්වෙන පරිදි බුදුරජාණන් වහන්සේ විසින් දේශිත සත්ත්ව ක්‍රියාකාරීත්වය සිදුවන්නේ හේතුඵල දහම තුළ ක්‍රියාත්මක වන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ස්වභාවයට අනුවයි. නිදසුනක් වශයෙන් ගතහොත් අප යමක් පිළිබඳ ඇස්, කන්, නාසාදි ඉන්ද්‍රිය මගින් කිසියම් අත්දැකීම් ලැබීම යනු රූපාදි ස්කන්ධ පංචකයේ හටගැනීමයි. ඒ අනුව රූපාදි අරමුණු විෂයයෙහි කිසියම් දැනුමක් ලැබීමේ දී ස්කන්ධ පංචකය ම පෙරපසු නොවී හටගෙන නිරුද්ධවීම් වශයෙන් එම අද්දැකීම ලැබේ. එම අද්දැකීම ලැබීමේ දී රූපාදී ස්කන්ධ පංචකය, නැතහොත් චක්ඛාදි ආයතන දොළොස, එසේත් නැතහොත් චක්ඛුධාතු ආදි අටලොස් ධාතු හේතුන්ගේ සමවාය වශයෙන් වර්තමානයෙහි හටගෙන ඉතිරි නැතිව නිරුද්ධ වේ. එය අතීතයෙන් වර්තමානයට නොපැමිණෙන වර්තමානයෙන් අනාගතට නොයන හේතු ඇති විට ඒ ඒ මොහොතට හටගෙන (***අස්මිං සති ඉදං හොති***) හේතු නිරුද්ධ වීමෙන් ඒ ඒ මොහොතට නිරුද්ධ (***අස්මිං අසති ඉදං න හොති***) වන ස්වභාවයකි. අතීත, වර්තමාන, අනාගත යන කාලත්‍රයට අයත් යම්තාක් අත්දැකීම් ඇද්ද ඒ සියල්ල පෙර නොතිබී හටගෙන ඉතිරි නැතිව නිරුද්ධ වන (***අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති***) යථාර්ථයක් බවත් එම යථාර්ථය සිතන වර්තමාන මානසික ක්‍රියාකාරිත්වයක් වේද එය ද පංචුපාදානස්කන්ධයෙන් තොර නොවූවක් බවට ද නිතර සිහිය හා නුවණ පවත්වා ගත යුතු ය.

ඒ අනුව ස්කන්ධයන්ගේ හටගැනීම නුවණින් දකින විට 'නැත' යන උච්ඡේද දෘෂ්ටියෙන් දුරුවේ. තවද හටගන්නා ස්කන්ධයන්ගේ නිරුද්ධවීම වැටහීමෙන් 'ඇත' යන ශාශ්වත දෘෂ්ටියෙන් මිදේ. මෙලෙස හටගැනීම් හා නිරුද්ධවීම් එකවිට දකින නුවණින් යුතුව 'ඇත','නැත'

ආදි අන්තයන්ගෙන් මිදුණු සැබෑ මධ්‍යම ප්‍රතිපදාව හමුවන්නේ මෙවැනි දර්ශනයක් තුළිනි. මෙබඳු සම්‍යග් දර්ශනයක් ලබාගත් ශ්‍රාවකයාට එම දැනීම දැක්මක් මෙන් ම ජීවිත අත්දැකීමක් වශයෙන් ස්ථාවරත්වයට පත්වනු සඳහා ගමන් මගක් සෙවීමේදී හමුවන ප්‍රතිපදාව නම් සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිශික්ෂාවෙන් යුත් ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එවිට හමුවන සීලය 'ඇත' (සස්සත) හෝ 'නැත' (උච්ඡේද) යන දෘෂ්ටීන්ට නොවැටුණ සැබෑ විමුක්තියක් කරා යන්නක් වනු ඇත.

භාග්‍යවතුන් වහන්සේ මහාකරුණාවෙන් හා මහාප්‍රඥාවෙන් ලොවට වදාළ ශීලය මෙබඳු වූ සම්‍යග් දර්ශනයකින් යුක්ත වූවකි. මෙලෙස සිල්වත් වූවහුට භාග්‍යවතුන් වහන්සේ පනවා වදාළ විනය ශික්ෂාපද තමා නොයා යුතු ගමන් මග සනිටුවහන් කෙරෙන සීමා හඳුනා ගැනීමට උපකාරයක් සපයයි. ශාස්තෘගෞරවයෙන්, ධර්මගෞරවයෙන් මෙන් ම අතීත සංඝයා කෙරෙහි ඉමහත් කෘතඥතාවෙන් එම ශික්ෂාපද දිවිහිමියෙන් ආරක්ෂා කිරීමට උත්සාහ ගනී. ඒ අනුව ශීලය හේතුඵල සිද්ධාන්තය දක්නා නුවණින් යුත් ප්‍රඥාව සමඟ එකට බද්ධ ව ගමන් කළ යුතුවාක් මෙන් ම සමාධිය ද ප්‍රඥාව සමඟ එක් ව පැවැතීම ආර්ය මාර්ගයේ ලක්ෂණයයි. යමකු වඩන සීලය හා සමාධිය විමුක්තිය සාධනයට ඍජුව උපකාරවත් වන්නේ එවිටයි. මෙලෙස පටිච්චසමුප්පාදය පදනම් කොටගත් අනිත්‍ය, දුක්ඛ, අනාත්මතාව දකිමින් වැඩිය යුතු සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිශික්ෂාවක් බුදුදහමින් පෙන්වා දී තිබේ. මෙබඳු සම්‍යග් දර්ශනයකින් යුතු ප්‍රතිපදාවක පිහිටා විනය ශික්ෂාපද ආරක්ෂා කරන විට සීලය ද නිරායාසයෙන් සම්පූර්ණ වේ. මෙහි දී විනය ශික්ෂාපදවලට අදාළ බුද්ධාවවාද පිළිබඳ මනා අවබෝධයෙන් සිටීමත් පෙළ, අටුවා, ටීකා ඇසුරින් ප්‍රාමාණික දැනුමක් තිබීමත් තමන්ගේ අඩුපාඩු තේරුම් ගැනීමටත් තම සිතට නැගෙන කෙලෙස් හඳුනා ගැනීමටත් මහත් සේ උපකාරී වේ.

භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට වදාළ සම්‍යග් දර්ශනයෙන් යුත් ශීලය සමාධියටත්, සමාධිය ප්‍රඥාවටත්, ප්‍රඥාව විමුක්තියටත්, විමුක්තිය විමුක්ති ඥානදර්ශනයටත් හේතු වේ. තවද ධර්මශ්‍රවණය තුළින් තෙරුවන කෙරෙහි ශ්‍රද්ධාව උපදවා ගනිමින් සිල් රකිමින් ධර්මප්‍රීතියෙන් යුතු උද්‍යෝගයෙන් භාවනා කරන විට සද්ධා,

විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්ම සම්පූර්ණ වෙමින් ක්‍රමයෙන් අවිද්‍යාව ආදි කෙලෙස් දුරු කරමින් නිවන වෙත සමීප වේ. අප වඩන සීලය කෙතෙක් දුරට නිවන් මගට උපනිශ්‍රය වූවාදැයි බලන ප්‍රධාන මිම්මක් වන්නේ එමගින් කෙතෙක් දුරට චිත්ත සන්තානගත රාග, ද්වේෂ, මෝහ දුරු වූවා ද යන කරුණයි. විනය ප්‍රඥප්තීන්වලට සීමා වීසිටිය ද අප තුළ මනා දැක්මක් නොතිබුණහොත් තෘෂ්ණා, දෘෂ්ටි, ඊර්ෂ්‍යා, මද, මාන ආදි අඩු නොවන අතර නම් බුදුරදුන් අපේක්ෂා කළ සීලය අප තුළ වැඩුණා නොවේ. එසේ නොවන්නට කල්‍යාණ මිත්‍ර ඇසුරෙන් හේතුඵල දහමට අදාළ ධර්ම කරුණු නිරතුරුව ශ්‍රවණය කරමින් තම සිත ගැන නුවණින් විමසා බලමින් තම සිතට නැගෙන අකුසල විතර්ක සංසිඳුවමින් සැබෑ කායික වාචසික සංවරයක් තුළින් වැඩෙන සීලය සම්පූර්ණ කර ගැනීමත් උත්සාහවත් වීම වැදගත් වේ. ඒ අතර සමථ විදර්ශනා වශයෙන් ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි නියැළීම ද අවශ්‍ය කෙරේ.

තවද ශීලයෙහි ආනිසංස පිළිබඳව පෙළ දහමෙහි නොයෙක් තැන කරුණු සඳහන් වේ. ආකංඛෙය්‍ය සූත්‍රයෙහි (ම.නි.1) දැක්වෙන පරිදි සිල්වත් ව සිටීම තමාටත්, තම ඥාතීන්ටත්, තමාට සිව්පසයෙන් උවැටන් කරන්නන්ටත්, දෙවියන් ඇතුළු ගුණදහම් අගයන පින්කැමැති වෙනත් සත්ත්වයන්ටත්, තමන්ගේ විමුක්ති මාවතටත් බෙහෙවින් වැඩදායී වන්නකි. එනිසා මහලු වන තුරු ම සිල්වත් ජීවිතයක් ගත කළ යුතු බව සඳහන් වේ (***සීලං යාව ජරා සාධු***). සිල්වත්ව සිටීමෙන් තම සම්‍යක් ප්‍රාර්ථනා සමෘද්ධ වන අතර ඕනෑම පිරිසක් වෙත නිර්භයව (විශාරදව) යාමේ හැකියාව ද එමගින් ඇති වේ. එම ශීලය සමාධියට උපකාරවත් වන අතර මරණින් මතු සුගතිගාමී වීමට ද එය කුසලානිසංසයක් වශයෙන් හේතු වේ. තවද තමා විසින් රක්නා ලද පිරිසිදු ශීලය භාවනාවක් වශයෙන් මෙනෙහි කිරීමෙන් සීලානුස්සති භාවනාව වඩා නිවන් මගේ දොරටුවක් වශයෙන් එය සමථ විදර්ශනා වෙත යොමු කර ගැනීමේ හැකියාව ද පවතී.

පූජනීය මකුලැවේ සුදස්සන ස්වාමීන් වහන්සේ විසින් රචිත මෙම ග්‍රන්ථයෙහි සංඝාදිසේස ගරුආපත්තීන්ගෙන් නැගී සිටිනු සඳහා

කළයුතු පිළියම් පිළිබඳවත්, චතුර්විධ කර්ම පිළිබඳවත්, අටුවා පිළිබඳ කෙටි විස්තරයකුත් ඇතුළත් වේ. ඒඅතර පිරිවෙස් මානත් ගැනීම හා දීම පිළිබඳ සවිස්තරාත්මක වූත් තුලනාත්මකවූත් විග්‍රහයක් පළමු ලිපියෙහි ඇතුළත් වේ. එහිදී පිරිවෙස් මානත් ගැනීම හා දීම, පිරිවෙස් මානත් පිරීම, ආපත්ති ප්‍රභේද, ගරුකාපත්ති පටිච්ඡන්න වන ආකාරය හා අපටිච්ඡන්න වන ආකාරය, ඡන්දය ගැනීම හා දීම, පිරිවෙස් මානත් පිරීමේ දී රාත්‍රිච්ඡේද වන ආකාරය ආදී විස්තර පෙළ, අටුවා, ටීකා, ආචාර්යවාද හා තදනුගත ග්‍රන්ථ ඇසුරින් විමර්ශනාත්මකව කරුණු විග්‍රහ කොට ඇත. මේ පිළිබඳව උනන්දුවක් දක්වන, ඊට අදාළව විනයකර්ම කරගැනීමේ අපේක්ෂාවෙන් සිටින භික්ෂූන් වහන්සේලාට මෙයින් ඉමහත් ප්‍රයෝජනයක් සැලසේ. දෙවන ලිපියෙන් විස්තර වන්නේ චතුර්විධ කර්ම පිළිබඳවයි. මෙහිදී විස්තර වන්නේ සමථයන්ගෙන් විසඳිය යුතු සම්මුඛාවිනය ආදි සප්තවිධ සමථයන්ට අයත් විවාද, අනුවාද, ආපත්ති, කිච්ච යන සතර අධිකරණ යටතේ එන කිච්චාධිකරණයට අයත් සතරාකාර කර්මයන් ය. එනම් අපලෝකන කම්ම, ඤත්ති කම්ම, ඤත්ති දුතිය කම්ම, ඤත්ති චතුත්ථකම්ම යනුවෙන් හැඳින්වෙන කර්ම පිළිබඳවයි. සංඝයාට නියමිත කාර්යයන් දැක්වීමේ දී මෙම සතර බෙහෙවින් වැදගත් වන අතර ඒ පිළිබඳව මනා අවබෝධයකින් සිටීම භික්ෂූන් වහන්සේලාට බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත. සාමාන්‍ය පොතපතකින් තබා විනය පිළිබඳ මෑතක ලියැවුණු ප්‍රධාන කෘතියකින් පවා එළි නොදැක්වුණු අතිශය වැදගත්, අතිශය දුර්ලභ, දෛනික භික්ෂු ජීවිතයට අවශ්‍ය ප්‍රායෝගික කරුණු රැසක් මෙහි ඇතුළත් වන අතර එයින් සෑහෙන ප්‍රමාණයක් ශ්‍රී ලංකා සිංහල විශ්වකෝෂයේ 13 වන කාණ්ඩයේ පළවූයේ ද සුදස්සන හිමියන්ගේ විනය විශාරදත්වයේ හා කැපවීමේ ප්‍රතිඵලයක් වශයෙන් බව මෙහිලා සතුටින් සඳහන් කරමු. එය සිංහල මාධ්‍යයෙන් පොතපත කියවන භික්ෂූන් වහන්සේලා ඇතුළු විද්‍යාර්ථීන්ට පමණක් හිමිවූ සුවිශේෂී අවස්ථාවක් බව කිව යුතු ය. ග්‍රන්ථයෙහි අවසානයට එන '**අටුවාව පිළිබඳ කෙටි හැඳින්වීමක්**' යන ලිපියෙන් බෞද්ධ සම්ප්‍රදාය පිළිබඳ විද්වත් මතවාද පිළිබඳ විමර්ශනාත්මක මෙන් ම විවේචනාත්මක ලිපියක් ඉදිරිපත් වේ. ප්‍රමාණයෙන් කුඩා වුව ද මෙම ග්‍රන්ථයෙන් ඉදිරිපත්

කෙරෙන විනය කරුණු විශේෂයෙන් භික්ෂූන් වහන්සේලාගේ දැනුවත්භාවය සඳහා බෙහෙවින් උපකාරවත් වන අතර එය ශාසන චිරස්ථිතිය සඳහා ද හේතු වනු ඇත.

වසර ගණනාක් පර්යාප්තිධර, ප්‍රතිපත්තිගරුක ස්වාමීන් වහන්සේලා පාසෙවණෙහි මහත් ශ්‍රද්ධාවෙන්, කැපවීමෙන් හා විනයගරුකව ධර්මවිනය හදාරා එය තම ජීවිතයට ද ප්‍රායෝගිකව සම්බන්ධ කර ගනිමින් දුර්ලභ පොතපත ගවේෂණය කරමින් තවදුරටත් අඛණ්ඩව ස්වයං අධ්‍යයනයෙහි නියුතුව ක්‍රියා කරන ගරු මකුලැවේ සුදස්සන ස්වාමීන් වහන්සේ විසින් තමන් ලද දැනුම තව බොහෝ දෙනෙකුට බෙදාදීමේ කරුණාධ්‍යාශයෙන් සම්පාදිත මෙම ග්‍රන්ථය කාලීන අවශ්‍යතාවක් සම්පූර්ණ වශයෙන් සඳහන් කළ හැකි ය. විනයගරුකව ශීලපාරිශුද්ධිය අපේක්ෂාවෙන් පිරිවෙස් මානත් පිරීමේ අවශ්‍යතාව ඇති බොහෝ ස්වාමීන් වහන්සේලාට මෙම පොත මහත් සේ උපකාරී වනු ඇත. දිගුකලක් තිස්සේ මෙම විෂය පථයට අදාළව පැවැති මහත් අඩුවක් මේ ග්‍රන්ථය එළි දැක්වීමත් සමඟ පිරිමැසෙන අතර එය දෙවියන් සහිත සත්පුරුෂ ලෝකයාගේ ඉමහත් චිත්තාරාධනයට නිසැකව හේතුවනු ඇත. එහි ගෞරවය සුදස්සන ස්වාමීන් වහන්සේට පමණක් නොව උන්වහන්සේගේ දයාබර දෙමාපියන්ටත් ආචාර්ය උපාධ්‍යායයන් වහන්සේලාටත් හිමි විය යුතු ය. සම්බුදු සසුනෙහි උන්නතිය වෙනුවෙන් මෙම තරුණ යතිවරයාණන් කෙරෙහි මහත් බලාපොරොත්තු තබාගත හැකි අතර ඉදිරියටත් මෙබඳු ශාසන අභිවෘද්ධිදායී සත්ක්‍රියා සිදු කිරීමට සුදස්සන ස්වාමීන් වහන්සේට නිදුක් නීරෝගී දිගාසිරි සම්පත් සැලසේවා'යි ඉත සිතින් පතමු.

ත්‍රිපිටකාචාර්ය,
උස්ගොඩ ධම්මගරු හිමි
(පණ්ඩිත, BA (Hons), MA, MEd, MSSc, MPhil),
මෙත්තාරාමය, බම්බලපිටිය.
LA Buddhist Vihara,
920, N Summit Ave, Pasadena, CA 91103, USA
2559 / 2015.12.18

# හැඳින්වීම

**"සබ්බදුක්ඛනිස්සරණනිබ්බාණසච්ඡිකරණත්ථාය ඉමං කාසායං ගහෙත්වා පබ්බාජේත මං භන්තේ අනුකම්පං උපාදය"**[1] යනුවෙන් සියලු දුකින් නිදහස් වී නිවන් සුවය සාද ගනු පිණිස මෙම සිවුරු ගෙන මා පැවිදි කරන සේක්වා යැයි, පවසමින් සසුන් වන් කුල පුත්‍රයාගේ සාමණේර පැවිද්ද සිද්ධියට පත් වනු ලබන්නේ කෙස් බෑම, සිවුරු පෙරවීම, තිසරණ දනය යන කරුණු තුනෙනි.[2] පිරිපුන් විසි වයස් ඇති සාමණේර නම සංඛරදෝස විරහිත වූ බද්ධාබද්ධ සීමාවක් තුළ දී පඤ්චවාර්ගික සංඝයා රැස් ව උපසම්පද කරනු ලබයි නම් එයින් අධිසීල සංඛ්‍යාත වූ උපසම්පදව ද ලැබෙනු ඇත.

නිවන්මග හෙවත් විශුද්ධිමාර්ගය වැඩිය යුත්තේ සීලය පිහිටාධාර කර ගෙන යැ. නිර්වාණ සාධනය සීල ප්‍රතිෂ්ඨාවෙන් සිදුවන බැවින් සසර දුකින් නිදහස් වනු කැමැති කුල පුත්‍රයන් කොයි කවුරුත් පාහේ තම විමුක්තිය මෙන් ම ශාසනයේ චිර පැවැත්මට හේතු උපනිශ්‍රය වන විනය පිටක පරියාපන්න වූ ශික්ෂාපද සීලය දැන උගෙන හික්මිය යුතුය.

**'වත් මානත් පිරීමේදී දත යුතු කරුණු, චතුර්විධ කර්ම සහ අටුවාව පිළිබඳ කෙටි හැඳින්වීමක්'** යන නමින් එළිදැක්වුණ මෙම ග්‍රන්ථයෙහි භික්ෂූන් විසින් අත්‍යවශ්‍යයෙන් දැන ගත යුතු විනය කරුණු රාශියක් සඳහන් වේ. වත් මානත් ගනු ලබන සහ පුරනු ලබන විටදිත් චතුර්විධ කර්මවලදිත් විශේෂයෙන් දත යුතු වූ මැ වැදගත් කරුණුවලට මෙහි දී අපි අවධානය යොමු කළෙමු. 'අටුවාව පිළිබඳ කෙටි හැඳින්වීමක්' යන ලිපියෙන් උත්සාහවත් වූයේ අටුවාව බුද්ධ අදහස දත් මහාකාශ්‍යප ආදී මහඋතුමන් තැබූ වාචනාමාර්ගය බැවින් එය බුද්ධදේශනාවක් ම බව පෙන්වීමටත්, මහාප්‍රාඥවූ සබ්බපරියත්තිධර ටීකා ඇදුරන් අටුවාවට දක්වූ ගෞරවයත්, මෙකල මද නුවණ ඇති අප වැන්නවුන් එය ප්‍රතික්ෂේප කිරීමක් හෝ විවේචන එල්ල කිරීමක් හෝ සිදු කරන්නේ නම් එයට ඇති සුදුසුකම කුමක්ද යන්නත් පෙන්වීමට යැ.

1. විමති විනෝදනී ටීකා පිට 363 1935
2. -එම- (කේසච්ඡේදන කාසායච්ඡාදන සරණදනානි පබ්බජ්ජං නාම)

මෙහි එන පිරිවෙස් මානත් ගැනත් චතුර්විධ කර්ම ගැනත් සඳහන් කරුණු අප විසින් කලකට පෙර ලියන ලද ලිපි දෙකකි. අටුවා ගැන ලිපිය මෑතක ලියන ලද්දක් බැවින් භාෂා ශෛලිය තරමක් වෙනස් වැ ඇත.

මෙබඳු ශාස්ත්‍රීය කටයුතු සිදු කිරීමට තරම් අපට ඇවැසි ශක්තිය ලබා දුන්නේ ශාසන දයාවෙන් ධර්ම විනය උගන්වා වදාළ දිද්දෙණිය, රණගිරිලෙණ අරණ්‍යසේනාසනාධිපති අප ගුරුදේවෝත්තම විනය පරියත්තිධර අස්මදාචාර්ය විද්‍යාවේදී අතිපූජනීය නුවරඑළියේ ඤාණසීලාභිධාන යතිශ්‍රේෂ්ඨ නායක මාහිමිපාණන් වහන්සේ යැ. එසේ මැ මුල පටන් ශාස්ත්‍රීය කටයුතුවල අප ව යොදවමින් අවැසි උපදෙස් නන් අයුරින් ලබා දෙමින් මහාපිහිටක් වූයේ මෙම ග්‍රන්ථයට හරවත් පෙරවදනක් සැපයූ රාජකීය පණ්ඩිත, දර්ශනපති අතිපූජනීය උස්ගොඩ ධම්මගරු කල්‍යාණමිත්‍ර ස්වාමීන් වහන්සේ යැ.

එසේ මැ අපට ආචාර්යත්වයෙන් පිහිට වූ ගුරු උතුමන් වහන්සේලා වන අතිපූජනීය මහාචාර්ය අත්තංගනේ රතනපාලාභිධාන මහාස්වාමීන් වහන්සේටත් අතිපූජනීය ත්‍රිපිටකාචාර්ය මීටියාගොඩ විජයනාග මහාස්වාමීන් වහන්සේටත් අතිපූජනීය සුපේශල ශික්ෂාකාමී විනය විශාරද ගලේවෙල ඤාණදස්සන ස්ථවිර ස්වාමීන් වහන්සේටත් ඉත සිතින් ගෞරව පුද කරම්හ.

මෙම ගත සම්පාදනය කිරීමෙන් අත් වූ කුසලය යථෝක්ත මහාස්වාමීන් වහන්සේලාටත් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමාධිපති අග්ගමහාකම්මට්ඨානාචාර්ය පරම පූජනීය නාඋයනේ අරියධම්මාභිධාන මහාස්වාමීන් වහන්සේටත් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ මහාලේඛකාධිකාරී ත්‍රිපිටක විශාරද කහගොල්ලේ සෝමවංසාභිධාන මහාස්වාමීන් වහන්සේටත් ශාස්ත්‍රීය ධර්ම සේවාවන්හි දී කල්‍යාණමිත්‍රත්වයෙන් අපට සහය දෙන අතිපූජනීය දර්ශනපති ඌරුපැලැව්වේ හේමාරාම ස්ථවිර ස්වාමීන් වහන්සේටත් කල්‍යාණමිත්‍ර සබ්‍රහ්මචාරී උතුමන්ටත් නිරෝගී සැප නිවන් සැප ලැබේවායි මෛත්‍රියෙන් පුණ්‍යානුමෝදනා කරම්හ.

තව ද මෙම කුසලය මිය පරලොව ගිය අප පියතුමන්ට අත් වී ස්වර්ගමෝක්ෂ සම්පත් ලබාවා! එසේ මැ සුජීවත් ව සිටින මෑණියන්ටත්, මෙම ග්‍රන්ථය සැකසීමේ දී වෙහෙස මහන්සි නොබලා නන් අයුරින් උපකාරකල පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත මහතාටත්, දිනූෂා පබසරා මෙනෙවියටත්, සංජීවනී මහාත්මනියටත් ධර්ම දනයට සහ සම්බන්ධ වූ පින්වතුන්ටත් සිවුපසයෙන් උපකාර කරනු ලබන දයකකාරකාදීන්ටත් නීරෝගි සැප දීර්ඝායු සම්පත් ලබමින් පාරමී පුරා භව නිස්තරණය කෙරෙත්වායි ආශිංසනය  කරම්හ.

මෙවගට,

සාසනස්ථිතිකාමී,

මකුලෑවේ සුදස්සන භික්ෂු තැන වම්හ.

දහම් මැදුර සෙනසුන,

නෙළුම් පෙදෙස,

කලපළුවාව, රාජගිරිය.

2559 / 2015.12.20

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස !!!
(භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !!!)

# පිරිවෙස් මානත් පිරීමේදී දතයුතු කරුණු

බුදුසසුනේ පැවැත්ම වූ කලී විනය මත රඳා පවතින්නකි. භික්ෂුව විනයගරුක වන තරමට ශාසනික අර්බුද නොහට ගන්නා අතර සසුනෙහි චිරස්ථිතියට එය බෙහෙවින් උපකාරී වේ. ප්‍රථම මහාසඞ්ගීතියේදී මහාකාශ්‍යප මහරහතන් වහන්සේ **"ඇවැත්නි, පළමුව කුමක් සඞ්ගායනා කරන්නෙමු ද? ධර්මය හෝ විනය හෝ දැ"** යි විමසූ විට **"ස්වාමීනි, මහාකාශ්‍යපයන් වහන්ස, විනය නම් බුදුසසුනෙහි ආයුෂයි. විනයෙහි සිටි කල ශාසනය සිටියේ වෙයි"** යනුවෙන් අනෙක් මහරහතන් වහන්සේලා පිළිතුරු දුන්හ.[1] බාහිර දියුණුවකින් ශාසනික දියුණුව කිසිකලෙක මැනිය නොහැකිය. ගොඩනැඟිලි, විහාරාරාම කොතෙක් දියුණු වුවත්, භික්ෂුව පැවැත්මෙන් හා විනය-පර්යාප්තියෙන් පිරිහෙන්නේ නම්, ශාසනික පරිහානියට මෙය සෘජුවම බලපානු ඇත. එබැවින් සැබෑ සසුන් දියුණුව අපේක්ෂා කරන නවක, මධ්‍යම, ස්ථවිර යන සෑම භික්ෂුවක් ම පාහේ විනයගරුක විය යුතු සේම විනය-පර්යාප්තිය පිළිබඳව ද මනා අවබෝධයක් ඇති කරගෙන කටයුතු කළ

1. **'විනයෝ නාම බුද්ධසාසනස්ස ආයු, විනයේ ඨිතේ සාසනං ඨිතං හෝති',
සම.පා 1, 07 පිට හේ.මු.**

යුතුය. චතුර්විධ විනයකර්මයන්ට ඇතුළත් වන සීමා සම්මුති, සීමා සමූහන, කඨිනත්ථාර, උපසම්පදා, වත් මානත්දීම්, අබ්භාහන කර්ම ආදිය පිළිබඳව වඩාත් නිවැරදි අවබෝධයක් ඇති කර ගත යුතුය. මෙම ග්‍රන්ථයෙන් දක්වනු ලබන්නේ පිරිවෙස් මානත් පිරීමේදී දතයුතු වැදගත් සහ අප්‍රකට කරුණු ය.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ධර්ම විනය විවෘත වූ තරමට බබළන බවත් වැසුණු තරමට නොබබළන බවත් දේශනා කර ඇති බව කොයි කවුරුත් දන්නා වූ ප්‍රකට කරුණකි.[1] අප්‍රකට වූත් වැදගත් වූත් විනය කරුණු ඉස්මතු වීම සසුන් දියුණුවට හේතු වන බව නුවණැති සත්පුරුෂ භික්ෂූහු දනිත්. වර්තමානයේ දී වත් මානත් දෙනු ලබන සහ පුරනු ලබන බොහෝ භික්ෂූන් තුළ පවතිනු ලබන්නේ ඒවා ගැන මද අවබෝධයකි. නිසි ආකාර අවබෝධයකින් තොරව වත් මානත් දීම් සහ පිරීම් සිදු කරනු ලැබීමේදී එයින් අපේක්ෂිත අදහස ඉටු නොවනු ඇත. මෙම පිරිවෙස් මානත් ග්‍රන්ථයෙන් උත්සාහවත් වනුයේ ඒවා ගැන තරමක හෝ අවබෝධයක් ලබා දීමට ය. මෙහි දක්වනු ලබන සෑම කරුණක් ම පාහේ පෙළ, අටුවා, ටීකා ආදීන්හි දක්වා ඇති කරුණු ම ය. ඇතැම් විට සමහරෙක් මෙහි කියා ඇති කරුණු පිළිගැනීමට ද මැළිවිය හැක. එසේ වුවත් මෙම ග්‍රන්ථය අවසානය තෙක් ඉවසීමෙන් හා විමසීමෙන් යුතුව කියවීමට උත්සාහවත් විය යුතුය. අදාළ ග්‍රන්ථයන්හි පිටු අංක ඒ ඒ තැන දක්වා ඇති බැවින් විමති ඇත්තන්ට ඒවායෙන් බලා වුව ද දත හැකිය.

බුදුසසුනෙහි සිදු කරනු ලබන විනයකර්ම සිවුවැදෑරුම් වේ.

එනම්;

1. අපලෝකන කම්ම
2. ඤත්ති කම්ම
3. ඤත්ති දුතිය කම්ම
4. ඤත්ති චතුත්ථ කම්ම[2]

වශයෙනි.

1. 'තථාගතප්පවේදිතෝ භික්ඛවේ, ධම්මවිනයෝ විවටෝ විරෝචති නෝ පටිච්ඡන්නෝ',
   අං.නි. තික නිපාතය
2. 'පරිවාරපාලි **ii**, කම්මවග්ග, බු.ජ.ත්‍රි. **300** පිට

පිරිවෙස් දීම්, මානත් දීම්, මූලාය පටිකස්සන යන මේවා ඉහත කී සිවුවැදෑරුම් කර්ම අතරින් 'ඤත්ති චතුර්ථ කර්මය' ගණයට ඇතුළත් වේ. ඕසාරණ, නිස්සාරණ, සම්මුති, දාන, නිග්ගහ, සමනුභාසන, කම්ම ලක්ඛණ වශයෙන් 'ඤත්ති චතුත්‍ථ-කම්ම' සත් තැනෙක යනු ලැබේ.[1] මෙම හත අතරින් දාන, නිග්ගහ, කම්මලක්ඛණ යන තුනට ඉහත කී පිරිවෙස් ආදි කර්ම හතර ඇතුළත් වනු ඇත. දානයෙහි පිරිවෙස් දීම්, මානත් දීම් දෙකත් නිග්‍රහයෙහි දී මූලාය පටිකස්සනයත් කර්මලක්‍ෂණයෙහි අබ්භාහනයත් ඇතුළත් වනු ඇත.[2]

## ඇවැත්

පිරිවෙස් මානත් පුරනු ලබන්නේ ගරු-ඇවැත්වලින් නැඟී සිටීම සඳහාය. එබැවින් පළමු කොට ඇවැත් ගැන දැනීමක් ඇති කර ගැනීම වැදගත් ය.

ඇවැත් වනාහි:

**ලහුකාපත්ති-ගරුකාපත්ති**
**සාවසේසාපත්ති-අනවසේසාපත්ති**
**දුට්ඨුල්ලාපත්ති-අදුට්ඨුල්ලාපත්ති**[3]

වශයෙන් සයවැදෑරුම් වේ.

සත් වැදෑරුම් ආපත්තිස්කන්ධ අතරින් පාරාජික, සඞ්ඝාදිසේස යන ආපත්තිස්කන්ධ දෙක නොමැතිව සෙසු ආපත්තිස්කන්ධ පහ ලහුකාපත්ති නම් වේ.

එම පහ නම්:

1. ථුල්ලච්චය
2. පාචිත්තිය
3. පාටිදෙසනිය
4. දුක්කට
5. දුබ්භාසිත

වශයෙනි.

1. 'පරිවාරපාලි **ii**, කම්මවග්ග, බු.ජ.ත්‍රි. **306** පිට
2. සමන්තපාසාදිකා **4**, **1053** පිට හේ.මු.
3. චුල්ලවග්ගපාලි **1**, සමථක්ඛන්ධක, බු.ජ.ත්‍රි. **376** පිට

පාරාජික, සඞ්ඝාදිසේස යන ආපත්තිස්කන්ධ දෙක ගරු ආපත්ති නම් වේ. එම ආපත්තිස්කන්ධ හත අතරින් හයක්ම සාවසේස ආපත්ති නමි. එකක්ම වූ පාරාජිකාපත්තිස්කන්ධය 'අනවසේසාපත්ති' නමි. ඡෙජ්ජගාමිනී යනු ද පාරාජිකා-ආපත්ති වලට නමකි. මුල් ඇවැත් කඳු දෙක දුට්ඨුල්ලාපත්ති නමි. සෙසු පහ අදුට්ඨුල්ල නම් වේ.[1] තව ද දේශනාගාමිනී ආපත්ති, වුට්ඨානගාමිනී ආපත්ති යනුවෙන් ඇවැත් දෙවැදෑරුම් වේ.[2] ඉහත කී ථුල්ලච්චය ආදි 'දේසනාගාමිනී' ආපත්තීන් සඞ්ඝයා වෙත හෝ ගණයා වෙත හෝ පුද්ගලයා වෙත දෙසා පිරිසිදු විය හැකිය. සඞ්ඝයා වෙත 'දේශනාගාමිනී' ඇවැත් දෙසනු ලබන කල්හි අදාළ ආපත්ති දේශක භික්ෂුව සඞ්ඝයා වෙත එළඹ උත්තරාසඞ්ගය (තනිපට-සිවුර) එකස් කොට පොරවා වැඩිමහල් භික්ෂූන්ගේ පා වැඳ ඇඳිලි බැඳ ඇවැත් දෙසිය යුතුය. ව්‍යක්ත, ප්‍රතිබල භික්ෂුවක් ඇවැත් පිළිගත යුතු අතර එම භික්ෂුව සඟ මැද දී ඥත්ති- කර්මයකින් තමාව සම්මත කරවා ගත යුතුය. ඥත්ති-කර්මය චතුර්විධ කර්මයන්ට ඇතුළත් බැවින් මේ සඳහා සීමා පාරිශුද්ධිය ද අවශ්‍ය වේ. ගණයාට (තෙනමකට) ඇවැත් දෙසනු ලබන කල්හි මෙපරිද්දෙන් ම ඇවැත් පිළිගනු ලබන භික්ෂුව '**සුණාතු මේ ආයස්මන්තා ....**' ආදි වශයෙන් ගණ-ඥත්තිය තබා තමාව සම්මත කරවා ගත යුතුය. දෙදෙනකුට ඇවැත් දෙසීමෙහි දී ඥත්තිය නොතබා ඇවැත් පිළිගැනීම කළ යුතුය.[3]

'වුට්ඨානගාමිනී-ආපත්ති' යනු සඞ්ඝාදිසේසාපත්තීහු ය. මෙම සඟවෙසෙස් ඇවැත් (දහතුන) නිකාය හෙවත් ආපත්තිස්කන්ධය සඟවෙසෙස් ඇවැත් නමි.[4] '**සඞ්ඝාදිසේසෝති සඞ්ඝෝ තස්ස ආපත්තියා පරිවාසං දේති, මූලායපටිකස්සති මානත්තං දේති අබ්භේති න සම්බහුලා, න ඒකපුග්ගලෝ තේන වුච්චති සඞ්ඝාදිසේසෝ**'[5] යනුවෙන් සඞ්ඝයා ඇවැතට පිරිවෙස් දෙයි. මූලාය පටිකස්සනය කරයි, මානත දෙයි, අබ්භානය කරයි. මෙය වූ කලි උපසපන් භික්ෂූන් දෙතුන් දෙනෙකුට පමණක් සිදු කළ නොහැක්කක් වන අතර එක් උපසපන් භික්ෂුවකට ද සිදු කළ නොහැක්කකි. විනය-අටුවාවෙහි '**සඞ්ඝෝ ආදිම්හි චේච සේසේ**

1. සම.පා **4, 943** පිට හේ.මු.
2. සම.පා **3, 739** පිට හේ.මු.
3. සම.පා **2, 461-462** පිට හේ.මු.
4. සම.පා **2, 370** පිට හේ.මු.
5. පාරාජිකාපාලි, බු.ජ.ත්‍රි., **260** පිට

**ච ඉච්ඡි තබ්බෝ අස්සාති සඞ්ඝාදිසේසෝ**'[1] යනුවෙන් 'සඞ්ඝයා ආදියෙහි මෙන් සෙසු තැන්හි ද කැමැති විය යුත්තේනු'යි සඞ්ඝාදිසේස' යැයි සඳහන් කොට ඇත. මෙම පිරිවෙස්, මූලායපටිකස්සන, මානත්, අබ්භාහන යන සියල්ලට ම සඞ්ඝයාගේ කැමැත්ත තිබිය යුතු අතර සඞ්ඝයා නොමැතිව එකදු කර්මයක් වත් සිදු කිරීමට නොහැකි බැවින් සියලුම තැන්හි සඞ්ඝයා කැමැති විය යුතු හෙයින් සඞ්ඝාදිසේස යැයි කියනු ලැබේ.[2]

පරිවාර පාළියෙහි ද

**'සඞ්ඝාදිසේසෝති යං වුත්තං තං සුණාහි යථා තථං,**
**සඞ්ඝෝව දේති පරිවාසං මූලායපටිකස්සති,**
**මානත්තං දෙති අබ්භෙති තේනේතං ඉති වුච්චති.'**[3]

යනුවෙන් කියන ලද්දේ වේ.

මුලුසික වර්ණනාවෙහි ද '**වුට්ඨානගරුකත්වයෙන් සඟවෙසෙස් ඇවැතට ගරුකයැයි නම් කළෝ, සඞ්ඝෝ ආදිමහි -පෙ- සඞ්ඝාදිසේසෝ' යි නිරුත්ති හෙයින් සඟවෙසෙස් අවන් භික්ෂුව විසින් පිහිටිය යුතු ආදිය යැයි කියන ලද පිරිවෙසෙහි ද සේසය යැයි කියන ලද මානත් අබ්භාන-කර්මයන්හි ද සඞ්ඝයා විසින් කැමැති විය යුත්තේ මේ ඇවැතට නුයි සඞ්ඝාදිසේස නම් වේ** යැයි සඳහන් වේ.[4] තෙළෙස් සඟවෙසෙස්-ඇවැත් අතුරින් යම් ඇවැතකට පැමිණි භික්ෂුව පිරිවෙස් මානත් ආදී විනයකර්ම සිදු කොට එම ගරු ඇවැතින් නැගී සිටීම කළ යුතුය.[5]

තමාට සඟවෙසෙස්-ඇවැත් නැත්තේ වුව ද ඇත්තාවූ අනෙක් භික්ෂූන්ට උපකාර කිරීම සඳහා පිරිවෙස්, මානත් ගැන මනා අවබෝධයක් භික්ෂුව විසින් ඇති කරගත යුතුය. '**පරි**' පූර්ව $\sqrt{}$**වස ධාතුවෙන් පරව** '**ණ**' ප්‍රත්‍ය වී සැකසුණාවූ 'පරිවාස' යන්නෙන් යම් කිසි විශේෂ අපේක්ෂාවක් ඇතිව වාසය කිරීම අදහස් කරයි. එම අපේක්ෂාව නම් සඟවෙසෙස්-ඇවැතින් පිරිසිදු බවයි. එයට '**ඉක**' ප්‍රත්‍යය වී (පරි + වස + ණ + ඉක > පාරිවාසික) පිරිවෙස් වසන්නේ යමෙක් ද හෙතෙම '**පාරිවාසික**' යැ යි කියනු ලැබේ. අටුවාවෙහි '**පාරිවාසිකාති පරිවාසං**

1. සම.පා **2, 370** පිට හේ.මු.
2. සම.පා **2, 371** පිට හේ.මු. / සම.පා **4, 1004** පිට හේ.මු.
3. පරිවාරපාළි **2**, බු.ජ.ත්‍රි., පිට
4. මුලුසික වණ්ණනා **29** පිට
5. පාලි මුත්තක විනය විනිච්ඡය, **305** පිට

පරිවසනතා' යනුවෙන් කියන ලද්දේ එබැවිනි.[1]

**පිරිවෙස වනාහි:**

1.අපටිච්ඡන්න-පිරිවෙස

2.පටිච්ඡන්න-පිරිවෙස

3.සුද්ධන්ත-පිරිවෙස

4.සමෝධාන-පිරිවෙස[2]

යනුවෙන් සිවුවැදෑරුම් වේ.

එම සිවුවැදෑරුම් පිරිවෙස් අතරින් '**යෝ භික්ඛවේ, අඤ්ඤෝපි අඤ්ඤතිත්ථිය පුබ්බෝ ඉමස්මිං ධම්මවිනයේ ආකඞ්ඛති පබ්බජ්ජං ආකඞ්ඛති උපසම්පදං තස්ස චත්තාරෝ මාසේ පරිවාසෝ දාතබ්බෝ**'[3] යනුවෙන් 'මහණෙනි, පෙර අන්‍ය තීර්ථක වූ අන් යමෙක් ද මේ ශාසනයෙහි ප්‍රව්‍රජ්‍යාව හා උපසම්පදාව කැමැති වේ නම්, ඔහුට සිව්මසක පිරිවෙසක් දිය යුතු' යැයි මහාඛන්ධකයෙහි වදළා වූ තීර්ථක-පිරිවෙස වනාහි 'අපටිච්ඡන්න' පිරිවෙස නම් වේ.[4] මෙය නග්න පරිබ්‍රාජක වූ ආජීවකයන්ට හෝ අචේලකයන්ට දිය යුත්තකි. අන්‍යයන්ට නොදිය යුතුය. ඉදින් එබඳු පුද්ගලයෙකු වුව ද සළුවක් හෝ තීර්ථක-ඇඳුමක් හෝ ඇඳගෙන එන්නේ නම් ඔහුට ද නොදිය යුතු බව විනය අටුවාවෙහි පවසා ඇත.[5] විමතිවිනෝදනී ටීකාවෙහි නග්නව පැමිණෙන ක්‍රියාවාදී නිගණ්ඨයන්ට වුව ද දිය යුතු බව සඳහන්ව ඇත.[6] ඉහත කී අපටිච්ඡන්න-පිරිවෙස මෙම පිරිවෙස් කථාවෙහි දී අදහස් නොකෙරෙන අතර සෙසු පිරිවෙස් තුන අතරින් යම් පිරිවෙසක් යම් භික්ෂුවක විසින් සඞ්ඝවෙසෙසකට පැමිණ වසන ලද්දේ නම්, එයින් සුදුසු ක්‍රමයක්, ඇවැත් පරීක්ෂා කොට බලා දිය යුතුය.[7]

**මානත වනාහි:**

1.අපටිච්ඡන්න-මානත

2.පටිච්ඡන්න-මානත

---

1. සම.පා **4, 859** පිට හේ.මු.
2. -එම-
3. මහාවග්ගපාළි **1**, බු.ජ.ත්‍රි. **174** පිට
4. සම.පා **4, 860** පිට හේ.මු.
5. සම.පා **3, 740** පිට හේ.මු.
6. විමතිවිනෝදනී-ටීකා, මහාඛන්ධක
7. සම.පා **4, 860** පිට හේ.මු.

3.පක්ඛමානත
4.සමෝධාන-මානත[1]
යනුවෙන් සිවුවැදෑරුම් වේ.

'භික්ෂූන්ට බුහුමන් (ගරු) කිරීම මානත'[2] යනුවෙන් පාරාජිකා-ගැටපදයෙහි විග්‍රහ වේ. සමන්තපාසාදිකාවෙහි ද '**භිකඛු මානත්තායාති භික්ඛූනං මානනභාවාය, ආරාධනත්‍ථායාති වුත්තං හොති**'[3] යැයි 'භික්ඛුමානත්‍තාය යනු භික්ෂූන්ට බුහුමන් කිරීම පිණිස ය, සතුටු කිරීම පිණිස යැයි කියන ලද්දේ වෙයි' යනුවෙන් පවසා ඇත. මාතිකට්ඨකථාවෙහි ද එය එලෙස ම සඳහන් වේ.[4] යම් නොපිළිසන් වූ එක් සඟවෙසෙස් ඇවැතකට හෝ බොහෝ ඇවැත්වලට පිරිවෙස් නොදී සය රැයක මානත පමණක් දේ නම්, එය '**අපටිච්ඡන්න**' හෙවත් නොපිළිසන් මානත නම් වේ. '**පටිච්ඡන්න**' ඇවැත්වලට පිරූ පිරිවෙස් ඇත්තහුට දෙන්නාවූ මානත පටිච්ඡන්න මානත යි. යම් පිළිසන් වූ හෝ නොපිළිසන් වූ හෝ ඇවැත්වලට භික්ෂුණීන්ට අඩමසක් සඳහා දෙන්නා වූ මානත '**පක්ඛමානත**' නම් වේ.[5] සමෝධාන පිරිවෙස පිරූවහුට දෙන්නාවූ මානත '**සමෝධානමානත**' නම් වේ.[6]

## දසවිධ පටිච්ඡන්නභාවය

පිරිවෙස්, මානත් ගැන දත ගැනීමට මත්තෙන් ඇවැත් පිළිසන් වන්නාවූත් නොපිළිසන් වන්නාවූත් ආකාරය ගැන දැනීමක් ඇති කර ගත යුතු බැවින් මෙතැන් සිට එය දක්වනු ලැබේ. සඟවෙසෙස් ඇවැතක් පිළිසන් වීම ආකාර දහයකින් සිදු වේ.

එනම්:

- **ආපත්ති ච හෝති ආපත්තිසඤ්ඤී ච**
  (ඇවැතක් ද වෙයි. ඇවැතක් යන සඤ්ඤාව ද හෙවත් හැඟීම ඇත්තේ වෙයි.)
- **පකතත්ත ච හෝති පකතත්තසඤ්ඤී ච**
  (ප්‍රකෘතිය වූයේත් ද වෙයි. ප්‍රකෘති යන සඤ්ඤාව ඇත්තේ ද වෙයි.)

1. සම.පා **4, 867** පිට හේ.මු.
2. පාරාජිකා ගැටපදය, අම්තිරිගල පඤ්ඤාවංස, **55** පිට, **1941** අත්තනගල්ල
3. සම.පා **2, 454** පිට හේ.මු.
4. මාතිකට්ඨකථා, **50** පිට හේ.මු.
5. සම.පා **4, 864** පිට හේ.මු.
6. සම.පා **4, 809** පිට හේ.මු.

- **අනන්තරායිකෝ ච හෝති අනන්තරායික සඤ්ඤී ච**
  (අනතුරු නැත්තේ ද වෙයි. අනතුරු නැත්තේ ය යන සඤ්ඤාව ඇත්තේ ද වෙයි.)
- **පහු ච හෝති පහු සඤ්ඤී ච**
  (හැකියාව ද ඇත්තේ වෙයි. හැකියාව ඇත්තේ ය යන සඤ්ඤාව ද ඇත්තේ වෙයි.)
- **ඡාදෙතුකාමෝ ච හෝති ඡාදේති ච**
  (වසනු කැමැත්තේ ද වෙයි. වැසීම ද කරයි.)

යන අයුරිනි.

එහි '**ආපත්ති සඤ්ඤී**' යනු යම් භික්ෂුවක් සඟවෙසෙස් ඇවැතකට පැමිණ එය 'සඟවෙසෙසක් ම වේය' යන සඤ්ඤාව ඇති බවයි. එම භික්ෂුව එය සඟවෙසෙස් ඇවැතක් යන සංඥාවෙන්, දැන දැන වසාලයි නම්, හෙවත් අනෙක් උපසපන් භික්ෂුවකට ආරෝචනය නොකරයි නම්, පිළිසන් වේ. ලහු-ඇවැතක් ගරු-ඇවැතක් කියා හෝ ගරු-ඇවැතක් ලහු-ඇවැතක් කියා හෝ වසාලයි නම් 'අලජ්ජී' පක්ෂයේ සිටියි. ඇවැත පිළිසන් නොවේ. ගරු-ඇවැත, ගරු-ඇවැත ය යි දැන දැන වසාලයි නම්, ඇවැත පිළිසන් වේ. හුදෙක් ගරු-ලහු බව නොදැන ඇවැත වසාලම්'යි සිතා සඟවයි නම්, එයිනුත් පිළිසන් වේ.[1] '**පකතත්ත**' යනු ත්‍රිවිධ වූ උක්ෂේපනීය-කර්ම නොකරන ලද්දවුන් සහ උක්ඛිත්තානුවත්තක නොවූවන් ය. (උක්ෂේපනීය-කර්ම කළවුන්ට අනුවර්තනය නොවුණවුන්) ඇවැත් නොදැකීමෙහි, ඇවැතට පිළියම් නොකිරීමෙහි, පවිටු දෘෂ්ටි අත් නොහැරීමෙහි කියා උක්ෂේපනීය-කර්ම සිදු කරන්නා වූ ආකාර තුනෙකි. මෙම උක්ෂේපනීය-කර්ම සිදුකළවුන් සහ ඔවුන්ට අනුවර්තනය වූවන් අප්‍රකෘති-භික්ෂූහුය. මොවුන්ගෙන් අන්‍ය වූවෝ ප්‍රකෘති-භික්ෂූහු වෙති. සඟවෙසෙසකට අවන් භික්ෂුවක් තමා ප්‍රකෘති-භික්ෂුවක් යන සංඥාව ඇත්තේ වී ඇවැත වසාලයි නම්, පිළිසන් වේ. ප්‍රකෘති නොවූ (උක්ඛිත්තක, උක්ඛිත්තානුවත්තක) භික්ෂුවක් තමා ප්‍රකෘති යන සංඥාව ඇතිව හෝ නැතිව ඇවැත වසනා ලද්දේ වුව ද නොවසන ලද්දේ වෙයි.[2]

1. සම.පා **4, 869** පිට හේ.මු.
2. සම.පා **4, 870** පිට හේ.මු.

උක්ඛිත්තක හා උක්ඛිත්තානුවත්තක භික්ෂූන් නානාසංවාසක බැවින් ප්‍රකෘති භික්ෂූන් විසින් ඔවුන්ට වත් මානත් ආරෝචනය නොකිරීමෙන්, ගරු-ඇවැත් ආරෝචනය නොකිරීමෙන්, දෝෂයක් නොවන බව අටුවාවෙහි සඳහන් වේ.[1] නානා සංවාසකයන් එම පිරිස් තුළ ඔවුනොවුන්ට සභාග වන බැවින් ආපත්ති දේශන, වත් මානත් ආරෝචන ආදිය සිදුකර ගත යුතු බව දත යුතුය. එබැවින් සඟවෙසෙසකට පැමිණි ප්‍රකෘති නොවූ හෙවත් උක්ඛිත්තක, උක්ඛිත්තානුවත්තක භික්ෂූන් විසින් ඔවුනොවුන්ට ආපත්ති ආරෝචනය නොකර ගැනීමෙන් සඟවෙසෙස් ඇවැත් පිළිසන් වන බව දත යුතුය. **'අනන්තරායිකෝ'** යනු භික්ෂුවකට දසවැදෑරුම් අන්තරාය අතුරින් එකකුදු නැත්තේ ද හෙතෙමේ ය. ඔහු අනන්තරායික සංඥාව ඇතිව ඇවැත වසාලයි නම්, පිළිසන් වූයේ වෙයි. **'පහූ'** යනු සඟවෙසෙසකට අවන් යමෙකුට භික්ෂුවකගේ සමීපයට යෑමට මෙන් ම ආරෝචනය කිරීමට ද හැකියාව ඇති බවයි. ඉදින් හෙතෙමේ 'භික්ෂුවක් වෙත එළඹීමට හැකිය' යන සංඥාව ඇත්තේ වී වසාලයි නම් ඇවැත පිළිසන් වෙයි.

**'ඡාදේතුකාමෝ ච හෝති ඡාදේති ච'** යනු ඉදින් සඟවෙසෙස් ඇවැතකට පැමිණි භික්ෂුවක් ඇවැත වසන්නෙමි'යි ධුරනික්ෂේපය කොට පෙරබත් කාලයෙහි හෝ පසු බත්කාලයෙහි හෝ පඨමයාමාදි කාලයන්හි හෝ ලජ්ජී ධර්මයට බැස අරුණට කලින් ආරෝචනය කරයි නම්, ඇවැත නොපිළිසන් වෙයි. ඉදින් වසනු කැමති බව ඇතිව ම අරුණ නංවයි නම්, ඇවැත පිළිසන් වූයේ වෙයි. වෙනත් උපසපන් භික්ෂුවක් නොමැති තැනක වසන කල්හි සඟවෙසෙස් ඇවැතකට පැමිණ, සභාග භික්ෂුවකගේ පැමිණීම අපේක්ෂාවෙන් හෝ සභාග භික්ෂුවක් වෙත යන කල්හි හෝ අඩමසක් හෝ මසක් හෝ ඉක්ම යෑමෙන් වුව ද ඇවැත පිළිසන් නොවේ.[2]

1. සම.පා **4, 864** පිට හේ.මු.
2. පාලි මුත්තක විනය විනිච්ඡය, **306** පිට

කුඩුසිකයෙහි තිස්හත් වන ගාථාවෙහි ද

**"ආපත්තිනුක්ඛිත්තමනන්තරාය**
**පහුත්තතායෝ තථසඤ්ඤිතා ච,**
**ඡාදෙතුකාමො අථඡාදනාති**
**ඡන්නා දසඞ්ගේහිඅරුණුග්ගමම්හීති."**

යනුවෙන් සඳහන් වේ.[1]

යම් භික්ෂුවක් සඟවෙසෙසකට පැමිණ, සභාග භික්ෂුවක් දැක 'මේ මගේ උපාධ්‍යායන් වහන්සේ ය' හෝ 'ආචාර්යයන් වහන්සේ ය' හෝ කියා ලජ්ජාවෙන් ආරෝචනය නොකරයි නම්, ඇවැත පිළිසන් වෙයි. ඇවැත් ආරෝචනයෙහි දී අවෛරී හෙවත් තරහකාරයෙක් නොවීමත් සභාග භික්ෂුවක් වීම මත් ප්‍රමාණවත් වේ. එබැවින් අටුවාවෙහි '**අවෙරීසභාගමත්තමේව පමාණං**'[2] යනුවෙන් දක්වා තිබේ. '**අවේරීති හිතකාමො**'[3] යැයි සාරත්ථදීපනියෙහි සඳහන් වේ. යම්කිසි විසභාග පුද්ගලයෙක් ඇවැත අසා නින්දා, පරිභව කිරීම් වශයෙන් තැන තැන ප්‍රකාශ කරන්නෙක් වේ ද එබඳු වූ උපාධ්‍යායයන් වහන්සේට ද ආරෝචනය නොකළ යුතු බව අටුවාවෙහි පවසා ඇත. එබැවින් එබඳු විසභාග වූවන්ට වුවත් ආරෝචනය නොකිරීමෙන් ඇවැත් පිළිසන් නොවේ.

1. කුඩුසික හා පුරාණ විස්තර සන්නය පිට **04**
2. සම.පා **4, 871** පිට හේ.මු.
3. සාරත්ථදීපනී-ටීකා, සමුච්චයක්ඛන්ධක, ඡට්ඨසඞ්ගායනා

# පටිච්ඡන්න-පිරිවෙස හා පටිච්ඡන්න-මානත

ඉහත කී ඇවැත් පිළිසන් වන්නා වූ කරුණු දහය සලකා පටිච්ඡන්නභාවය දැන ඉන්පසු පිළිසන් වූ දින ගණන ද ඇවැත් ගණන ද සලකා පිරිවෙස දිය යුතුය. ඉදින් එක දිනක් පිළිසන් වූ එක ඇවැතක් වේ නම්, '**අහං භන්තෙ ඒකං ආපත්තිං ආපජ්ජිං සංචේතනිකං සුක්කවිසට්ඨිං ඒකාහපටිච්ඡන්නං**' යනුවෙන් මෙසේ ඉල්වා සමුච්ඡයක්ඛන්ධකයෙහි උදායී තෙරුන් වහන්සේට දුන් ඒකාහ පටිච්ඡන්න-පිරිවෙසෙහි කී කර්ම වාක්‍යයෙන් දිය යුතුය. මෙසේ දින 14 දක්වා දවස් වශයෙන් යොදා දිය යුතුය. දින 15ක් පිළිසන් වූ ඇවැතෙහි '**පක්ඛපටිච්ඡන්න**' යැයි යෙදීම කළ යුතුය. එතැන් සිට 29 වන දිනය යම්තාක් ද ඒතාක් පිළිසන් වූ ඇවැතෙහි '**අතිරේක පක්ඛපටිච්ඡන්න**' යනුවෙන් ද මසක් පිළිසන් වූවෙහි '**මාස පටිච්ඡන්න**' යැයි ද මසට වඩා වැඩි වූවෙහි '**අතිරේක මාස පටිච්ඡන්න**' යැයි ද දෙකක් වූවෙහි '**ද්වෙ මාස**' ... ආදි වශයෙන් ද යෙදීම කළ යුතුය.[1]

ඉදින් පිළිසන් වූ ආපත්ති දෙකක් වේ නම්, '**ද්වෙ ආපත්තියො**' කියා ද තුනක් වූයේ නම්, '**තිස්සො ආපත්තියෝ**' කියා ද යෙදීම කළ යුතුය. ඊට වඩා වැඩියෙන් ඇත්තා වූ ඇවැත්වලට '**සම්බහුලා**' යැයි යොදා කිව යුතුය. නානාවස්තුක-ආපත්ති ඇතිනම්, '**අහං භන්තේ, සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජි එකං සුක්කවිසට්ඨිං, එකං කායසංසග්ගං, එකං දුට්ඨුල්ලවාචං, එකං අත්තකාමං, එකං සංචරිත්තං, එකාහ පටිච්ඡන්නා**' යැයි, මෙසේ ගණ (සමූහ) වශයෙන් හෝ '**අහං භන්තේ, සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං නානාවත්ථුකායෝ ඒකාහ පටිච්ඡන්නායො**' යැයි යනුවෙන් මෙසේ වස්තුකීර්තන වශයෙන් හෝ '**අහං භන්තේ, සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපජ්ජිං ඒකාහපටිච්ඡන්නායෝ**' යැයි මෙසේ නාමමාත්‍ර වශයෙන් හෝ යෙදීම කළ යුතුය.[2]

ඉහත කියන ලද පාඨ අතරින් '**වත්ථුකිත්තන වසේන වා**' යනු නම සමග වස්තුව කීර්තනය කිරීමයි. එබැවින් '**නාම මත්තවා**' යන්නෙන් ස්වල්පමාත්‍ර ගැනීමක් අදහස් කරන ලද්දේ යැයි දත යුතුය.[3]

1. පාලි මුත්තක විනය විනිච්ඡය, 307 පිට
2. සම.පා 4, 872 පිට හේ.මු.
3. කංඛාවිතරණී-ටීකා, සංස්. යූ.පී. ඒකනායක, 122 පිට

කංඛාවිතරණී පිටපොතෙහි '**වත්ථුවසේන වා - ශුක්‍රමෝචනාදි ව්‍යතික්‍රමණය වෙවයි; නාමමත්තවසේන වා යනු - නාමමාත්‍ර වශයෙන් හෝ; නාමමත්තවසේනාති පාඨො නාමගොත්තවසේනාති ලිඛන්ති යනු ගැටපද යි**'[1] යනුවෙන් සඳහන් කොට ඇත. ඉහතින් කියන ලද්දේ භික්ෂුවක විසින් නානාවස්තුක-සඟවෙසෙස් ඇවැත්වලට පැමිණ එයින් නැඟී සිටීමට පිරිවෙස් මානත් ආදි යාචන වාක්‍යයන් සහ දාන වාක්‍යයන් සකස් කර ගන්නා ආකාරය යි. එය 'ගණ' වශයෙන් හෙවත් සමූහ වශයෙන් යොදා හෝ සඞ්ඝාදිසේස යන නමත් සුක්කවිසට්ඨි ආදි ඇවැතත් යොදා හෝ නොඑසේ නම්, හුදෙක් සඞ්ඝාදිසේස යන නාමමාත්‍රය පමණක් යොදා හෝ යාචන දානාදිය සිදු කිරීමෙන් කර්මය සිද්ධියට පත් වන බව යි. නාමය වනාහි දෙවැදෑරුම් වේ.

එනම්:

**1.සජාති සාධාරණං**
**2.සබ්බ සාධාරණං**

යනුවෙනි.

එහි 'සඞ්ඝාදිසේස' යන්න ස්වකීය ජාතියට සාධාරණ වූවයි, 'ආපත්ති' යන්න සර්වසාධාරණ වූවයි, එබැවින් '**සම්බහුලා ආපත්තියෝ ආපජ්ජිං ඒකාහ පටිච්ඡන්නායෝ**' යැයි මෙසේ සර්වසාධාරණ වශයෙන් කීම ද වටී.[2] ඉහතින් කියන ලද්දේ හුදෙක් නාමය හෙවත් සඞ්ඝාදිසේස යන්න නොගෙන සම්බහුලා ආපත්තියෝ යනාදි ක්‍රමයෙන් යොදා යාචන දානාදි කම්වැකි සකස් කොට පිරිවෙස් මානත් දීමෙන් ද ආපත්ති වුට්ඨානය සිදුවන බවයි. මෙසේ 'වත්ථු' වශයෙන් හෝ 'ගොත්ත' වශයෙන් හෝ 'නාම' වශයෙන් හෝ 'ආපත්ති' වශයෙන් හෝ යොදා අදාළ භික්ෂුවගේ නම ඇතුළත් කොට කර්ම වාක්‍යය සකස් කර ගත යුතුය. ඉන්පසුව පිරිසිදු වූ සඞ්කරදෝෂ විරහිත වූ බද්ධාබද්ධ-සීමාවකට ගොස් පිරිවෙස ගත යුතුය. පිරිවෙස්, මානත්, මූලායපටිකස්සන ආදි කර්ම චතුවාර්ගික බැවින්, චතුවාර්ගික කර්මයකට පොහොනා පිරිසිදු සිල් ඇති අප්‍රකෘති හෙවත් කම්මලබ්ධි වශයෙන් නානාසංවාසක නොවූ භික්ෂූන් සතර නමක් කර්මප්‍රාප්ත විය යුත්තාහ.[3] අවම වශයෙන්

1. කංඛාවිතරණී පිටපොත සංඝාදිසේස වර්ණනා
2. පාළි මුත්තක විනයවිනිච්ඡය, 307 පිට
3. සම.පා 4, 1044 පිට හේ.මු.

කර්මාරහ-පුද්ගලයා නොමැතිව භික්ෂූන් සිව්නමක් සිටිය යුතුය. කර්මාරහ-පුද්ගලයා (පිරිවෙස්, මානත් ගනු ලබන තැනැත්තා) කර්මප්‍රාප්ත නොවන අතර ඔහු ඡන්දයට සුදුස්සෙක් ද නොවේ. එතෙකුදු වුවත් එම කර්මාරහ-පුද්ගලයා වස්තුව කොට සඞ්ඝයා විසින් කර්මය සිදු කරනු ලැබේ.[1]

පාරිවාසිකයකු, මානත්තාරහ වූවකු, මානත්තචාරිකයකු, මූලායපටිකස්සනාරහ වූවකු, අබ්භානාරහ වූවකු සිවුවැනි කොට හෝ විසිවැනි කොට හෝ හෙවත් ගණ පූරණය කොට පිරිවෙස්, මානත් ආදි කර්ම නොකළ යුතු අතර කිරීමෙන් අසිද්ධියට ද පත් වේ. **'පාරිවාසික චතුත්ථෝ චේ භික්ඛවෙ, පරිවාසං දදෙය්‍ය, මූලායපටිකස්සෙය්‍ය, මානත්තං දදෙය්‍ය, තබ්භීසෝ අබ්භෙය්‍ය, අකම්මං න ච කරණීයං'**[2] යනුවෙන් පාරිවාසිකක්ඛන්ධකයෙහි කියන ලද්දේ එබැවිනි. මූලාය පටිකස්සනාරහාදීන් ගැන ද මෙලෙස ම සඳහන් වේ. මෙබඳු පරිවාසාදි සඞ්ඝකර්මයන්හි දී විනා සෙසු සඞ්ඝකර්මයන්හි දී මොවුහු ගණ පූරණය වෙත්.[3]

## ඡන්දය දීම

බද්ධ සීමාවක පරිවාස දානාදිය සිදු කරන්නේ නම්, අත්පසින් බැහැර සිටින අන් භික්ෂූන්ගේ ඡන්දය ගත යුතුය. ග්‍රාම සීමාව ගෙන සිදු කරන්නේ නම් ගම තුළ අත්පසින් බැහැර සිටින අන් භික්ෂූන්ගේ ඡන්දය ගෙන ඒම හෝ ගමෙන් බැහැර කිරීම හෝ සිදු කළ යුතුය. නොඑසේ නම් ගම තුළ ඡන්දය නොදුන් එක් භික්ෂුවක් හෝ සිටීමෙන් විනය කර්මය වර්ග වී අසිද්ධියට පත් වේ. උදකුක්ඛේප සීමාවක සිදු කරන්නේ නම් උදකුක්ඛේප සීමා පරිච්ඡේදය ඇතුළත අත්පස හැර සිටි භික්ෂූන්ගේ ඡන්දය ගත යුතුය. එසේ ම පරිච්ඡේදයෙන් බැහැර එබඳු ම තවත් පරිච්ඡේදයක් නොඉක්මවා සිටි භික්ෂූන්ගේත් ඡන්දය ගෙන හෝ අත්පසට පමුණුවා හෝ උපචාරයෙන් බැහැර කොට හෝ කර්මය සිදු කළ යුතුය. නොඑසේ නම් කර්මය අසිද්ධියට පත් වනු ඇති බව මාතිකට්ඨකථාවෙහි දක්වා තිබේ.[4] ඡන්දය දීම් ගැනීම්වල දී බෙහෙවින්

1. සම.පා 4, **1045** පිට හේ.මු.
2. චුල්ලවග්ගපාලි **1**, සමුච්චයක්ඛන්ධක, බු.ජ.ත්‍රි. පිට **166**
3. සම.පා 4, **864** පිට හේ.මු.
4. මාතිකට්ඨකථා, 07 පිට හේ.මු.

පරිස්සම් විය යුතුය. විනය කර්මයක් සඳහා දුන්නාවූ ඡන්දය රූහණය නොවීමෙන් වර්ග වී විපත් කර්මයක් බවට පත් වේ. ඡන්දය සඞ්ඝයා වෙතට පැමිණේ.[1] විනයකර්මයට සූදානම් වී සිටින සඞ්ඝයාගේ අත්පස සිට ඡන්දය දීමෙන් එය සිද්ධියට පත් නොවනු ඇත. විනය පාළියෙහි වනාහි '**ඒකං භික්ඛුං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්සඞ් කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයෝ ඡන්දං දම්මි ඡන්දං මෙ හර ඡන්දං මෙ ආරොචෙහි ....**'[2] යනුවෙන් ද '**ඡන්දහාරකෝ චෙ භික්ඛවේ, දින්නෙ ඡන්දෙ සඞ්ඝප්පත්තෝ .... ආහටෝ හොති ඡන්දො**'[3] යනුවෙන් ද ඡන්දය දෙන්නා වූත් පැමිණෙන්නා වූත් ආකාර භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට ඇත. විමතිවිනෝදනී-ටීකාවෙහි බැහැරින් ම සඞ්ඝයා වෙත ඡන්දය පැමිණිය යුතු බව[4] කියා ඇති බැවින් සඞ්ඝයාගේ අත්පස හිඳ ඡන්දය නොදිය යුතු බව විශේෂයෙන් දත යුතුය.

කයෙන් හැඟවීමෙන් (කායෙන විඤ්ඤාපේති) ඡන්දය දීම සිදු කළ හැකි බව කියා ඇති වුවත්, මෙම විඥාපනය සිතින් සිතා එනම්, විනය කර්ම සඳහා ඡන්දය දෙමි යන අදහසින් යුතුව 'කාය විකාර' කරණයෙන් ම සිදු කළ යුතු බව විමති විනෝදනී ටීකාවෙහි කියා ඇත.[5] එලෙස සිතීමක් නොමැතිව ඡන්දය දීම් ආදිය පිළිබඳව කිසිදු අවබෝධයක් නොමැතිව ඡන්දය යනු කුමක්දැයි කියා වත් නොදන හිස සැලීම් ආදියෙන් ඡන්දය දීම සිදුවන බවක් ද නොපෙනේ. එබැවින් විනය කර්මවලදී එක ම සීමාවක් තුළ සිටින භික්ෂූන්ගේ ඡන්දය ගැනීම සිදු කරන විට ලහු කොට නොසිතා වඩාත් සැලකිල්ලෙන්ම සිදු කළ යුතු බව දත යුතුය. වත් මානත් දීම් ආදිය බොහෝ සෙයින් කුඩා සීමාවල (ඛණ්ඩ සීමා) සිදු කරනු ලබන බැවින් ඡන්දය ගෙන ඒම අඩු ය. සීමා සමූහන, සීමා සම්මුතිවලදී බොහෝ සෙයින් ඡන්දය ගෙන ඒම් සිදු කළ යුතු බැවින් මෙම කරුණු ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතුය. **සීමාසමූහනයකට හෝ සීමාසම්මුතියකට වෙනත් භික්ෂූන්ගෙන් ඡන්දය ගනු ලබන කල්හි එම ඡන්දය නිසි ලෙස නොගැනීමෙන් සිද්ධියට පත්නොවී සීමා සමූහන, සීමාසම්මුති ආදි කර්ම ද අසිද්ධියට පත් වනු**

1. වජිරබුද්ධිටීකා, උපොසථක්ඛන්ධක, **388** පිට
2. මහාවග්ගපාළි **1**, බු.ජ.ත්‍රි., **290** පිට
3. මහාවග්ගපාළි **1**, බු.ජ.ත්‍රි., **292** පිට
4. විමතිවිනෝදනී-ටීකා
5. විමතිවිනෝදනී-ටීකා, උපොසථක්ඛන්ධක, ඡට්ඨසඞ්ගායනා

**ඇත. එබඳු සීමාවල සිදු කරනු ලබන අනෙක් සියලු ම විනය කර්ම ද අසිද්ධියට පත් වෙයි. එබැවින් විනය කර්ම සඳහා ඡන්ද ගෙන ඒම් ආදිය අතිශය සැලකිල්ලෙන්, නිවැරදි ව, සඞ්කාවක් නොසිටන අයුරින් ම සිදු කළ යුතු බව අවධාරණයේ තබා ගත යුතුය.**

## අත්පස

මෙසේ අත්පසින් බැහැරව සිටි භික්ෂූන්ගේ ඡන්දය ගෙන සීමාව පිරිසිදු කොට ඤත්ති චතුත්‍ථ කර්ම වාක්‍යයෙන් අදාළ භික්ෂුවට පිරිවෙස දිය යුතුය. පළමුව ඔහු යාචන-වාක්‍යය තෙවරක් කියා පිරිවෙස ඉල්ලිය යුතුය. මෙම යාචනය අනිවාර්යයෙන් ම සඞ්ඝයාගේ අත්පස සිට කිව යුතුය. '**සඞ්ඝං උපසඞ්කමිත්වා**'[1] යනුවෙන් සමුච්චයක්ඛන්ධකයෙහි සඳහන්ව ඇත්තේ එබැවිනි. සඞ්ඝයා පිරිවෙස දෙන විට අදාළ භික්ෂුව අත්පසින් (රියන් දෙකහමාරකින්) කෙසඟක්වත් ඉවත් නොවිය යුතුය. ඉවත් වුවහොත් කර්මය අසිද්ධියට පත් වේ. '**අයං ඉත්‍ථන්නාමෝ භික්ඛු**'[2] යනුවෙන් පෙළෙහි දේශනා කොට ඇති බැවින් '**අයං**' යන්නෙන් අත්පසෙහි සිටීම අදහස් කරයි.[3]

එබැවින් ඉහත කී කරුණු අනුව පිරිවෙස්, මානත්, මූලායපටිකස්සන, අබ්භාන යන සියල්ල ඉල්ලන විට දී සඞ්ඝයාගේ අත්පසෙහි සිට ම ඉල්විය යුතු බවත් ගනු ලබන විට දී සඞ්ඝයාගේ අත්පසෙහි සිට ම ගත යුතු බවත් දත යුතු සේ ම, ඉල්ලීම්-ගැනීම් දෙකෙන් කුමක් හෝ අත්පසින් බැහැරව සිදු කිරීමෙන් කර්මය මුළුමනින්ම අසිද්ධියට පත් වන බව ඉතා හොඳින් සිහි තබා ගත යුතුය.

මෙලෙස එක් දිනක් පිළිසන් වූ ඇවැතක් නම් ඒකාහපටිච්ඡන්න-පිරිවෙසක් ගෙන එම සීමාවෙහි දී ම '**වත්තං සමාදියාමි, පරිවාසං සමාදියාමි**'[4] යනුවෙන් පාරිවාසිකක්ඛන්ධකයෙහි කී ක්‍රමයෙන් එක් පදයකින් හෝ පද දෙකකින් හෝ වත සමාදන් වීම කළ යුතුය. මෙලෙස වත සමාදන් වී එහි දී ම සඞ්ඝයාට ආරෝචනය කළ යුතුය. ආරෝචනය කොට එදවස නොපුරන්නේ නම් හෝ පහසු විහාරයකට යනු කැමැත්තේ නම් හෝ පෙළෙහි කී අයුරින් '**වත්තං නික්ඛිපාමි, පරිවාසං නික්ඛිපාමි**' යනුවෙන් පවසා වත නික්ෂේප කළ යුතුය.[5]

1. චුල්ලවග්ගපාලි **1**, සමුච්චයක්ඛන්ධක, බු.ජ.ත්‍රි. පිට **196**
2. චුල්ලවග්ගපාලි **1**, සමුච්චයක්ඛන්ධක, බු.ජ.ත්‍රි. පිට **252**
3. විමතිවිනොදනී-ටීකා පිට **391** සංස්, බේරතුඩුවේ ධම්මාධාරතිස්ස
4. චුල්ලවග්ගපාලි **1**, සමුච්චයක්ඛන්ධක, බු.ජ.ත්‍රි. පිට **168**
5. පාලි මුත්තක විනය විනිච්ඡය, **309** පිට

## නික්ඛිත්ත අනික්ඛිත්ත භේදය

ක්‍රම දෙකකටවත් පුරන්නා වූ පුද්ගලයින් දෙදෙනෙකු ගැන විනය-අටුවාවෙහි සඳහන් වේ.

එනම්:

1.නික්ඛිත්ත පුද්ගලයා
2.අනික්ඛිත්ත පුද්ගලයා[1]

වශයෙනි.

**'නික්ඛිත්ත'** හෙවත් පිරිවෙස නික්ෂේප කරමින් වත පිරීම විහාරයෙන් ලෙඩ්ඩුප්පාත දෙකක් ඉක්මවා ද **'අනික්ඛිත්ත'** හෙවත් පිරිවෙස නික්ෂේප නොකොට වත පිරීම විහාරයෙහි දීම ද කළ යුතු බව අටුවාගත ක්‍රමයෙන් පෙනේ. විහාරයෙන් බැහැර ගමෙහි සිට වත පිරීමේ දී ඔහුගේ ආරෝචන ක්ෂේත්‍රය වන්නේ දොළොස් රියන් උපචාරයයි. එම දොළොස් රියන් උපචාරය තුළට පැමිණි සියල්ලන්ට ම වත ආරෝචනය කළ යුතුය. දැන දැන වත ආරෝචනය නොකිරීමෙන් රාත්‍රිච්ඡේදයත් වත්තභේද-දුකුලාවත් සිදු වේ. නොදනී නම් රාත්‍රිච්ඡේදය පමණක් සිදු වේ.[2] විහාරයෙන් බැහැර සිට වත නික්ෂේප කොට (නික්ඛිත්තවත්ත) පිරිවෙස් පුරන්නා වත නික්ෂේප නොකොට විහාරයට ගිය විට ඔහුගේ ආරෝචන ක්ෂේත්‍රය දොළොස් රියන් උපචාරය ම වේ. විහාරයෙහි සිටින, ඔහුගේ දොළොස් රියන් උපචාරයෙන් බැහැරව සිටි නොදුටු, ශබ්ද නොඇසුණු, අන්‍ය භික්ෂූන්ට ආරෝචනයක් අවශ්‍ය නොවේ. දොළොස් රියනින් බැහැර සිටින්නෙක් දුටුවොත් හෝ ශබ්දයක් ඇසුණොත් හෝ ඒ උපසපන් භික්ෂුවක් නම් ආරෝචනය කළ යුතුය. දොළොස් රියන ඇතුළත නොපෙනෙන තැනෙක සිටින භික්ෂුවට වුවත් ආරෝචනය කළ යුතු බව සාරත්ථදීපනි ටීකාවෙහි කියා ඇති බැවින් ආරෝචනය නොකිරීමෙන් රාත්‍රිච්ඡේදය සිදුවන බව දත යුතුය.[3] අනික්ඛිත්ත ක්‍රමයට වත පුරන්නහු විසින් විහාර උපචාරයට පැමිණි සියලුම උපසපන් භික්ෂූන්ට ආරෝචනය කළ යුතු බව විමතිවිනෝදනී ටීකාවෙහි සඳහන් වේ. ආරෝචනය කරනු ලබන පාලි වාක්‍යයේ අර්ථය ගෙන යම්කිසි භාෂාවකින් ආරෝචනය කිරීම ද වරදක් නොමැති බව අටුවාවෙහි[4] දක්වා ඇත.

---

1. සම.පා 4, 873 පිට හේ.මු.
2. සම.පා 4, 873 පිට හේ.මු.
3. සාරත්ථදීපනි-ටීකා සමුච්චයක්ඛන්ධක, ඡට්ඨසංගායනා
4. සම.පා 4, 872 පිට හේ.මු.

**වෙහෙර තුළ නික්ඛිත්ත ක්‍රමයට හෙවත් වත නික්ෂේප කරමින් පිරිවෙස් ආදිය පිරිමක් ගැන පෙළේ සහ අටුවාවෙහි කියා නොමැතත් පූර්වයෙහි සිටියා වූ ලජ්ජී, පේෂල, ශික්ෂාකාමී, බහුශ්‍රැත වූ විනයෙහි සියුම් විනිශ්චයන් පවා දන්නා වූ ආචාර්යයෝ රාත්‍රිච්ඡේද, වත්තභේද දෝෂයන් දුරු කිරීම් වශයෙන් වෙහෙර තුළ නික්ඛිත්ත ක්‍රමයට වත් මානත් පිරිම සිදු කරත්. එබැවින් එම ආචාර්ය නය ප්‍රකරණයන්ට අනුලොම් බැවින් ප්‍රකරණානුලෝම නයක් වශයෙන් ප්‍රශස්තතර යැයි විනයාලඞ්කාර-ටීකාවෙහි කියා ඇත.[1] එහෙයින් වෙහෙර තුළ වුවත් නික්ඛිත්ත ක්‍රමයට පිරිවෙස්, මානත් පිරිමෙන් දින ගණන සපිරෙන බව දත යුතුය.**

මෙසේ යම් පමණ දිනගණනක් පිළිසන් වූ ඇවැතට එපමණ හෝ කුකුස් විනෝදනය (දුරු) කිරීම පිණිස ඊට වඩා වැඩියෙන් හෝ පිරිවෙස පුරා සඞ්ඝයා වෙත එළඹ වත සමාදන් වී මානත ඉල්ලිය යුතුය.[2] පිරිවෙස සමාදන් වී මානත ඉල්ලීමට මත්තෙන් පිරිවෙස ආරෝචනය ද කළ යුතුය. ඉන්පසුව මානත ඉල්ලිය යුතුය.[3] ඉදින් පටිච්ඡන්න ආපත්ති නොවේ නම් එබඳු පුද්ගලයකුට අපටිච්ඡන්න මානත දිය යුතුය. එය දෙන්නහු විසින් එක් දිනක් පිළිසන් වූ ඇවැතකට සමුච්චයක්ඛන්ධකයෙහි කී ක්‍රමයෙන් මානත දිය යුතුය. පටිච්ඡන්න පිරිවෙස පිරුවහුට අපටිච්ඡන්න සඞ්ඝාදිසේසාපත්ති වේ නම් පටිච්ඡන්න මානතට සමෝධාන කොට දිය යුතුය.[4] පිළිසන්-ආපත්ති දෙකකුත් නොපිළිසන්-ආපත්ති එකකුත් වේ නම් **'පටිච්ඡන්නානං ච අපටිච්ඡන්නාය ච'** යැයි යනුවෙන් මානතට ඇතුළත් කොට කිව යුතුය. පිළිසන්-ආපත්ති එකක් වී නොපිළිසන් දෙකක් වූයේ නම් **'පටිච්ඡන්නාය ච අපටිච්ඡන්නානං ච'** යනුවෙන් කිව යුතුය. ඉදින් පිළිසන්-ඇවැත් ගණනත් දෙකක් නම් නොපිළිසන් ගණනත් දෙකක් නම් **'පටිච්ඡන්නානං ච අපටිච්ඡන්නානං ච'** යනුවෙන් කිව යුතුය. සියල්ලටම අනුරූප වන සේ කර්මවාක්‍ය සකස් කොට මානත දිය යුතුය. පිරූ මානත් ඇත්තහුට සුදුසු ලෙස ම කර්මවාක්‍ය සකසා අබ්භාහනය කළ යුතුය.[5]

1. විනයාලංකාර-ටීකා, ගරුකාපත්ති වුට්ඨාන විනිච්ඡය කථා, ඡට්ඨසංගායනා
2. සම.පා 4, 873 පිට හේ.මු.
3. විනයාලංකාර-ටීකා, ගරුකාපත්ති වුට්ඨාන විනිච්ඡය කථා, ඡට්ඨසංගායනා
4. සම.පා 4, 874 පිට හේ.මු.
5. -එම-

අබ්භානය සිදු කරන විට ප්‍රකෘති වූවකුට අබ්භානය කිරීම නුසුදුසුය. එබැවින් වත (මානත) සමාදන් විය යුතුය. වත සමාදන් වීමෙන් අබ්භානයට සුදුසු වන අතර ඉන්පසු මානත ආරෝචනය කොට අබ්භානය ඉල්විය යුතුය.[1] මෙලෙස ඒකාපත්ති ක්‍රමයට ඉහතින් කීවා වූ පටිච්ඡන්න පිරිවෙසත් පටිච්ඡන්න මානතත් කියන ලද්දේ යැයි දත යුතුය.

1. සම.පා **4, 869** පිට හේ.මු.

# සුද්ධන්ත පිරිවෙස

පිරිසිදු-කාලය කෙළවර කොට අසුද්ධ-කාලප්‍රමාණයෙන් පිරිසිඳ කරන ලද පිරිවෙස සුද්ධන්ත පිරිවෙස නම් වේ.[1] පිරිසිදු බව ශුද්ධිය යි (**සුජ්ඣනං සුද්ධො**). පිරිසිදු බව කුමකින් ද? යත් ආපත්තිවලින් වෙන්වීම හෙවත් නැගී සිටීමයි. අමෘතය කෙළවර කොට යන්නේනු'යි අන්ත නම් (**අමති ඔසානභාවං ගච්ඡතීති අන්තො**). පිරිසිදු වූ කෙළවරක් යම් පිරිවෙසකට ඇත්තේනු'යි 'සුද්ධන්ත' නම් (**සුද්ධො අන්තො යස්ස පරිවාසස්සාති සුද්ධන්තො**). සුද්ධන්ත වූයේත් එය ම ය. පිරිවෙස වූයේත් එයම යනුයි සුද්ධන්ත-පිරිවෙස නම් (**සුද්ධන්තො ච සො පරිවාසො චාති සුද්ධන්ත පරිවාසො**).[2] මෙම සුද්ධන්ත-පිරිවෙස සමුච්චයක්ඛන්ධයෙහි අධාර්මික මානත් කෙළවර '**තෙන ඛො පන සමයේන අඤ්ඤතරො භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපන්නො හොති ආපත්ති පරියන්තං න ජානාති රත්ති පරියන්තං න ජානාති**'[3] යනුවෙන් අනුදන්නා ලද්දේය. එම සුද්ධන්ත-පිරිවෙස,

1.චූලසුද්ධන්තය
2.මහාසුද්ධන්තය

යනුවෙන් දෙවැදෑරුම් ය.

දෙවැදෑරුම් වූ මෙම සුද්ධන්තය රාත්‍රී-පරිච්ඡේදය මුළුමනින් ම හෝ ඇතැම් කොටසක් හෝ නොදන්නහුට ද සිහි නොකරන්නහු ද එහි විමති ඇත්තහුට ද දිය යුතුය. ඇවැත් ප්‍රමාණය දැන ගැනීම හෝ නොදැන ගැනීම මෙම සුද්ධන්තයට කරුණක් නොවේ.[4]

## චූලසුද්ධන්තය

යමෙක් උසම්පදා වූ දිනයේ පටන් අසුවල් අසුවල් දවසක් හෝ පක්ෂයක් හෝ මාසයක් හෝ අවුරුද්දක් හෝ තමාගේ සුද්ධිය දන්නේ නම්, ඔහුට දුන්නා වූ සුද්ධන්ත පිරිවෙසට '**චූල සුද්ධන්ත**' යයි කියනු ලැබේ. එම චූලසුද්ධන්තය ගෙන පිරිවෙස් පුරන්නහු විසින් යම් පමණ කාලයක් තමාගේ පිරිසිදු බව දනී ද එපමණ කාලයක් ඉවත් කොට සෙසු

1. විනයාලඞ්කාර-ටීකා, ගරුකාපත්තිවුට්ඨානවිනිච්ඡයකථා, ඡට්ඨසඞ්ගායනා
2. -එම-
3. චුල්ලවග්ගපාළි **1**, සමුච්චයක්ඛන්ධක, බු.ජ.ත්‍රි. **282** පිට
4. පාළි මුත්තකවිනයවිනිච්ඡය, **318** පිට

මාසයක් හෝ දෙකක් පිරිවෙස පිරිය යුතුය. ඉදින් මසක් පමණ අසුද්ධ යැයි සිතා පිරිවෙස ගෙන පුරනු ලබන කල්හි තවත් මාසයක් සිහි කරයි නම් එම මාසය ද පිරිවෙස පිරිය යුතුය. නැවත පිරිවෙස්දාන කෘත්‍යයක් නැත. දෙමසක් අසුද්ධ යයි සිතා පිරිවෙස ගෙන එක මසක් ම **'මම අසුද්ධ වෙමි'** යැයි සන්නිෂ්ඨානයක් කරයි නම් මසක් ම පිරිවෙස පිරිය යුතුය. නැවත පිරිවෙස් දීමේ කෘත්‍යයක් නැත. මෙම චූලසුද්ධන්තය උඩට නැඟීම ද යටට බැසීම ද සිදු කරයි.[1]

## මහාසුද්ධන්තය

උපසම්පදා වූ දිනයේ පටන් අනුලෝම වශයෙන් හෝ ආරෝචිත දිනයේ පටන් ප්‍රතිලෝම වශයෙන් හෝ විචාරනු ලබන කල්හි දු රාත්‍රී-පර්යන්තය නොදනී ද සිහි නොකරයි ද විමති ඇත්තේ හෝ වෙයි ද ඔහුට දුන්නා වූ සුද්ධන්ත පිරිවෙස **'මහාසුද්ධන්තය'** යැයි කියනු ලැබේ. එය ගෙන, පිරිවෙස ගත් දිනයේ පටන් උපසම්පදා වූ දිනය තෙක් යම්තාක් දින ගණනක් වේ ද එම දින ගණන ගණන් කොට ඒතාක් පිරිවෙස පිරිය යුතුය. මෙම මහාසුද්ධන්තයෙහි උඩට නැඟීමක් සිදු නොවන අතර යටට බැසීමක් ඇත.[2] පිරිවෙස් පුරන අතරතුර නිසැකව ම රාත්‍රී සන්නිෂ්ඨානයක් කරයි නම්, මසක් හෝ දෙකක් හෝ කියා කාල නිර්ණය කිරීමෙන් එම මාසය හෝ දෙක හෝ පිරිවෙස පිරිය යුතුය. සුද්ධන්ත-පිරිවෙස යාචන, දානාදි ක්‍රම චුල්ලවග්ගපාලියෙහි සමුච්චයක්ඛන්ධකය බලා දත යුතුය.[3]

1. සම.පා 4, **874-875** පිට හේ.මු.
2. සම.පා 4, **875** පිට හේ.මු.
3. චුල්ලවග්ගපාලි **1**, සමුච්චයක්ඛන්ධක, බු.ජ.ත්‍රි. **282** පිට

# සමෝධාන පිරිවෙස

එකතු කරනු ලබන්නේ නුයි 'සමෝධාන' නමි. (**නානාකාලිකා නානාවත්ථුකා ආපත්තියෝ අග්ගාදිවසේන සමෝධානං එකීකරණං සමෝධානෙත්වා කතෝ පරිවාසෝ සමෝධාන පරිවාසෝති විග්ගහෝ**).[1]

එම සමෝධාන පිරිවෙස

1.ඕධානසමෝධාන
2.අග්ගසමෝධාන
3.මිස්සකසමෝධාන[2]

යනුවෙන් තෙවැදෑරුම් වේ.

## 1. ඕධානසමෝධාන

ඕධානසමෝධාන යනු අන්තරාපත්තියකට පැමිණි පිළිසන්කරන්නහුට පිරිවෙස් විසූ දින ගණන ඉවත් කොට, මකා මුල් ඇවැතෙහි දවස් පරිච්ඡේදයෙන් පසුව පැමිණි ඇවැත සමෝධාන කොට (එකතු කොට) දිය යුතු පිරිවෙසයි. එය සමුච්චයක්ඛන්ධකයෙහි '**තෙන හි භික්ඛවේ, සඞ්ඝෝ උදායිං භික්ඛුං අන්තරා එකිස්සා ආපත්තියා සංචේතනිකාය සුක්කවිසට්ඨියා පඤ්චාහ පටිච්ඡන්නාය මූලායපටිකස්සිත්වා පුරිමාය ආපත්තියා සමෝධාන පරිවාසං දේතු**'[3] යනුවෙන් දේශනා කොට ඇත. '**ඔධානං ච සමෝධානං ච ඔධාන සමෝධානං - තං යත්ථ සෝ ඔධානසමෝධාන පරිවාසෝ**' යනු කඞ්ඛාවිතරණී පිටපතයි.[4] '**ඔධුනිත්වා අවධූය පහාය සමෝධානෝ ඔධානසමොධානො**'' යනු විනයත්ථමඤ්ජුසා-ටීකාවයි.[5] '**අන්තරාපත්තිය**' යන්නෙන් අදහස් කරන ලද්දේ පිරිවෙස නික්ෂේප නොකර වත පුරන අතරතුර පැමිණි ඇවතයි. මෙම අන්තරාපත්තික තත්ත්වයට පිරිවෙස් පුරන, මානත්තාරහ, මානත පුරන, අබ්භානාරහ යන අවස්ථාවන්හි දී පත්විය හැකිය. කඞ්ඛාවිතරණී පිටපතෙහි ද මෙය '**අන්තරාපත්තිං - පිරිවෙස් වසන කලැ හෝ යන මිහි යම් අතුරෙකැ අනිත් සඟවෙසෙස් ඇවැතක්**' යනුවෙන් දක්වා ඇත.[6] යමෙක් පිළිසන්-

1. විනයාලංකාර-ටීකා, ගරුකාපත්ති වුට්ඨාන විනිච්ඡය කථා, ඡට්ඨසංගායනා
2. සම.පා 4, 875 පිට හේ.මු.
3. චුල්ලවග්ගපාලි 1, සමුච්චයක්ඛන්ධක, බු.ජ.ත්‍රි. 232 පිට
4. කංඛාවිතරණී පිටපොත, සංස්. කළුකොඳයාවේ පඤ්ඤාසේකර, 41 පිට
5. කංඛාවිතරණී-ටීකා, සංස්. යූ.පී. ඒකනායක, 125 පිට
6. කංඛාවිතරණී-පිටපොත, සංස්. කළුකොඳයාවේ පඤ්ඤාසේකර, 41 පිට

ඇවැතකට පිරිවෙසක් ගෙන පුරන අතරතුර හෝ මානත්තාරහ අවස්ථාවෙහි දී හෝ මානතෙහි හැසිරෙන අතර හෝ අබ්භානාරහ අවස්ථාවෙහි දී හෝ වෙනත් ගරු-ඇවැතකට පැමිණ මුල් ඇවැතට සමව හෝ අඩුවෙන් හෝ පිළිසන් (වසන්) කරයි නම්, ඔහුට මූලාය පටිකස්සනයෙන් ඒ පිරූ පිරිවෙස් දින ගණන ද මානත් දින ගණන ද සියල්ල ඉවත් කොට එනම්, නොදවස් කොට පසුව පැමිණි ඇවැත මුල් ඇවැතෙහි සමෝධාන කොට දිය යුතුය.[1]

අන්තරාපත්තිය අපටිච්ඡන්න වූ අවස්ථාවෙහි දී මූලාය පටිකස්සනය කොට ඉන්පසු කුමක් කළ යුතු ද යන්න ගැන පෙළ අටුවාවන්හි ඍජුව සඳහනක් නොමැත. පාළිමුත්තක විනයවිනිච්ඡය සඞ්ග්‍රහයෙහි '**සචේ පන පටිච්ඡන්නාය ආපත්තියා පරිවසන්තෝ අන්තරා ආපත්තිං ආපජ්ජිත්වා න පටිච්ඡාදේති තස්සා මූලායපටිකස්සනායේව කාතබ්බා පුන පරිවාසදානකිච්චං නත්ථි**'[2] යනුවෙන් ඉදින් පටිච්ඡන්න-ඇවැතට පිරිවෙස් පුරනුයේ අන්තරාපත්තියට පැමිණ නොවසයි ද ඒ ඇවැතට මූලායපටිකස්සනය ම කළ යුතුය. '**නැවත පිරිවෙස් දීම් කෘත්‍යයක් නැත**' යනුවෙන් සඳහන්ව ඇත. කඞ්ඛාවිතරණී-අභිනව ටීකාවෙහි '**සචේ අන්තරාපත්ති අපටිච්ඡන්නා හොති මූලායපටිකස්සනං <u>අකත්වා</u> පුබ්බෙගහිත පරිවාසෙය්‍යේව පරිවසිතබ්බං**'[3] යැයි ද, කඞ්ඛාවිතරණී-පුරාණටීකාවෙහි '**අපටිච්ඡන්නා චේ අන්තරාපත්ති, මූලායපටිකස්සනං <u>අකත්වා</u> පුබ්බෙගහිත පරිවාසේනේව පරිවසිතබ්බං**'[4] යැයි ද දක්වා තිබේ. එම ටීකා දෙකෙහි ඇත්තාවූ මෙම පාඨ දෙක අවිචාරාත්මකව ගැනීමෙන් පෙළටත් විනය විනිච්ඡය සඞ්ග්‍රහයටත් විරුද්ධ වේ. ටීකා දෙකේ අකත්වා යන පද දෙකේ ම 'අ' යන්න ලේඛන දෝෂයක් ලෙස සලකා ඉවත් කොට '**කත්‍වා**' යන්න පමණක් ගත් විට පෙළටත් විනයවිනිච්ඡය සඞ්ග්‍රහයටත් මනාව ගැළපේ. ඡට්ඨසඞ්ගායනා කඞ්ඛාවිතරණී-අභිනවටීකාවෙහි ද දක්වා ඇත්තේ '**අකත්‍වා**' යනුවෙනි. එය ද ලේඛන දෝෂයක් ලෙස සැලකීම වටී. කඞ්ඛාවිතරණී පුරාණ/අභිනව ටීකා දෙකෙහි පැරණි පුස්කොළ පොත්වල මෙය '**කත්‍වා**' යනුවෙන් තිබුණු බවට නිගමනය කළ හැකිය. කඞ්ඛාවිතරණී පුරාණ/අභිනව ටීකා කල

1. සම.පා **4, 876** පිට හේ.මු.
2. පාළි මුත්තක විනය විනිච්ඡය, **330** පිට
3. කංඛාවිතරණී අභිනව ටීකා, සංස්. යූ. පී. ඒකනායක. **126** පිට
4. කංඛාවිතරණී පුරාණ ටීකා, සංඝාදිසේස වර්ණනා, ඡට්ඨසංගායනා.

ත්‍රිපිටකධාරී මහඋතුමන්ගේ අදහස ද මෙය ම විය යුතුය. එවිට අපටිච්ඡන්න-අන්තරාපත්තියට මූලායපටිකස්සනය පමණක් සිදු කොට පෙර ගත්තාවූ පිරිවෙස නැවත පුරා මානතට එය සමෝධාන කළ හැකිය.

අන්තරාපත්තිය මූලාපත්තියට (මුල් ඇවැතට) වඩා වැඩිපුර පිළිසන් වූයේ නම් එහි දී අන්තරාපත්තිය මූලාපත්තිය බවට පත් කොට මුල් ඇවැත එයට සමෝධාන කොට පිරිවෙස දිය යුතුයි. දෙන්නා වූ කර්මවාක්‍යයක් පෙළෙහි (සමුච්චයක්ඛන්ධකයෙහි) කියා නැති බැවින් විනයධරයාගේ කර්මවාක්‍යය යෙදීමේ හැකියාව ම මෙහි ප්‍රමාණය යයි විනය-අටුවාවෙහි කියා ඇත. මෙය ඕධානසමෝධාන නම් වේ.

## 2. අග්ගසමෝධාන

බොහෝ කාලයක් පිළිසන් ආපත්තීන්ගේ අගයෙන් සමෝදන් කිරීම අග්ගසමෝධාන නම් වේ.[1] 'අග්ග' යන්නෙන් ආපත්තිය පටිච්ඡන්නව විසූ රාත්‍රී සඞ්ඛ්‍යාව අදහස් කරයි.[2] කඞ්ඛාවිතරණී පිටපොතෙහි ද අග්ගෙන-අගවිසින්, රාත්‍රී පරිච්ඡේදය විසින් යැයි ද එහි ම **'අග්ගේන සමෝධානං අග්ගසමෝධානං තං යස්ස සෝ අග්ගසමෝධානෝ පරිවාසෝ'**[3] යනුවෙනුත් විනයාලඞ්කාර-ටීකාවෙහි ද **'අග්ගේන අග්ගවසේන අරහවසේන සමෝධානං අග්ගසමෝධානං'**[4] යනු විග්‍රහයයි. බොහොමයක්-ඇවැත් අතුරින් එකක් හෝ දෙකක් හෝ තුනක් හෝ බොහෝ හෝ ඇවැත්, සියල්ලට ම වඩා යම් ඇවැතක් වැඩිපුර පිළිසන් වූවාහු ද ඒ වැඩිපුර පිළිසන් වූ ආපත්තීන්ගේ රාත්‍රී ගණනින් සෙසු අඩුවෙන් පිළිසන් වූ ඇවැත් එකතු කොට හෙවත් ඊට ඇතුළත් කොට දෙන්නාවූ පිරිවෙස **අග්ගසමෝධාන** නම් වේ.[5] මෙම අග්ගසමෝධානය සමුච්චක්ඛන්ධකයෙහි **'තෙන ඛෝ පන සමයේන අඤ්ඤතරෝ භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියෝ ආපන්නෝ හෝති. එකා ආපත්ති එකාහ පටිච්ඡන්නා. එකා ආපත්ති ද්වීහ පටිච්ඡන්නා'**[6] යනාදි ක්‍රමයෙන් ආවේය. වජිරබුද්ධි-ටීකාවෙහි 'අග්ගසමෝධානය නම් සභාග වස්තුක වූ බොහෝ ඇවැත්වලට

1. කංඛාවිතරණී-ටීකා, සංස්. යූ.පී. ඒකනායක
2. විනය කෝෂය, 18 පිට
3. කංඛාවිතරණී පිටපොත, සංස්. කළුකොඳයාවේ පඤ්ඤාසේකර, 41 පිට
4. විනයාලංකාර-ටීකා, ගරුකාපත්ති වුට්ඨාන විනිච්ඡය කථා, ඡට්ඨසංගායනා
5. සම.පා 4, 876 පිට හේ.මු.
6. චුල්ලවග්ගපාලි 1, සමුච්චයක්ඛන්ධක, බු.ජ.ත්‍රි. 250 පිට

පැමිණියහුට වැඩිපුර රාත්‍රී සඞ්ඛ්‍යාවක් පිළිසන් වූ ඇවැතෙහි බහා ලා දිය යුතු' යැයි කියන ලද්දේය.[1] විනයාලඞ්කාර-ටීකාවෙහි '**සඞ්ඝාදිසේසො**' යන වචනයෙන් ද '**ආපත්ති**' යන වචනයෙන් ද නාමය මෙන්ම ආපත්තිය ද ගන්නා ලද්දේ වෙයි. එබැවින් අග්ගසමෝධානය වශයෙන් පිරිවෙස දුන් කල්හි '**අහං භන්තේ, සම්බහුලා ආපත්තියෝ ආපජ්ජිං**' යනාදි වචනයෙන් ද වස්තුව ද ගෝත්‍රය ද නාමය ද ඇවැත ද ගත් බැවින් බොහෝ කාලයක් පිළිසන් වූ ද අඩුවෙන් පිළිසන් වූ ද සභාගවස්තුක වූ ද විසභාග වූ ද සියලු ම ආපත්තිවලින් නැගී සිටීම සිදු වේ යැයි දත යුතු බව කියා ඇත. ඉහත කී අටුවා, ටීකාවල කරුණු අනුව අග්ගසමෝධානය ගැන තේරුම් ගත යුත්තේ මෙසේ ය. එක භික්ෂුවකට සභාග වූ බොහෝ සඟවෙසෙස් ඇවැත් ද විසභාග වූ බොහෝ සඟවෙසෙස් ඇවැත් ද දිගුකලක් පිළිසන් වූ ද කෙටි කලක් පිළිසන් වූ ද නානාවස්තුක වූ ද ඇවැත් ඇති අතර විනය-අටුවාවෙහි වස්තු, ගෝත්‍ර, නාම, ආපත්ති යනාදි වශයෙන් යොදා කර්මවාක්‍ය සකසා ගැනීම සුදුසු යැයි කී බැවින් එලෙස වත්‍ථු, නාමාදි වශයෙන් යොදා කර්මවාක්‍ය සකසා අග්ගසමෝධාන පිරිවෙස ගැනීමෙන් සභාග වූ ද විසභාග වූ ද බොහෝ කල් පිළිසන් වූ ද අඩුවෙන් පිළිසන් වූ ද සියලු ම ඇවැත්වලින් නැගී සිටීම සිදු වෙයි. මෙහි දී විශේෂයෙන් ම දත යුතු වන්නේ වැඩි කලක් පිළිසන් ඇවැතෙහි අනෙක් ඇවැත් බහාලන බැවින් පිළිසන් දින ගණන නියම වශයෙන් නිශ්චය කොට පිරිවෙස පිරිය යුතු ය යන්නයි. එසේ නොවුණු හොත් පටිච්ඡන්න දින ගණනට පිරිවෙස පිරූ නැති බැවින් කර්මය අසිද්ධියට පත් වේ. මුල පිරිය යුතු වූ පිරිවෙස මනාව නොපුරන ලද නම්, අනෙක් මානත් ආදිය ද අසිද්ධියට පත් වී ගරු-ඇවැත්වලින් නැගී සිටීමක් සිදු නොවේ.

## 3. මිස්සකසමෝධාන

'මිස්සකානං සමෝධානෝ මිස්සකසමෝධානෝ' යනු කඞ්ඛාවිතරණී-ටීකාවයි. '**නානාවත්‍ථුකානං ආපත්තීනං සමෝධානෝ මිස්සකසමෝධානෝ, තං යස්ස සෝ මිස්සකසමොධානෝ පරිවාසෝ**' යනු කඞ්ඛාවිතරණී පිටපොතයි. නානාවස්තුක ඇවැත් එකතු කොට

1. වජිරබුද්ධිටීකා, සමුච්චයක්ඛන්ධක, ඡට්ඨසංගායනා, **388** පිට

දෙන්නාවූ පිරිවෙස 'මිස්සකසමෝධාන' නම්. මෙය ලබා දෙන ක්‍රමය '**අහං භන්තේ, සම්බහුලා සඞ්ඝාදිසේසා ආපත්තියො ආපජ්ජිං එකං සුක්කවිසට්ඨිං, එකං කායසංසග්ගං**' යනාදි ක්‍රමයෙන් අදාළ භික්ෂුව ඉල්වා ඊට අනුරූපීව කර්මවාක්‍ය සකසා දිය යුතු බව අටුවාවෙහි කියන ලද්දේ ය.[1] අග්ගසමෝධානයෙන් සභාග වූ ද විසභාග වූ ද චිරපටිච්ඡන්න අචිරපටිච්ඡන්න සියලු ම ඇවැත්වලින් නැගී සිටීම සිදුවන අතර මිස්සක සමෝධානයෙන් චිරපටිච්ඡන්න වූ ද අචිර පටිච්ඡන්න වූ ද ඇවැත්වලින් නැගී සිටීම සිදු නොවේ යයි දත යුතුය.[2] මෙතැතින් පටිච්ඡන්න-පිරිවෙස, අපටිච්ඡන්න-පිරිවෙස, සුද්ධන්ත-පිරිවෙස, සමෝධාන-පිරිවෙස යන පිරිවෙස් ක්‍රම සතර ම කියන ලද්දේ ය.

නැවත ද සඞ්ක්ෂේප වශයෙන් පිරිවෙසඃ

**1.පටිච්ඡන්න-පිරිවෙස**

**2.අපටිච්ඡන්න-පිරිවෙස**

වශයෙන් දෙවැදෑරුම් වේ.

පටිච්ඡන්න-පිරිවෙස ද සුද්ධන්ත-පිරිවෙස හා සමෝධාන-පිරිවෙස යනුවෙන් දෙවැදෑරුම් වේ. සුද්ධන්ත-පිරිවෙස, චූලසුද්ධන්ත, මහාසුද්ධන්ත යනුවෙන් දෙවැදෑරුම් වේ. සමෝධාන-පිරිවෙස ඕදානසමෝධාන, අග්ගසමෝධාන, මිස්සකසමෝධාන වශයෙන් තෙවැදෑරුම් වේ.




1. සම.පා 4, 876 පිට හේ.මු.
2. විනයාලංකාර-ටීකා, ගරුකාපත්ති වුට්ඨාන විනිච්ඡය කථා, ඡට්ඨසංගායනා

## අපටිච්ඡන්න-මානත

සඟවෙසෙස්-ඇවැතකට පත් භික්ෂුව එය එදවසෙහි ම වෙනත් උපසපන් භික්ෂුවකට ආරෝචනය කළ යුතුය. ආරෝචනය කිරීමට හැකියාව තිබිය දී එය ආරෝචනය නොකිරීමෙන් ඇවැත පටිච්ඡන්න වෙයි. එවිට පිරිවෙසට රහ (සුදුසු) වූයෙක් වෙයි. එදවසෙහි ම ආරෝචනය කිරීමෙන් මානතට පමණක් රහ වූයෙක් වෙයි. ඉදින් අපටිච්ඡන්න වූ එක ම ඇවැතක් නම්, '**එකං ආපත්තිං ආපජ්ජිං...**' යනාදි සමුච්චයක්ඛන්ධකයෙහි ආ ක්‍රමයෙන් මානත ගත යුතුය. ඉදින් දෙකක් හෝ තුනක් අපටිච්ඡන්න ඇවැත් වේ නම්, '**ද්වේ ආපත්තියෝ, තිස්සෝ ආපත්තියෝ ...**' කියා යෙදීම කොට මානත ගත යුතුය. තුනකට වැඩිපුර ඇති ඇවැත් සියල්ලට ම '**සම්බහුලා ආපත්තියෝ**' කියා යෙදීම කළ යුතුය.[1] සුක්කවිසට්ඨි, කායසංසග්ග, දුට්ඨුල්ලවාචා යන ආදි වූ නානාවස්තුක-අපටිච්ඡන්න-ආපත්තීහු ද වත්‍ථු, ගොත්තාදි වශයෙන් යොදා කර්මවාක්‍ය සකසා දිය යුතුය. පටිච්ඡන්න- මානත, පටිච්ඡන්න-පිරිවෙසට ම දෙන බැවින් එය ඉහතින් කියනා ලද්දේ ය.

## පක්ඛමානත

භික්ෂුණියකට දිය යුතු මානත 'පක්ඛමානත'යි. '**ගරුධම්මං අජ්ඣාපන්නාය භික්ඛුනියා උභතෝ සඞ්ඝේ පක්ඛමානත්තං චරිතබ්බං**'[2] යනුවෙන් ගරුධර්මයකට පැමිණි භික්ෂුණිය දෙසඟුන් කෙරෙහි පක්ඛමානත පිරිය යුතුය යැයි භික්ඛුනීඛන්ධකයෙහි කියන ලද බැවින්, පිළිසන් හෝ නොපිළිසන් ඇවැතකට අඩමසක් ම පක්ඛමානත දිය යුතුය. ගරුඇවැතට පත් භික්ෂුණිය විසින් මෙය භික්ෂුණීසඞ්ඝයා හමුවෙහි ගෙන භික්ෂු-භික්ෂුණී දෙසඟුන් කෙරෙහි ම පිරිය යුතුය.[3] පක්ඛමානත පිරීම වූ කලි ඉතා දුෂ්කර වූවකි. **භික්ෂුණීසඞ්ඝයා මෙකල නැති බැවින්** එය විස්තර කිරීම නිරර්ථක ය. අවශ්‍යවූවන්ට චුල්ලවග්ගපාළි අටුවාවෙන් බලා දත හැකිය.

1. සම.පා 4, 867 පිට හේ.මු.
2. චුල්ලවග්ගපාලි 2, භික්ඛුනීඛන්ධකය, බු.ජ.ත්‍රි. පිට 472
3. සම.පා 4, 877 පිට හේ.මු.

# සමෝධානමානත

ඕධානසමෝධාන, අග්ගසමෝධාන, මිස්සකසමෝධාන වශයෙන් සමෝධාන-මානත තෙවැදෑරුම් වේ. සමුච්චයක්ඛන්ධකයෙහි ආ පඤ්චාහපටිච්ඡන්න ඇවැතට පිරිවෙස් පුරන්නා වූ උදායී තෙරුන් වහන්සේ පිරිවෙසෙහි ද මානත්තාරහ අවස්ථාවෙහි ද අන්තරාපත්තියට පැමිණ මූලායපටිකස්සනය කොට එම පඤ්චාහපටිච්ඡන්න-සඟවෙසෙස්- ඇවැත්වලටත් පිරිවෙස් පුරන අතරතුර පත්වුණු අපටිච්ඡන්න-ඇවැතටත් මානත්තාරහ අවස්ථාවෙහි දී සිදු වූ අපටිච්ඡන්න-ඇවැතටත් **'තේන හි භික්ඛවේ සඞ්ඝෝ උදායිස්ස භික්ඛුනෝ තිස්සන්නං ආපත්තීනං ඡාරත්තං මානත්තං දේතු'**[1] යනුවෙන් අනුදන්නා ලද මානත ඕදානසමෝධාන-මානත නම් වේ.[2] අග්ගසමෝධාන, මිස්සකසමෝධාන යන මානත් දෙක වූ කලි අග්ගසමෝධාන, මිස්සකසමෝධාන-පිරිවෙස් අවසානයෙහි දී දිය යුතු මානත් දෙකයි. එය පිරිවෙස්-කර්මවාක්‍යානුසාරයෙන් ම යොදා දිය යුතුය.[3] මෙතැකින් කියන ලද්දේ මානත් ක්‍රම හතර පිළිබඳවයි.

නැවත ද සඞ්ක්ෂේප වශයෙන් පටිච්ඡන්න හා අපටිච්ඡන්න වශයෙන් මානත දෙකොටසකට බෙදේ. පටිච්ඡන්න-පිරිවෙස පිරීමෙහි දී සිදු වූ අපටිච්ඡන්න-අන්තරාපත්ති, මූලාය පටිකස්සනය කොට පිරිවෙස පුරා අනතුරුව අපටිච්ඡන්න අන්තරාපත්ති, සමෝධාන කළ යුතුය. මෙම සමෝධාන-මානත වනාහි ඕදානසමෝධාන, අග්ගසමෝධාන, මිස්සකසමෝධාන කියා තෙවැදෑරුම් වේ.




1. චුල්ලවග්ගපාළි 1, සමුච්චයක්ඛන්ධක, බු.ජ.ත්‍රි. 218 පිට
2. සම.පා 4, 879-880 පිට හේ.මු.
3. සම.පා 4, 880 පිට හේ.මු.

# පිරිවෙස් පුරන භික්ෂුවගේ රාත්‍රිච්ඡේද

උපාලි මහරහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේ වෙත එළඹ '**කතිනුබෝ භන්තේ, පාරිවාසිකස්ස භික්ඛුනෝ රත්තිච්ඡේදා**' යනුවෙන් 'ස්වාමීනි, පිරිවෙස් වසන භික්ෂුවට රාත්‍රිච්ඡේද කෙතෙක් ද?' යැයි විමසූහ. '**තයෝ බෝ උපාලි, පාරිවාසිකස්ස භික්ඛුනෝ රත්තිච්ඡේදා සහවාසෝ, විප්පවාසෝ අනාරෝචනා**' යනුවෙන් 'උපාලි, සහවාසය, විප්පවාසය, අනාරෝචනය කියා පිරිවෙස් වසන භික්ෂුවට රාත්‍රිච්ඡේද තුනෙකැ'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.[1] පිරිවෙස් පුරන භික්ෂුව විසින් ඉහත කී රාත්‍රිච්ඡේද තුන මනාව දත යුතුය. එය නිසියාකාරව නොදැනීමෙන් රාත්‍රිච්ඡේදය සිද්ධ වී පිරිවෙසේ දින ගණන නියම ලෙස නොපිරීමෙන් ගන්නා වූ මානත් ආදියත් අසිද්ධියට පත් වේ. එබැවින් සහවාස, විප්පවාස, අනාරෝචන යන ආකාරත්‍රය පහත විස්තර කෙරේ.

## සහවාසය

ආවාස සහ අනාවාස වශයෙන් ස්ථාන දෙකකි. '**ආවාස**' යනු වැඩ වාසය කිරීම සඳහා කරන ලද සෙනසුනයි. '**අනාවාසය**' නම් චෛතියඝර, බෝධියඝර, ඉදල්-කොසු තබන මැසි, දරමැසි, වැසිකිළි, දොරකොටු ආදියයි. පාරිවාසික භික්ෂුවක් වනාහි ප්‍රකෘති භික්ෂුවක් සමඟ පංචවිධ ඡදනයන්ගෙන් සෙවිලි කරන ලද හෝ ඒවාට අනුලෝම වූ හෝ ආවාසයක නැතහොත් අනාවාසයක වාසය කිරීම සහවාසයයි. මෙම ආවාස, අනාවාස දෙකෙහි වහළයෙන් දිය වැටෙන අවකාශය තුළ ප්‍රකෘති-භික්ෂුවක් නිදන කල්හි පිරිවෙස් පුරන භික්ෂුව දැන දැන නිදයි නම්, රාත්‍රිච්ඡේදය මෙන් ම වත්තභේද දුකුලාව සිදු වේ. නොදැන නිදයි නම්, රාත්‍රිච්ඡේදය පමණක් සිදු වේ. පාරිවාසික-භික්ෂුව ඉඳ ගෙන සිටීමෙන් රාත්‍රිච්ඡේදය සිදු නොවේ. නිදන-ඉරියව්වට පැමිණීමෙන් ම රාත්‍රිච්ඡේදය සිදු වෙයි. නානා උපචාර ඇත්තා වූ ඒකච්ඡන්න ආවාස, අනාවාසයන්හි ද ප්‍රකෘති-භික්ෂුවක් සමඟ නිදීමෙන් රාත්‍රිච්ඡේදය සිදු වන බව දත යුතුය.[2]

1. චුල්ලවග්ගපාළි **1**, පාරිවාසිකක්ඛන්ධකය, බු.ජ.ත්‍රි. **166** පිට
2. සම.පා, **4**, **864** පිට. හේ.මු.

# විප්පවාසය

එකලාව වාසය කිරීම 'විප්පවාසය'යි.[1] පිරිවෙස සමාදන් වූ භික්ෂුවට පිරීමට වතක් ඇති බැවින් ඔහු තනිව වාසය නොකළ යුතුය. යටත්පිරිසෙයින් එක් භික්ෂුවක් හෝ සිටිය යුතුය. එක් භික්ෂුවක්වත් නොමැතිව පිරුවාවූ පිරිවෙස ගණනූපග නොවේ. දසවිධ-අන්තරායක් ඇති කල්හි වුව ද එකලාව පිරුවා වූ පිරිවෙස ගණනූපග නොවන බව දත යුතුය. නික්ඛිත්ත ක්‍රමයට විහාර-උපචාරයෙන් බැහැරව වත පිරීමෙහි දී ද්වාදස හත්ථූපචාරය (දොළොස් රියන) ඇතුළත උපසපන්-භික්ෂුවක් සිටීම සහවාසය යි. තව ද දොළොස් රියන තුළ සිටි භික්ෂූන්ට පිරිවෙස ආරෝචනය කොට ඔවුන් ඇත යයි සලකා විසූ කල්හි එම භික්ෂූන්ගේ යෑමෙන් රාත්‍රිච්ඡේදය සිදු නොවන බව අටුවාවෙහි දක්වා තිබේ.[2] විහාරයෙහි සිට පිරිවෙස පිරීමේ දී විහාර උපචාරයේ ප්‍රකෘති-භික්ෂූන් සිටීම සහවාසයයි. විහාරයෙහි සිටි භික්ෂූන්ට වුව ද ආරෝචනය කොට, එම භික්ෂූන් විහාරය තුළ ඇති බව සලකා වාසය කරන කල්හි අන් සියලු භික්ෂූන් කිසියම් කටයුත්තක් සඳහා වෙහෙරින් නික්ම ගිය කල්හි විප්පවාසයක් සිදු නොවන බව විමතිවිනෝදනී ටීකාවෙහි සඳහන් වේ.[3]

කම්ම හෝ ලබ්ධි නානාසංවාසකයින් සමීපයෙහි පුරන්නාවූ පිරිවෙස ද ගණනූපග නොවේ. ඔවුන් සිටින්නා වූ ආවාසය පිරිවෙස් පුරන සමාන සංවාසක භික්ෂුවට අභික්ඛුක-ආවාසයක් බඳු ය.[4] සමාන-සංවාසකයින් ඔවුනොවුන් ළඟත් නානාසංවාසකයින් ඔවුනොවුන් ළඟත් පුරන්නාවූ පිරිවෙස ගණනූපග වේ.

# අනාරෝචනය

අනාරෝචනය යනු ආගන්තුකාදීන්ට ආරෝචනය නොකිරීමයි.[5] **'ආගන්තුකේන ආරෝචේතබ්බං, ආගන්තුකස්ස ආරෝචේතබ්බං'**[6] යනාදි ක්‍රමයෙන් දේශනා කර ඇති බැවින් වෙනත් වෙහෙරකට ගිය පිරිවෙස් පුරන ආගන්තුක භික්ෂුව එම වෙහෙරෙහි සිටින අන්‍ය සියලු ම භික්ෂූන්ට වත ආරෝචනය කළ යුතුය. මෙය **'ආගන්තුකේන**

---

1. සම.පා 4, 866 පිට. හේ.මු.
2. සම.පා 4, 868 පිට. හේ.මු.
3. විමතිවිනොදනී-ටීකා, සමුච්චයක්ඛන්ධක, සංස්. බේරතුඩුවේ ධම්මාධාර හිමි, 450 පිට
4. සම.පා 4, 864-865 පිට. හේ.මු.
5. සම.පා 4, 866 පිට. හේ.මු.
6. චුල්ලවග්ගපාළි 1, සමුච්චයක්ඛන්ධක, බු.ජ.ත්‍රි. 160 පිට

**ආරෝචේතබ්බං**' යන්නයි. පිරිවෙස් පුරන භික්ෂුව වැඩ වෙසෙන වෙහෙරට පැමිණි ආගන්තුක භික්ෂූන්ට ආරෝචනය කිරීම '**ආගන්තුකස්ස ආරෝචේතබ්බං**'[1] යන්නයි. වැඩිමනක් වශයෙන් ම වත් මානත් පුරන භික්ෂූන්ගේ රාත්‍රිච්ඡේදය සිදු වන්නේ මෙම අනාරෝචනය හේතු කොට ගෙන ය. එබැවින් වැඩි වශයෙන් අනාරෝචනය මෙතැන් පටන් විස්තර කෙරේ.

අනික්බිත්ත ක්‍රමයට විහාරය තුළ භික්ෂුවක් පිරිවෙස් පුරන කල්හි ආගන්තුක භික්ෂුවක් මොහොතකට හෝ වෙහෙරට පිවිසෙයි නම් හෝ වෙහෙර මැදින් ගමන් කරයි නම් ඔහුට ද ආරෝචනය කළ යුතුය. වත පුරන භික්ෂුව දැන ගැනීමට මත්තෙන් යයි නම් එම භික්ෂුව සොයා ගොස් ආරෝචනය කළ යුතුය. හමු වීමට නොහැකි වුව හොත් රාත්‍රිච්ඡේදය සිදු වෙයි. වත්තභේද දුකුලාව සිදු නොවේ. නොදැන හෝ පැමිණ ගියහොත් රාත්‍රිච්ඡේදය සිදු වේ. එබැවින් වත් පුරන භික්ෂූන් ආගන්තුක භික්ෂූන්ගේ පැමිණීම පිළිබඳව නිතර විමසිල්ලෙන් සිටිය යුතුය. උපචාර භූමියෙන් බැහැර වූ භික්ෂුවක් වුව ද දැකීමෙන් හෝ එම භික්ෂුවගේ ශබ්ද ඇසීමෙන් හෝ භික්ෂුවක් ම යන ව්‍යවස්ථාපනය ඇති නම් හෝ එතැනට ගොස් හෝ ආරෝචනය කළ යුතුය. නැතහොත් රාත්‍රිච්ඡේදය සිදු වේ. එබැවින් අටුවාවෙහි '**නදී ආදීසු නාවාය ගච්ඡන්තම්පි පරතීරේ ඨිතම්පි ආකාසේන ගච්ඡන්තම්පි පබ්බතතලඅරඤ්ඤාදිසු දූරේ ඨිතම්පි භික්ඛුං දිස්වා සචේ භික්ඛූති වවත්ථානං අත්ථි, නාවාදීහි වා ගන්ත්වා මහාසද්දං කත්වා වා වේගේන අනුබන්ධිත්වා වා ආරෝචේතබ්බං**'[2] යනුවෙන් කියන ලද්දේය. '**භික්ඛූති වවත්ථානං අත්ථි**' යන්නෙන් අදහස් කරන ලද්දේ 'මේ භික්ෂුවක් ම ය' යන සන්නිෂ්ඨානය තිබිය යුතු බවයි. 'භික්ෂුවක්ය' යන සන්නිෂ්ඨානය නැති නම්, අනාරෝචනයෙන් රාත්‍රිච්ඡේදය සිදු නොවේ. **භික්ෂුවක් ද අභික්ෂුවක් ද යන සැකය ඇති කල්හි ආරෝචනය නොකර සිටීම නුසුදුසු ය. සැකය වනාහි විනය කර්මයට හානි පමුණුවන බැවින් ගරු තැන්හි පිහිටා සොයා බලා භික්ෂුවක් නම්, ආරෝචනය කළ යුතුය.** එලෙස උපචාරයෙන් බැහැර සිටි භික්ෂුවක් දැක ආරෝචනය කිරීමට යන අතරතුර තවත් උසපපන් භික්ෂූන් දකී නම්, ඔවුන්ට ද ආරෝචනය කළ

1. සම.පා 4, 863 පිට හේ.මු.
2. සම.පා 4, 864 පිට හේ.මු.

යුතුය. වෙහෙර තුළ වත පුරන්නා වෙහෙරින් නික්මුණු කල්හි දිට්ඨරූප, සුතරූප පුද්ගලයන්ට පමණක් ආරෝචනය කළ යුතු බව දත යුතුය.

විනය-අටුවාවෙහි '**අයං ච නේසං ඡත්තසද්දං වා උක්ඛාසිතසද්දං වා ඛිපිතසද්දං වා සුත්වා ආගන්තුකභාවං ජානාති, ගන්ත්වා ආරෝචේතබ්බං**' යන පාඨයට අනුව විනයාලඞ්කාර- ටීකාවෙහි ත්‍රිපිටකධාරී මුනින්දඝෝෂ ආචාර්යයන් වහන්සේ '**අයං භික්ඛූනං සද්දො, අයං භික්ඛූහි වාදිතභේරිසඞ්ඛාදීහි සද්දෝ, අයං භික්ඛූහි පාජිතසකටනාවාදීහි සද්දෝති සන්නිට්ඨානෝ ජානන්තෝයේව රත්තිච්ඡේදකරෝ හෝති**'[1] යනුවෙන් 'මෙය භික්ෂූන්ගේ ශබ්දයකි, මෙය භික්ෂූන් විසින් වාදනය කරන ලද බෙර සඞ්ඛාරාදීන්ගේ ශබ්දයකි, මෙය භික්ෂූන් විසින් පදවන ලද කරත්තාදීන්ගේ ශබ්දයක් යැයි සනිටුහන් කරමින් දැනගන්නේම රාත්‍රිච්ඡේදය සිදු කරයි' යැයි සඳහන් වේ. **(වාදිතභෙරිසඞ්ඛාදී පාඨත් පාජිතසකටනාවාදීහි පාඨත් වරදවා ගෙන භික්ෂූන්ට බෙර, සඞ්ඛාර, සංගීත භාණ්ඩාදිය වාදනය කිරීමට හෝ ගැසීමට ද කරත්ත නැව් ආදිය පැදවීමට ද අවසර ඇතැයි තේරුම් නොගත යුතුය. ආචාර්යයන් වහන්සේ අටුවා පාඨයට ටීකා කිරීම් වශයෙන් උදාහරණ දක්වූවා විනා විනය යුක්ති වශයෙන් මෙය නොකියන ල්දේ යැයි විශේෂයෙන් දත යුතුය.)**

ඉහත කී අටුවා, ටීකා පාඨවලට අනුව වර්තමානයෙහි වත්පුරන්නාවූ භික්ෂූන් විසින් බොහෝ කරුණු ගැන විශේෂයෙන් සැලකිල්ලක් දක්වමින් වත් මානත් පිරිය යුතුය. වෙහෙරක වත පුරන භික්ෂුවක් එම වෙහෙර අසල ඇති අනෙක් විහාරස්ථානවල භික්ෂූන්ගේ හඬ '**ශබ්දවිකාශන යන්ත්‍ර**' මගින් හෝ අසයි නම්, ආරෝචනය කළ යුතුය. ගෙඩියකට හෝ ගසන්නා වූ පහරක් අසා 'භික්ෂුවක්' ය යන ව්‍යවස්ථාපනය ඇති නම්, ආරෝචනය කළ යුතුය.

මෙකල නවීන තාක්ෂණික භාණ්ඩ බහුලව භාවිත වන කාලයකි. ඒවා අතර දුරකතන, ගුවන්විදුලි, රූපවාහිනී ආදිය නිසා වත් මානත් පුරන භික්ෂූන්ට නොයෙක් විට සැක සඞ්කා ඇති විය හැකියි. මෙබඳු තාක්ෂණික භාණ්ඩ ගැන පිළිපදින්නේ කෙසේදැයි කියා අටුවා, ටීකාවල ඍජුව සඳහනක් නැත. එසේ වුවත් අටුවා, ටීකාවල එන ඇතැම් කරුණු අනුව දුරකතනයකින් වුවත් වත් මානත් පුරන භික්ෂුවක් උපචාර

1. විනයාලංකාර-ටීකා, ගරුකාපත්ති වුට්ඨාන විනිච්ඡය කථා, ඡට්ඨසංගායනා

සීමාවෙන් බැහැර සිටින, ආරෝචනය නොකළා වූ භික්ෂුවක් සමඟ කථා කිරිමෙන්, එම භික්ෂුවට ආරෝචන කෘත්‍ය සිදු නොකිරිමෙන් රාත්‍රිච්ඡේදය සිදු වන බව පැහැදිලි වේ. එපමණක් නොව සජීවිව ගුවන්විදුලි, රූපවාහිනී ආදියෙන් භික්ෂුවකගේ ධර්ම දේශනයක් හෝ ධර්මසාකච්ඡාවක්, ඇසීමෙන් හෝ දැකීමෙන් ආරෝචනය නොකිරිමෙන් රාත්‍රිච්ඡේදය සිදු වන බව ද පැහැදිලි වේ. ඒ කෙසේ ද යත් අටුවාවෙහි **"ආගන්තුක භික්ෂුවක් උපචාර සීමාවට බැස මඳ වේලාවක් හෝ සිට ගිය කල්හි වත පුරන භික්ෂුව ආගන්තුක භික්ෂුවක් පැමිණි බව නොදන, පසුව දනී නම්, එම භික්ෂුව සොයා ගොස් හෝ ආරෝචනය කළ යුතු බවත් නැතහොත් රාත්‍රිච්ඡේදය සිදු වන බවත් පවසා ඇත"**.

තව ද **"පර්වත, කැලෑ ආදී දුර තැනක සිටි භික්ෂුවක් වුවත් දක, 'භික්ෂුවක් ය' යන ව්‍යවස්ථාපනය ඇති නම්, වේගයෙන් හෝ ගොස් මහාශබ්දයක් හෝ කොට ආරෝචනය සිදු කළ යුතු බවත් නැතහොත් රාත්‍රිච්ඡේදය සිදු වන බවත් පවසා ඇත"**. මෙම අටුවා පාඨයෙන් කියන ලද්දේ උපචාරසීමාවෙන් බැහැර සිටින භික්ෂූන් දක 'භික්ෂුවක් ය' යන ව්‍යවස්ථාපනය ඇති නම්, ආරෝචනය නොකිරිමෙන් රාත්‍රිච්ඡේදය සිදු වන බවයි. උපචාර-සීමාවට පැමිණි භික්ෂුව ගැන ව්‍යවස්ථාපනයක් නැත. එහි දී ආ බව දන සිටියත් නැතත් ආරෝචනය නොකර සිටීමෙන් රාත්‍රිච්ඡේදය සිදුවනු ඇත. තව ද විනයාලඞ්කාර-ටීකාවේ එන **"වාදිතභේරිසංඛාදීහි, පාජිතසකටනාවාදීහි"** පාඨවලින් පවා දුරකතන මඟින් කථා කරන භික්ෂූන්ගේත් ගුවන්විදුලි, රූපවාහිනී මඟින් සජීවී ධර්මදේශනාවක් හෝ සාකච්ඡාවක් අසන භික්ෂූන්ගේත් රාත්‍රිච්ඡේදය සිදුවන බව මනාව පැහැදිලි වේ.

මෙහිදී ඇතිවන අනෙක් ප්‍රශ්නය වනුයේ දුරකතනයකින් කථා කිරිමෙන් ආරෝචනය සිදු කළ යුතු නම්, එම ආරෝචනය දුරකතනයෙන් ම සිදු කළ හැකි නොවේ ද යන්නයි. ඇත්ත, එම ආරෝචනය දුරකතනයෙන් සිදු කළ හැකි බවක් ද පෙනේ. එසේ වුවත් **"ගරුක ලහුකේසු ගරුකේ ඨාතබ්බන්ති ඒතං විනය ලක්ඛනං"**[1] යනුවෙන් ගරුලහු තැන්හි, ගරුතැන්හි සිටිය යුතු ය යන මෙය විනය ලක්ෂණය බව අටුවාඇදුරන් කියා ඇති බැවින් මෙය තව දුරටත් විමසිය යුතුය. පුරාණ ආචාර්යයන් වහන්සේලා විනය කර්මයක සීමා සම්පත්ති

1. සම.පා 2, 557 පිට හේ.මු.

නිර්ණයෙහි දී සඞ්කාදෝෂ කෝප්‍යස්ථානයෙහිලා සැලකූ බැවින් මෙහි දී ගරු තැන්හි පිහිටීම වඩාත් යුතුය.

**එබැවින් ඉහත කීවා වූ කරුණු තවදුරටත් විමසා වඩාත් සැලකිල්ලට ගෙන, ගරු ඇවැත්වලින් නැගී සිටීම සඳහා වත් මානත් පුරන බැවින් ඒවා සැක සංකා නොසිටින අයුරින් ම සිදුකර ගත යුතුය. සැක සංකා ඇතිව පිරිවෙස්-මානත් පිරීමෙන් හානිය සිදුවන්නේ තමන්ට ම ය. උඩ කියන ලද්දා වූ කරුණු වත් මානත් පුරනු ලබන අතරතුර භික්ෂූන්ට ප්‍රායෝගිකව ඇතිවිය හැකි ගැටලු ය. ඒවා කියන ලද්දේ සැකසඞ්කාවක් නොසිටින අයුරින් වත් මානත් පුරා ගැනීම සඳහා බව දත යුතුය.**

ආරෝචනයෙහි දී '**සාවේතුං**' යන පදය අටුවාවෙහි කියා ඇති බැවින් වත් මානත් ආරෝචනය භික්ෂූන්ට ඇසෙන පරිද්දෙන් ම කළ යුතුය. යම් යම් කටයුතුවල යෙදී සිටින භික්ෂූන්ට, වත් මානත් ආරෝචනය කිරීමෙහි දී ඔවුන්ට නොඇසුණේ නම් හෝ අළුයම්හි ආරෝචනය කරන විට සැතපී සිටින විට දී හෝ නොඅසයි නම් රාත්‍රිච්ඡේදය සිදු වේ.[1] එබැවින් මෙම කරුණු ගැන වත් මානත් පුරනු ලබන භික්ෂූන් විසින් විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු අතර මේවා දක්වන ලද්දේ අමුතු විනයක් ඉස්මතු කොට භික්ෂූන්ට කුකුස් ඉපදවීම පිණිස නොව ටීකාවල සඳහන් කර ඇති බැවින් මහාප්‍රඥාවත් ටීකාචාර්යවරුන් පවා මේවා දක්වා ඇත්තේ අටුවාවල ආ කරුණු අනුසාරයෙනි. '**පකරණේසු ආගතත්තා තථාගතනයෝ පකරණාගත නයෝ හෝති**'[2] යනුවෙන් '**ප්‍රකරණයන්හි ආ බැවින් තථාගත නය ප්‍රකරණාගත නය වෙයි**' යැයි විනයාලඞ්කාර-ටීකාවෙහි සඳහන් කර ඇති බැවින් මේවා ශාස්තෘ අදහස ම බව දත යුතුය. **තව ද කන් නොඇසෙන භික්ෂූන් කෙරෙහි පිළිපැදිය යුත්තේ කෙසේදැයි අටුවා ටීකාවල කිසිවක් කියා නොමැත.** ආරෝචනය ඇස්සවීමට කියා ඇති බැවින් හස්තවිකාරාදියකින් හෝ ලේඛනයකින් හෝ කීමෙහි ද යුක්තියක් නොපෙනේ. එබැවින් එබඳු භික්ෂූන් සිටින තැන්වල වත් මානත් පිරීම නොකළ යුතුය. වත් මානත් පුරන භික්ෂුවක් යාමට අපහසු වූ ගිලන්බවකින් පෙළෙන්නේ නම් උපසපන් භික්ෂුවක් ලවා ආරෝචනය කරවීමට ද සුදුසු යයි විනය-අටුවාවෙහි සඳහන් වේ.[3]

1. සම.පා **2, 557** පිට හේ.මු.
2. විනයාලංකාර ටීකා, ගරුකාපත්ති වුට්ඨාන විනිච්ඡය කථා, ඡට්ඨසංගායනා
3. සම.පා **4, 864** පිට හේ.මු.

**වත් මානත් පුරන භික්ෂුවට කිනම් කරුණකින් හෝ කතාකිරීමට නොහැකි වුවහොත් මෙහි දී ද කුමක් කළ යුතු දැ යි අටුවා, ටීකාවන්හි ඍජුව සඳහනක් නැත.** පෙළ තේරුම් ගත යුතු වන්නේ අටුවා, ටීකාවල කී කරුණු අනුවය. පෙළ අටුවා ටීකාවල සඳහන් කර නැත්තක් පවසන විට එය පෙළ, අටුවා, ටීකාවලට ගැළපෙන අයුරින්ම කළ යුතුය. එසේ වුවත් එය අත්තනෝමතියක් ම ය. සමුච්චයක්ඛන්ධක-අටුවාවෙහි **'සචස්ස මුඛෙ අප්පමත්තකෝ ගණ්ඩෝ වා හෝති, හනුකවාතෝ වා විජ්ජති, දන්තෝ වා රුජ්ඣති, භික්ඛා වා මද්දලද්ධා හෝති, තාවතකේන පන නේව වත්තුං න සක්කෝති න ගන්තුං, අපි ච ඛෝ න සක්කෝමීති සඤ්ඤිනෝ හෝති අයං පහූහුත්වා අප්පහුසඤ්ඤී නාම, ඉමිනා ඡාදිතාපි අච්ඡාදිතා'** යනුවෙන් 'ඉදින් ඇවැතකට පත් භික්ෂුවකගේ මුඛයෙහි ස්වල්පමාත්‍ර වූ ගෙඩියක් හෝ වෙයි ද හක්රුදාවක් හෝ වෙයි ද දතක් හෝ රිදෙයි ද භික්ෂාව හෝ මඳව ලැබුණේ වෙයි ද එපමණකින් වනාහි කීමට නොහැක්කේ නොවෙයි, යෑමට නොහැක්කේ නොවෙයි. එතකුදු වුවත් නොහැක්කෙමියි යන සඤ්ඤාව වෙයි. මෙය වනාහි හැකියාව ඇතිව නොහැකිය' යන සංඥාව නම්. මොහු විසින් වැසුවේ වුව ද නොවසනා ලද්දේ යැයි ස්වල්පමාත්‍ර වූ ආබාධයක් හේතුවෙන් ආරෝචනය කිරීමට හැකියාව ඇතත් ඇවත ආරෝචනය නොකිරීමෙන් පටිච්ඡන්න නොවන බවක් ද කියා තිබේ.

තව ද **'සචේ අන්තරාපත්ති මූලාපත්තිතෝ අතිරේක පටිච්ඡන්නා හෝති, තත්‍ථ කිං කාතබ්බන්ති වුත්තේ මහාසුම්මත්ථේරෝ ආහ:- 'අතේකිච්ඡෝ අයං පුග්ගලෝ, අතේකිච්ඡෝ නාම ආවීකාරාපේත්‍වා විස්සජ්ජේතබ්බෝ'ති. මහාපදුමත්ථේරෝ පනාහ: කස්මා අතේකිච්ඡෝ නාම? නනු අයං සමුච්චයක්ඛන්ධකෝ නාම බුද්ධානං ඨිත කාල සදිසෝ? ආපත්ති නාම පටිච්ඡන්නා වා හෝතු, අපටිච්ඡන්නා වා හෝතු, සමකඌනතරඅතිරේකපටිච්ඡන්නා වා. විනයධරස්ස කම්මවාචං යෝජේතුං සමත්‍ථභාවෝයේවෙත්‍ථ පමාණං. තස්මා යා අතිරේකපටිච්ඡන්නා හෝති, තං මූලාපත්තිං කත්‍වා තත්‍ථ ඉතරං සමෝධාය පරිවාසෝ දාතබ්බෝ'**[1] යනුවෙන් 'ඉදින් අන්තරාපත්තිය මූලාපත්තියට වඩා වැඩිපුර පිළිසන් වූයේ වෙයි ද එහි දී

1. සම.පා **4, 876** පිට හේ.මු.

කුමක් කළ යුතු දැයි කී කල්හි මහාසුම්ම තෙරුන් වහන්සේ 'මෙම පුද්ගලයා පිළියම් රහිත වූවෙකි. පිළියම් කට නොහැකි බව සැල කරවා ලජ්ජී ගණයාගෙන් බැහැර කළ යුතු යැයි කීවාහ. මහාපදුම තෙරුන් වහන්සේ කුමක් හෙයින් පිළියම් රහිත වූවෙක් වෙහි ද? මේ සමුච්චයක්ඛන්ධය බුදුරදුන් දිවමන් කල් බඳු නොවේ ද ? ඇවැත් නම් වැසුණේ හෝ වේවා නොවැසුණේ හෝ වේවා සමව - අඩුවෙන් - වැඩිපුර වැසුණේ හෝ වේවා විනයධරයාගේ කර්මවාක්‍ය යෙදීමේ සමර්ථභාවය ම මෙහි ප්‍රමාණයි. එබැවින් යම් ඇවැතක් වැඩිපුර පිළිසන් වූයේ වෙයි ද එය මුල් ඇවැත කොට එහි අනික් ඇවැත (හෝ ඇවැත්) එකතු කොට පිරිවෙස දිය යුතුය' යනුවෙන් අටුවාවෙහි මහාසුම්ම, මහාපදුම යන තෙරුන් වහන්සේලාගේ වාදයෙන් මහාපදුම තෙරුන්ගේ අදහස පිළිගෙන ඇත. ඒ අනුව පෙළෙහි කර්මවාක්‍ය කියා නොමැති ආපත්ති ක්‍රමවලට වුවත් කම්වැකි සකසා දිය හැකි බව අටුවාවෙහි පවසා ඇත්තේ සෑම ආපත්ති ක්‍රමයකටම පිළියම් කිරීමේ ඇති හැකියාව පවතින බව හඟවමිනි. ඉහත කී අටුවාපාඨ දෙකට අනුව පෙනෙන්නේ සඟවෙසෙසකට පත් භික්ෂුවකට එයින් නැගීසිටීමට පහසුවත්, හැකියාවත් සලස්වා ඇති බවය.

ඉදින් පිරිවෙස් පුරන විට දී හෝ පිරිවෙසක් ගෙන පිරීමට මත්තෙන් හෝ කථා කිරීමට නොහැකි වූ භික්ෂුවට එයින් නැගී සිටීමේ ක්‍රමයක් නොමැති නම් එම භික්ෂුව මහාසුම්ම තෙරුන් වහන්සේ කී අයුරින් **'අතේකිච්ඡ'-පුද්ගලයෙක්** වනු ඇත. එසේ වුවත් සමුච්චයක්ඛන්ධකයෙහි පිරිවෙස් වසන්නාත් මූලායපටිකස්සනාරහ වූවකුත් මානත්තාරහ වූවකුත් මානත්ත චාරිකයාත් අබ්භානාරහ වූවකුත් සිවුරු හැරීමෙන් සාමණේර වීමෙන් උමතු වීමෙන් වේදනාවෙන් පෙළෙන්නෙක් වීමෙන් (උමතු වූ තත්ත්වය හා වේදනා තත්ත්වය විනය පාරාජිකා-අටුවාහි කී පරිදි දත යුතු ය) ත්‍රිවිධ උක්ෂේපණීය කර්ම සිදු කිරීමෙන් පිරිවෙස් ආදිය රූහණය නොවන බව පවසා ඇත. එම අවස්ථා අතුරින් කථා කිරීමට නොහැකි වූවකුගේ පිරිවෙස රූහණය නොවන බවක් කියා නොමැති බැවින් මොහුගේ පිරිවෙස රූහණය වන බව

හැඟේ. පිරිවෙස රූහණය වී පවතී නම් උට්ඨානයක් ද ඔහුට තිබිය යුතුය. කථා කිරීමට නොහැකි වූවහුට උපසම්පදාව ප්‍රතික්ෂේප කිරීමට පවා නොහැකිය. වාග්භින්දනයකින් එම උපසම්පදාව ප්‍රතික්ෂේප කිරීම සිදු කළ යුතු බව අටුවාවෙහි දක්වා තිබේ.[1] එබැවින් කථාකිරීමට හැකියාව නැතත් ඇවැත්වලින් නැගී සිටීමේ හැකියාව ඇති බව හැඟේ. තව ද චම්පෙය්‍යක්ඛන්ධකයෙහි '**ද්වේ මේ භික්ඛවේ, ඔසාරණා අත්ථි භික්ඛවේ පුග්ගලෝ අප්පත්තෝ ඕසාරණං තං චේ සඞ්ඝෝ ඕසාරේති එකච්චෝ සෝසාරිතෝ එකච්චෝ දෝසාරිතෝ .... මූසෝ භික්ඛවේ, අප්පත්තෝ ඕසාරණං තං චේ සඞ්ඝෝ ඕසාරේති සෝසාරිතෝ**'[2] යනුවෙන් 'මහණෙනි, ඇතුළත් කිරීම් දෙකකි. මහණෙනි, ඇතුළත් කිරීමට සුදුසු වූ පුද්ගලයෙක් ඇත. සඞ්ඝ තෙමේ ඔහු ඇතුළත් කරයි නම්, කිසිවෙක් නිවැරදි ලෙස ඇතුළත් කරන ලද්දේ වෙයි. කිසිවෙක් වැරදි ලෙස ඇතුළත් කරන ලද්දේ වෙයි. ..... මහණෙනි, ගොළු වූයේ ඇතුළත් (උපසපන්) කිරීමට නුසුදුසු ය. ඉදින් සඞ්ඝයා ඔහු (උපසපන් වශයෙන්) ඇතුළත් කරන්නේ නම් නිවැරදි ලෙස ඇතුළත් කරන ලද්දේ වෙයි.' යනුවෙන් සඳහන් වෙයි. චම්පෙය්‍යක්ඛන්ධක අටුවාවෙහි '**සඞ්ඝෝ ඕසාරේතීති උපසම්පදාකම්ම වසේන පවේසේති**' යැයි '**සඞ්ඝෝ ඕසාරේති**' යනු 'උපසම්පදා කර්ම වශයෙන් ඇතුළත් කරයි' යනුවෙන් පවසා එහිම '**හත්ථච්ඡින්නාදයෝ පන ද්වත්තිංස ඕසාරිතා උපසම්පාදිතා උපසම්පන්නාව හොන්ති**' යැයි 'අත් සිඳුණු ආදීන් තිස්දෙදෙන ඕසාරණය කරන ලද්දේ, උපසම්පදා කරන ලද්දේ උපසම්පන්නයෝ ම වෙත්' යනුවෙන් කියන ලද්දේ ය. මෙහි ඇති 'හත්ථච්ඡින්නාදයො' යන පදයෙහි ආදි පදයෙන් ගොළු ආදීන් ගත් බව දත යුතුය. කථා කිරීමට නොහැකි වූවෙක් උපසම්පදා කිරීමෙන් ඔහුට උපසම්පදාව පිහිටන නමුදු කාරක සඞ්ඝයාට දුකුළා ඇවැතක් සිදු වන බවත් එහිම සඳහන් වේ.[3] කථාකිරීමට නොහැකි වූ භික්ෂුවකට වුවත් ශික්ෂාපද වීතික්‍රමණයෙන් ආපත්ති සිදු වේ. '**ආණාවීතික්කම අන්තරායිකභාවේන සග්ගමොක්ඛමග්ගං සෝධෙතුං අසක්කෝති**'[4] යනුවෙන් 'ආණාවීතික්‍රමණය හේතුවෙන් ස්වර්ගමෝක්ෂ මාර්ගය සෝධනය කිරීමට නොහැකි වේ' යැයි කියන ලද බැවින් දුකුලා ඇවැතක් බඳු වූ

1. සම.පා 1, 177 පිට හේ.මු.
2. මහාවග්ගපාලි 2, චම්පෙය්‍යක්ඛන්ධක, බු.ජ.ත්‍රි. 782 පිට
3. සම.පා 3, 851 පිට හේ.මු.
4. විනයාලංකාර-ටීකා, ගරුකාපත්ති වුට්ඨාන විනිච්ඡය කථා, ඡට්ඨසංගායනා

කුඩා ඇවැතකට වුවත් සහමුලින් ම නොපැමිණ වාසය කිරීමට පෘථග්ජන භික්ෂුවකට අපහසු ය. එබැවින් කථා කිරීමට නොහැකි වූ භික්ෂුවක් පැමිණියා වූ ලොකු කුඩා ඇවැත්වලින් නැගී සිටීමට හැකියාවක් නැති නම් ඔහු ආඥාවීතික්කමන හේතුවෙන් නිරායාසයෙන් ම අපාගාමී වනු ඇත. ආඥාවීතික්‍රමණය ස්වර්ග-මෝක්‍ෂ දෙකට අන්තරායකර බැවින් ඇවැතින් නැගී සිටීමේ හැකියාවක් නොමැති නම් කථා කළ නොහැකි වූවන්ට භාග්‍යවතුන් වහන්සේ උපසම්පදාව නොඅනුදන්නාහ. උපසම්පදාව පිහිටන බව දේශනා කොට ඇති බැවින් ඇවැත්වලින් නැගී සිටීමේ සක්‍යතාව ඇති බවත් පැහැදිලි වේ. එබැවින් කථාකිරීමට හැකියාව තිබී පසුව නොහැකි වූ පිරිවෙස්-මානත් ගැනීමට ඇති භික්ෂුවක වුව ද පිරිවෙස් ආදිය ගෙන කථා කිරීමට නොහැකි වූ භික්ෂූන්ට ද පිරිවෙස් පුරන අතරතුර කථා කිරීමට නොහැකි වූ භික්ෂූන්ට ද පිරිවෙස්-මානත් පුරා අබ්භාහන කර්ම කොට ඇවැත්වලින් නැගීසිටීමේ හැකියාව ඇති බව පැහැදිලි වේ.

එය කළ යුතු ආකාරය මෙසේ ය. '**දූතේනපි ආරෝචේතුං වට්ටති**'[1] යැයි කී බැවින් උපසම්පන්න භික්ෂුවක් ලවා ආරෝචනය කරවාගත යුතුය. එම භික්ෂුවට එය කීම හස්තවිකාර, මුඛවිකාර, ලේඛනපන්නාදියකින් හෝ දැන්වීම සුදුසු බව විනය පාලියෙහි '**කායේන විඤ්ඤාපේති දින්නෝ හෝති ඡන්දෝ .... දින්නෝ හෝති පාරිසුද්ධි**'[2] යනුවෙන් ද '**කායේන විඤ්ඤාපේති .... ගහිතෝ හෝති උපජ්ඣායෝ**'[3] යනුවෙන් ඡන්දපාරිසුද්ධිය දීමෙහි දී කයින් හැඟවීමෙන් ද සිද්ධියට පත් වේ. උපාධ්‍යාය ග්‍රහණය ද එසේම සිදු වේ. එබැවින් හස්තවිකාර, මුඛවිකාරාදියකින් දූතයාට සැල කිරීම සුදුසු ය. පිරිවෙස් මානත් සමාදන් වීම ද දූතයා ලවා සිදු කිරීම '**දූතේනපි ආරෝචේතුං වට්ටති**' යන පාඨයට අනුලෝම් වේ. පිරිවෙස පිරූ කථා කිරීමට නොහැකි වූ භික්ෂුවගේ මානත ගැනීමෙ දී යාචනය දූතයකු ලවා සිදු කර ගත යුතුය. '**තෙන හි භික්ඛවේ, සංඝෝ සුධම්මස්ස භික්ඛුනෝ අනුදූතං දේතු චිත්තං ගහපතිං ඛමාපේතුං**'[4] යැයි පටිසාරණීය කර්මයෙහි දී චිත්ත ගෘහපතිතුමාට කමා කිරීමට සුධම්ම භික්ෂුවට අනුදූතයකු දීමට භාග්‍යවතුන් වහන්සේ අනුදැන

1. චුල්ලවග්ගපාලි 1, පාරිවාසිකක්ඛන්ධකය
2. මහාවග්ගපාලි 1, උපොසථක්ඛන්ධකය
3. මහාවග්ගපාලි 1, මහාඛන්ධකය
4. චුල්ලවග්ගපාලි 1, කම්මක්ඛන්ධකය, බු.ජ.ත්‍රි. 80 පිට

ඇත. එබැවින් යාචනය සිදු කරන භික්ෂුව අපලෝකන කර්මයෙන් එම භික්ෂුව නමින් ඉල්වන යාචකයකු කොට සම්මත කර ඉල්වීම සිදු කොට අදාළ භික්ෂුව අත්පසෙහි තබා ගෙන ඔහුගේ නම ගෙන මානත දීම සිදු කළ යුතුය. අබ්භාහනය ද මෙලෙසම සිදු කළ යුතුය. කථා කිරීමට නොහැකි වූත් සඟවෙස් ඇවැත් ඇති සුද්ධිය අපේක්ෂා කරන භික්ෂූන්ට ද පරිවාස දානය මෙලෙසම සිදු කළ යුතුය.

'**යං භික්ඛවේ, මයා ඉදං න කප්පතීති අපටික්ඛිත්තං තං චේ කප්පියං අනුලෝමේති අකප්පියං පටිභාහති තං වෝ කප්පතීති**' (මහණෙනි, මා විසින් යමක් මෙය නොකැප යයි නොපිළිකෙව් කරන ලද්දේ ද එය ඉදින් කැපයට අනුලොම් වේද අකැපය වළකා ද එය තොපට කැපය.)

'**යං භික්ඛවේ, මයා ඉදං කප්පතීති අනනුඤ්ඤාතං තං චේ කප්පියං අනුලෝමේති, අකප්පියං පටිභාහති තං වෝ කප්පතීති**'[1] (මහණෙනි, මා විසින් යමක් මෙය කැප යැයි නොඅනුදක්නා ලද්දේ ද එය ඉදින් කැපයට අනුලෝම වේ ද නොකැපය වළකා ද එය තොපට කැප වේ) මෙලෙස මහාපදේශයන්හි ද සඳහන් වේ.

ඉහත කීවා වූ, කථාකිරීමට නොහැකි වූ උපසපන්-භික්ෂූන් වත් මානත් පිරීමෙහි දී අනුගමනය කළ යුතු ක්‍රමවේදය **සුත්ත** (විනයපෙළ), **සුත්තානුලෝම** (මහාපදේස), **ආචරියවාද** (අටුවා), **අත්තනෝමතීන්ට** (ටීකාවන්ට) ගැළපෙන්නේ වුව ද ඍජුව ම පෙළ, අටුවා, ටීකාවන්හි පාඨ වශයෙන් සඳහන් කර නොමැති බැවින් එම කරුණු සියල්ල තව දුරටත් පෙළ, අටුවා, ටීකා හා ගළපා බලා ගත යුතුය.

1. මහාවග්ගපාළි **2**, භේසජ්ජක්ඛන්ධකය, බු.ජ.ත්‍රි. **624** පිට

# මානත පුරන භික්ෂුවගේ රාත්‍රිච්ඡේද

උපාලි මහරහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේ වෙත එළඹ **"කතිනුඛෝ භන්තේ මානත්ත චාරිකස්ස භික්ඛුනෝ රත්තිච්ඡේදා"** යනුවෙන් ස්වාමීනි, මානත් පුරන්නහුට රාත්‍රිච්ඡේද කෙතෙක් ද? යයි විචාළේය. **"චත්තාරෝ ඛෝ උපාලි මානත්ත චාරිකස්ස භික්ඛුනෝ රත්තිච්ඡේදා සහවාසෝ, විප්පවාසෝ, අනාරෝචනා, ඌනගණේ චරනන්ති"** යනුවෙන් 'උපාලියෙනි, සහවාසය, විප්පවාසය, අනාරෝචනය ඌනගණේ චරණ දෝෂය යැයි මානත පුරන භික්ෂුවට රාත්‍රිච්ඡේද සතරෙකි' යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.[1]

මෙහිදී පිරිවෙස් පුරන භික්ෂුවට වඩා මානත් පුරන භික්ෂුවට වැඩිවනුයේ එක් රාත්‍රිච්ඡේදයකි. එනම් ඌනගණේ චරණ දෝෂයයි. අනෙක් රාත්‍රිච්ඡේද තුන ම පිරිවෙස් පුරන භික්ෂුවට කියන ලද්දාවූ රාත්‍රිච්ඡේදයෝ ම ය. ඒවායේ විශේෂයක් නොමැත. ආරෝචනයෙහි දී **"දේවසිකං ආරෝචෙතබ්බං"** යන්න පමණක් විශේෂ වේ.

## ඌනගණ චරණය

**"ඌනේ ගණේති එත්ථ ගණෝති චත්තාරෝවා අතිරේකා වා, තස්මා සචෙපි තයෝ භික්ඛුහි සද්ධිං වසති රත්තිච්ඡේදෝ හෝති ඒව"**[2] යැයි 'ඌනේ ගණේ' යන මෙහි 'ගණේ' යනු සිව් නමක් හෝ ඊට වඩා වැඩිපුරය. ඉදින් භික්ෂූන් තුන් නමක් සමග වසයි නම්, රාත්‍රිච්ඡේදය සිදුවේමය යනුවෙන් අටුවාවෙහි සඳහන් වේ. එබැවින් එක් භික්ෂුවක් හෝ දෙතුන් නමක් හෝ සිටිනු ලබන තැන්වල මානත් පිරිමෙන් 'ඌනේ ගණේ චරණ' දෝෂයෙන් රාත්‍රිච්ඡේදය සිදුවේ. තව ද මානත්ත චාරික භික්ෂුවක් සභික්ඛුක (භික්ෂූන් සහිත)-ආවාසයකින් අභික්ඛුක (භික්ෂූන් නැති)-ආවාසයකට හෝ අනාවාසයකට ද සභික්ඛුක-අනාවාසයකින් අභික්ඛුක ආවාසයකට හෝ අනාවාසයකට අනතුරක් නොමැතිව සඞ්ඝයා නොමැතිව නොයා යුතුය. එසේ යෑමෙන් රාත්‍රිච්ඡේදයත් වත්තභේද දුකුලාවත් සිදුවේ.[3] අනතුරක් ඇති කල්හි සඞ්ඝයා නොමැතිව අභික්ඛුක-ආවාස හෝ අනාවාස යනාදියකට යෑමෙන් වත්තභේද

1. චුල්ලවග්ගපාළි 1, පාරිවාසිකක්ඛන්ධකය, බු.ජ.ත්‍රි. 188 පිට
2. සම.පා 4, 867 පිට හේ.මු.
3. චුල්ලවග්ගපාළි 1, පාරිවාසිකක්ඛන්ධකය, බු.ජ.ත්‍රි. 184 පිට

දුකුලාව සිදුනොවී රාත්‍රීච්ඡේදය පමණක් සිදු වේ. අනතුරක් නැත්තේ වුව ද වෙනත් භික්ෂූන් සිවු නමක් හෝ ඊට වඩා වැඩි ගණනක් හෝ සිටිනු ලබන වෙහෙරකට මානත්ත චාරික භික්ෂුව ආගන්තුක භික්ෂුවක් ලෙස යෑමෙන් දෝෂයක් නොවන බව **"මානත්ත චාරිකේන භික්ඛවේ භික්ඛුනා ආගන්තුකේන ආරෝචේතබ්බං"**[1] යන දේශනා පාලියෙන් ප්‍රකට වේ.

මානත්ත චාරික භික්ෂුවක් තමා පස්වැනි වී ප්‍රකෘති භික්ෂූන් සිවුනමක් ඇතිව යම් කිසි වෙහෙරක වත පුරනු ලබන කල්හි ප්‍රකෘති භික්ෂූන් සිවු නම අතුරෙන් එක් නමක් හෝ ගිහි වීමෙන්, සාමණේර වීමෙන්, උක්ඛිත්තකාදි තත්වයට පත් වීමෙන් වුව ද ඌනගණේ චරණ දෝෂයෙන් රාත්‍රීච්ඡේදය සිදු වන බැවින් එම වෙහෙරෙහි නොවසා සඞ්ඝයා ඇති වෙනත් වෙහෙරකට යා යුතුය. එසේම පළමු දවසේ මානත සමාදන් වී ආරෝචනය කොට දෙවන දවසේ ආරෝචනයට පෙර සාමණේර ආදි තත්වයට පෙරළීමෙන් මුල සිටම මානත පිරිය යුතුය. ආරෝචනයෙන් පසුව සාමණේර ආදි තත්වයකට පෙරලුනේ නම්, වෙනත් වෙහෙරකට ගොස් අනෙක් දින ගණන පිරිය යුතුය.

මානත් පුරන භික්ෂූන්ට තම තමාගේ නවකතරයා හැර (මානත් පුරන බාල භික්ෂුවක්) අනෙක් සියලු ම පාරිවාසික මූලායපටිකස්සනාහරාදි සියලුම භික්ෂූන් ප්‍රකෘති භික්ෂූහු වෙත්. පිරිවෙස් පුරන, මූලායපටිකස්සනාරහාදීන්ට ද එලෙස ම ය.[2] ඒ ඒ වත් පුරන භික්ෂූන්ට තම තමාගේ සමාන වත් පුරන භික්ෂූන්ගේ වත් පිළිවෙත් ඉවසීමට පුළුවන. විසභාග-වත් පුරන භික්ෂූන්ගේ වත්පිළිවෙත් ඉවසීමට පුළුවන් කමක් නැත. මානත් පුරන භික්ෂුවට පිරිවෙස් පුරන භික්ෂුවත් පිරිවෙස් පුරන භික්ෂුවට මානත් පුරන භික්ෂුවත් ප්‍රකෘති වන බැවින් පිරිවෙස් පුරන සිවු නමක් සමඟ හෝ පිරිවෙස් පුරන එක නමක් හෝ සිවුවැනි කොට මානත් පිරිමෙන් දෝෂයක් නොවන බවක් පෙනේ. **"පාරිවාසික චතුත්ථෝ ච භික්ඛවේ පරිවාසං දදෙය්‍ය, මූලාය පටිකස්සෙය්‍ය, මානත්තං දදෙය්‍ය, තබ්බීසෝ අබ්භෙය්‍ය, අකම්මං න ච කරණීයං"** යන දේශනා පාලියෙන් වුව ද පිරිවෙස්, මානත් දෙනු ලබන විනයකර්ම සඳහා ගණ පූරණය නොකළ යුතු බව කියා ඇත. එසේ වුවත්

1. චුල්ලවග්ගපාලි **1**, පාරිවාසිකක්ඛන්ධකය, බු.ජ.ත්‍රි. **184** පිට
2. සම.පා **4**, **866 - 67** පිට හේ.මු.

ගරු තන්හි පිහිටා පිරිවෙස් පුරනු ලබන භික්ෂූන් සිවු නමක් ළඟ හෝ පිරිවෙස් පුරන එක් භික්ෂුවක් ගණ පූරණය කොට හෝ නොකිරීම වඩාත් යුතුය.

මානත සමාදන් වීම **"මානත්තං සමාදියාමි වත්තං සමාදියාමි"** යනුවෙන් ද නික්ෂෙපය **"මානත්තං නික්ඛිපාමි වත්තං නික්ඛිපාමි"** යනුවෙන් ද එක් භික්ෂුවකගේ සමීපයේ වුව ද සිදුකළ හැක. මානත සමාදන් වීම සඞ්ඝයාගේ සමීපයෙහිම සිදුකළ යුතු බවක් කියා නොමැත. පාරිවාසිකක්ඛන්ධකයෙහි ද **"එවංච පන භික්ඛවේ සමාදාතබ්බං. තේන මානත්තචාරිකේන භික්ඛුනා ඒකං භික්ඛුං උපසංකමිත්වා ඒකංසං උත්තරාසංගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා ඒවමස්ස වචනීයෝ, මානත්තං සමාදියාමීති සමාදින්නං හෝති මානත්තං. වත්තං සමාදියාමිති සමාදින්නං හෝති මානත්තං."**[1] යනුවෙන් එක් භික්ෂුවක් වෙත එළඹ සමාදන් වන ආකාරය කියා ඇත. වජිරබුද්ධි ටීකාවෙහි ද **"පඨමං ආදින්න වත්තං ඒකස්ස සන්තිකේ යථා නික්ඛිපිතුං වට්ටති. තථා සමාදීතුම්පි වට්ටතීති පෝරාණ ගණ්ඨිපදේ"**[2] යනුවෙන් පළමුව වත (මානත) ගන්නා ලද බැවින්, යම්සේ එක් භික්ෂුවකගේ සමීපයේ නික්ෂේප කිරිමට සුදුසු ද එලෙස සමාදන් වීමට ද සුදුසු යැයි පුරාණ ගණ්ඨිපදයෙහි සඳහන් වන බව කියා ඇත. එබැවින් මානත එක් භික්ෂුවකගේ සමීපයේ වුව ද සමාදන් වීමට හැකියාව ඇති බව දත යුතුය.

මානත ආරෝචනය ද පළමුව සඞ්ඝයාට ම සිදුකළ යුතුය කියා නියමයක් නොමැත. ප්‍රකෘති භික්ෂූන් සිවු නමක් සිටින විහාරයක මානත පුරණ භික්ෂුව වත සමාදන් වී එක් එක් භික්ෂුවක් වෙත වෙන වෙනම ආරෝචනය සිදුකිරීමෙන් සිවුදෙනාට ම ආරෝචනකෘත්‍යය සිදු කරයි නම්, එය සඞ්ඝයාට ආරෝචනය කළා බඳු ම ය. ආරෝචනය මනාව සිද්ධ වේ. භික්ෂූන් සිවු නමක් තබාගෙන සඞ්ඝපදය පරාමර්ශණය කරමින් මානත පුරන දින හයේ ම පළමුව සඞ්ඝයාට ආරෝචන සිදු කළ යුතු නම්, අටුවාවෙහි නික්ඛිත්ත ක්‍රමයට විහාර උපචාරයෙන් බැහැර මානත පුරන භික්ෂුව, අරුණ නංවා උදෑසන විහාරයට එන විට **"යං පඨමං පස්සති තස්ස ආරෝචෙත්වා නික්ඛිපිතබ්බං"**[3] යනුවෙන් යම්

1. චුල්ලවග්ගපාලි **1**, පාරිවාසිකක්ඛන්ධකය, බු.ජ.ත්‍රි. **188** පිට
2. වජිරබුද්ධි-ටීකා, පාරිවාසිකක්ඛන්ධකය, ඡට්ඨසංගායනා,
3. සම.පා, **4**, **868** පිට හේ.මු.

භික්ෂුවක් පළමුව දකී ද ඔහුට ආරෝචනය කොට නික්ෂේප කළ යුතු යැයි කියනු නොලැබේ. එලෙස කියා ඇති බැවින් වෙන වෙන ම ආරෝචනය කිරිමෙන් වුව ද මානත්තාරෝචනය මනාව සිද්ධ වන බව දත යුතුය.

# 'දේවසිකං ආරෝචේතබ්බං' යන්න

යම්කිසි වෙහෙරක පිරිවෙස් පුරන භික්ෂුවක් වත සමාදන් වී එක් වරක් ආරෝචනය කිරීමෙන් නැවත එම වෙහෙරෙහි සිටින අනෙක් භික්ෂූන්ට ආරෝචනය සිදුකළ යුතු බවක් නොමැත. ආගන්තුකාදීන්ට පමණක් ආරෝචනය සිදුකළ යුතුය. මානත සමාදන් වන භික්ෂුවට **"දේවසිකං ආරෝචෙතබ්බං"**[1] යනුවෙන් කියා ඇති බැවින් දින හයේම ආරෝචනකෘත්‍යය සිදුකළ යුතුය. එසේ නොමැති නම්, රාත්‍රිච්ඡේදය සිදු වේ.

වෙහෙරෙහි මානත පුරන භික්ෂුව එදවස උපචාර සීමාව තුළ සිටින සියලු ම භික්ෂූන්ට වත ආරෝචනය කළ යුතුය. මානත සමාදන් වන දිනයේ ආරෝචනය සිදු කොට අරුණ නංවා වත නික්ෂේප කරන්නේ නම්, ආරෝචන කෘත්‍යය සිදු කොට ම වත නික්ෂේප කළ යුතුය. ආරෝචන කෘත්‍යය සිදු නොකොට වත නික්ෂේප කිරීමෙන් අරුණ නැගී අභිනව දිනයකට පැමිණි බැවින් එදවස උපචාර සීමාව තුළ සිටින සියලු ම භික්ෂූන්ට සිදු කළ යුතු ආරෝචන කෘත්‍යය ඉතිරිව තිබේ. එම භික්ෂුන් අතුරෙන් එක නමක් හෝ එදවස නොඑනු පිණිස වෙහෙරෙන් නික්මී ගියහොත් මානත පුරන භික්ෂුව එදවසට අදාළ ආරෝචන කෘත්‍යය නොඑනු අදහසින් බැහැර ගිය භික්ෂුවට සිදු නොකළ බැවින් රාත්‍රිච්ඡේදය සිදුවන බව දත යුතුය. විනයාලඞ්කාර-ටීකාවෙහි මෙකරුණ අවධාරණයෙන් යුතුව කියා ඇත. එනම් **"මානත්ත චරණ කාලේ පන සමාදානයේ ආරොචිතේපි නික්ඛිපනේ අවස්සං ආරෝචේ තබ්බමේව. කසමා? දිවසන්තරභාවතෝ. දේවසිකං ආරෝචේතබ්බන්ති හි වුත්තං. ඒවං සන්තේපි සායං සමාදාන කාලේ ආරෝචෙස්සති, තස්මා නික්ඛිපනේ ආරෝචනකිච්චං නත්ථීති චේ? න, සායං සමාදාන කාලේ ඒතේ භික්ඛූ ආගච්ඡිස්සන්තිපි, න ආගච්ඡිස්සන්තිපි, අනාගතානං කථං ආරෝචේතුං ලභිස්සති, අනාරෝචනේ ච සති රත්තිච්ඡේදෝ සියා"**[2] යනුවෙනි. නැවත එදවස පැමිණේ නම්, හෝ වෙහෙරෙන් බැහැර නොයයි නම් එබඳු අවස්ථාවන්හීදී සවස් භාගයෙහි සමාදන් වී ආරෝචනය සිදු කරන බැවින් රාත්‍රිච්ඡේදය සිදු නොවේ.

1. චුල්ලවග්ගපාළි **1**, පාරිවාසිකක්ඛන්ධකය, බු.ජ.ත්‍රි. **184** පිට
2. විනයාලංකාර-ටීකා, ගරුකාපත්ති වුට්ඨාන විනිච්ඡය කථා, ඡට්ඨසංගායනා

# නාම සම්මුති

විනයකර්ම සිදු කිරීමෙහි දී විශේෂයෙන් සැලකිය යුතු තවත් කරුණක් වන්නේ නාම-සම්මුතිය දීම යි. මෙය විශේෂයෙන් උපසම්පද විනයකර්මයෙහි දී සිදු කරණු ලබන්නකි. පිරිපුන් විසිවස් ඇති සාමණේරයකු උපසම්පද කරණු ලබන විට උපසම්පද කර්මවාක්‍යය කීමට පෙර ඔහුට නාමසම්මුතියක් දෙනු ඇත. එනම්, 'නාග' නමින් ඔබව හඳුන්වනු ඇතැ'යි කල් ඇති වම ඔහුටත් සඞ්ඝයාටත් දන්වා කර්මවාක්‍යයේ දී 'අයං නාගෝ' යනාදි ක්‍රමයෙන් නාගපදය ඇතුළත් කොට අනුශ්‍රාවණය කිරීම යි. මෙසේ නාමසම්මුතියක් දිය යුත්තේ ඔහුට අදාළව පවතින ස්වකීය නාමය නොමැතිව වෙනත් නාමයක් ගනු ලබන විට දීය. ස්වකීය නාමය නොමැතිව නාම-සම්මුතියක් ද නොමැතිව 'අයං නාගෝ' යනාදි ක්‍රමයෙන් නාගපදය ඇතුළත් කොට අනුශ්‍රාවණය කිරීමෙන් කර්මය අසිද්ධියට පත් වනු ඇත. එලෙස අසිද්ධියට පත් වනුයේ ගත්තා වූ නාමයට වස්තුභූත වූ පුද්ගලයාගේ සිටීම එහි නැති බැවිනි. එක් උපසම්පදාපේක්ෂකයකුට, නම් බොහොමයක් ඇති විට ඒ අතුරෙන් එක් නමක් පමණක් ගෙන අනුශ්‍රාවණාදිය සිදු කළ හැකිය. ඉහත සඳහන් කරුණු සම්බන්ධව විමතිවිනෝදනී-ටීකාවෙහි මෙලෙස සඳහන් වේ.

**'උපසම්පදාපෙක්ඛස්ස පන යථා සකං නාමං විනා අඤ්ඤේන නාමේන අනුසාවිතේ කම්මං කුප්පති, සෝ අනුපසම්පන්නෝ'ව හෝති. තත්‍ථ ඨිතෝ අඤ්ඤෝ අනුපසම්පන්නෝ විය ගහිතනාමස්ස වත්‍ථුපුග්ගලස්ස තත්‍ථ අභාවා, ඒතස්ස ච නාමස්ස අනුස්සාවනාය අවුත්තත්තා. තස්මා උපසම්පදාපෙක්ඛස්ස පකතිනාමං පරිවත්තෙත්වා අනුපුබ්බේන නාගාදි නාමේන අනුස්සාවේතුකාමේන පටිගච්චේ 'ත්‍වං නාගෝ'ති ආදිනා විඤ්ඤාපෙත්වා අනුසාසනඅන්තරායිකධම්මපුච්ඡනක්ඛණේසුපි තස්ස ච සඞ්ඝස්ස ච යථා පාකටං හෝති, තථා පකාසෙත්වා'ව නාගාදිනාමේන අනුස්සාවේතබ්බං. ඒකස්ස බහූනි නාමානි හොන්ති, තෙසු ඒකං ගහේතුං වට්ටති.'**[1] යනුවෙනි. විනයාලඞ්කාර-ටීකාවේ උපසම්පදා-විනිශ්චයෙහි ද මෙය සඳහන් වේ.

1. විමතිවිනොදනී-ටීකා, මහාඛන්ධකවණ්ණනා, ගමිකාදිනිස්සයවත්‍ථුකථාවණ්ණනා, ඡට්ඨසඞ්ගායනා

එසේම මුල දී යම් නාම-සම්මුතියක් සිදු කොට පසුව එම නාමය පරාමර්ශනය කරමින් ඤත්තිය තබයි නම්, එයම අනුශ්‍රාවණයෙහි දී ද ගත යුතුය. ඤත්තියෙහි දී ගත් නාමය අනුශ්‍රාවණයෙහි දී නොගෙන වෙනත් නාමයකින් අනුශ්‍රාවණය කිරීමෙන් ව්‍යඤ්ජනය භින්න වන බැවින් කර්මය සිද්ධියට පත් නොවේ. අර්ථ වශයෙනුත් ව්‍යඤ්ජන වශයෙනුත් නොබිඳෙන ලෙස ඤත්තිය තබන්නේ යම් සේ ද එලෙසම අනුශ්‍රාවණය ද තැබිය යුතුය. මෙකරුණ ද විමතිවිනෝදනී-ටීකාවෙහි මෙලෙස දක්වා ඇත.

**'යං පන උපසම්පදපෙක්ඛඋපජ්ඣායානං ඒකත්‍ථ ගහිතනාමං, තදේව ඤත්තියා, සබ්බත්‍ථ අනුස්සාවනාසු ච ගහේතබ්බං. ගහිතෝ හි අඤ්ඤස්මිං ගහිතේ ව්‍යඤ්ජනං භින්නං නාම හෝති, කම්මං විපජ්ජති. අත්‍ථතෝ හි ව්‍යඤ්ජනතෝ ච අභින්නා ඒව ඤත්ති, අනුස්සාවනා ච වට්ටන්ති.'**[1] යනුවෙනි.

උපසම්පදාවෙහි දී සිදු කරනු ලබන නාම-සම්මුතියක් වත් මානත් කථාවට ඇඳා ගත්තේ යම් භික්ෂුවකට පිරිවෙසක් හෝ මානතක් හෝ මූලාය පටිකස්සනයක් හෝ අබ්භානයක් හෝ සිදු කරනු ලබන විට දී ත් ඉහත කී පරිදි ඔහුගේ ස්වකීය නාමය ගෙන වත් මානත් දීම් ආදිය සිදු කළ යුතු බව දැක්වීමටය. පවතින නම කර්මවාක්‍යයට ඇතුළත් කොට කීමට අපහසු එකක් නම්, කීමට පහසු වෙනත් නාමයක් ගෙන කර්මවාක්‍යය කිව යුතුය. වෙනත් නාමයක් ගැනීමෙහි දී එම නාමයෙන් ඔහු හඳුන්වන බව මුල දීම සම්මත කර ගත යුතුය. එම නාම-සම්මුතිය වත් මානත් දීමෙහි දී අපලෝකනකර්මයකින් කිරීම වඩාත් සුදුසුය. අර්ථ වශයෙන්වත් ව්‍යඤ්ජන වශයෙන්වත් වෙනස් නොකොට කර්මවාක්‍යය කිව යුතු අතර මෙම වත් මානත් දීම් ආදි වූ කර්මවාක්‍ය නමුත් අර්ථ වශයෙන් හෝ ව්‍යඤ්ජන වශයෙන් වෙනස් කොට කීමෙහි දී අසිද්ධියට පත් වන බව මනාව දැන සිටිය යුතුය.

1. විමතිවිනොදනී-ටීකා, මහාඛන්ධකවණ්ණනා, ගමිකාදිනිස්සයවත්‍ථුකථාවණ්ණනා, ඡට්ඨසඞ්ගායනා

# වැදගත් කරුණක්

මෙකල ඇතැම් භික්ෂුනට තමන් පිරුවා වූ පිරිවෙස් මානත් ආදිය ගැන බොහෝ ගැටලු ඇත. ඇතැම් භික්ෂුන් පිරිවෙස් මානත් පුරා අබ්භාන කර්ම සිදු කොට අහවර වී කලක් ගත වූ පසු තමන් පිරුවා වූ පිරිවෙස් ආදිය අසිද්ධ යැයි දැන ගනි. එවිට බොහෝ කලක් ගත වීමෙන් එම භික්ෂූන්ට මුලින් ගත් පිරිවෙස් වල දින ගණන ද පිරිවෙස කිනම් පිරිවෙසක් ද යන්න පවා අමතක වේ. ඇතැම් භික්ෂූන් පිරිවෙසේදී අන්තරාපත්තියට පැමිණ ලජ්ජාවෙන් මූලායපටිකස්සනාදිය සිදු නොකොට මානත් පුරා අබ්භානාදියත් සිදු කොට කලක් ගත වී පසුව ලජ්ජී ධර්මයේ පිහිටා පිළියම් කරගැනීමට යෑමෙන් අන්තරාපත්තිය පිළිසන් වූයේ ද නොවූයේ ද කියා හෝ අන්තරාපත්තියට පත් වූයේ පිරිවෙසේදී ද මානතෙහිදී ද කියා හෝ අමතක වීමෙන් පිරිවෙස් මානත් ගැන පැටලිලි සහගත තත්වයක් ඇතිවෙයි. ඒවා ගැන ඇතැමුන්ගෙන් විචාරණ ලබනු විට පෙලේ එබඳු සිදුවීම් වලට කර්ම වාක්‍ය කියා නොමැත. එබැවින් පිළියම් කිරීමට නොපුළුවන යැයි පැවසීමෙන් එම භික්ෂූන් කලබල වී අනුපසම්පන්න ආදි තත්වයන්ට පවා පෙරළීමට පුළුවන. එබැවින් එබඳු පැටළුම් සහගත වූ වත් මානත් ඇති භික්ෂූන් ඉක්මන් නොවී විනයධර භික්ෂූන් කරා ගොස් සියලු ප්‍රවෘත්තිය පවසා නිවැරදිව කර්ම වාක්‍ය සකස් කොට පිරිවෙස්, මානත් ගෙන ඒවා පුරා අබ්භාන කර්ම කොට සුද්ධියේ පිහිටිය යුතුය. පෙලේ එබඳු ආපත්ති ක්‍රම වලට කර්ම වාක්‍ය නැතත් කර්ම වාක්‍ය සකසා පිරිවෙස් මානත් දීම් ආදිය සිදු කිරීමෙන් ඇවැත් වලින් නැගී සිටීම සිදුවන බව සමුච්චයක්ඛන්ධක-අටුවාවෙහි එන “**ආපත්ති නාම පටිච්ඡන්නා වා හෝතු, අපටිච්ඡන්නා වා හෝතු, සමකළ‍ඌනතරඅතිරේකපටිච්ඡන්නා වා. විනයධරස්ස කම්මවාචං යෝජේතුං සමත්‍ථභාවෝයේවෙත්‍ථ පමාණං. තස්මා යා අතිරේකපටිච්ඡන්නා හෝති, තං මූලාපත්තිං කත්‍වා තත්‍ථ ඉතරං සමෝධාය පරිවාසෝ දාතබ්බෝ**” යන පාඨයෙන් එය මනාව පැහැදිලි වේ.

මෙතෙකින් දක්වන ලද්දේ පිරිවෙස් මානත් පිරීමේදී දත යුතු කරුණු පිළිබඳ විස්තර විවරණයකි. මෙම විනය ග්‍රන්ථයෙන් පිරිවෙස්, මානත් ගැන බොහෝ කරුණු දත හැකිය. මෙහි නොවැටහෙන්නා වූ කරුණු ද තිබිය හැකිය. දිගින් දිගට සිදු කර ගෙන ආවා වූ ක්‍රමයට වෙනස් අයුරින් කීවා වූ කරුණු ද තිබිය හැකිය. මෙහි ඇති සෑම කරුණක් ම පාහේ පෙළ- අටුවා-ටීකාවල ඇති කරුණු බව මුල දී ම අපි සඳහන් කළෙමු. ඇතැම් කරුණු පෙළ-අටුවා-ටීකාවල ඇති කරුණු අනුසාරයෙන් දක්වා ඇති ඒවා ය. අටුවා-ටීකාවල සඳහන්ව ඇති කරුණු ගැන කිය යුත්තක් නොමැත. ඒවා කියන ලද්දේ අප වැනි මඳ නුවණ ඇත්තන් නොව තෙවළා දහමෙහි හසල දැනීමක් ඇති මහ උතුමන් විසිනි. අටුවා, ටීකා ග්‍රන්ථානුසාරයෙන් කියන ලද කරුණු අදාළ ඛන්ධක සහ එම අටුවා, ටීකා හොඳින් විමසිලිමත්ව කියවා බලා නොගැළපෙන දෙයක් ඇතොත් බැහැර කළ යුතුය. මෙයින් කවරෙකුට නමුත් පිරිවෙස්, මානත් ගැන දැනුමක් ලබා ගැනීමට හෝ පිරිසිදුව වත්, මානත් පුරා ශුද්ධියෙහි පිහිටීමට හෝ උපකාරයක් වූයේ නම්, එයින් ම අපගේ අදහස සපිරෙනු ඇත.

# චතුර්විධ කර්ම

භාග්‍යවතුන් වහන්සේ විසින් විනය පාළියෙහි පනවන ලද චතුර්විධ විනය කර්ම විග්‍රහ කිරීමේදී ඒවා අධිකරණ යටතේ විමසා බැලේ. භික්ෂූ විනයෙහි වූ කලි සමථයන්ගෙන් විසඳිය යුතු හෙවත් සංසිඳවිය යුතු යමක් වේ ද එය අධිකරණ යැයි කියනු ලැබේ. [1] සම්මුඛාවිනය, සතිවියන, අමූළ්හවිනය, පටිඤ්ඤාතකරණ, යෙභුය්‍යසිකා, තස්සපාපියය්‍යසිකා, තිණවත්ථාරක යනුවෙන් සමථයන් සප්තවිධ වේ.

එකී සමථයන්ගෙන් සංසිඳවිය යුතු යනාර්ථයෙහි එන මෙම අධිකරණ සිව්වැදෑරුම් වේ. [2]

එනම්: -

1) විවාදධිකරණ

2) අනුවාදාධිකරණ

3) ආපත්තාධිකරණ

4) කිච්චාධිකරණ

යනුවෙනි.

## (1) විවාදධිකරණ

කිසියම් කරුණක් මුල්කරගෙන භික්ෂූන් අතර ඇතිවන යම් කලහයක්, විවාදයක්, අරගලයක් වේ ද එය විවාදාධිකරණයයි. මෙලෙස කලහ, විවාද, අරගල හටගන්නේ 'ධම්ම - අධම්ම, විනය - අවිනය, තථාගත භාසිත - තථාගත අභාසිත, තථාගත ආචිණ්ණ (පුරුදු කළ) - තථාගත අනාචිණ්ණ (පුරුදු නොකළ), තථාගත පඤ්ඤත්ති - තථාගත අපඤ්ඤත්ති, ආපත්ති - අනාපත්ති, ලහුකාපත්ති - ගරුකාපත්ති, සාවසේසාපත්ති - අනවසේසාපත්ති, දුට්ඨුල්ලාපත්ති - අදුට්ඨුල්ලාපත්ති' වශයෙන් දැක්වෙන කරුණු 18 අරභයා ය. මෙකී කරුණු දහඅටට අටලොස් භේදකර වස්තු යයි ව්‍යවහාර කෙරේ. අටලොස් භේදකර වස්තු

1. සමථෙහි අධිකරණීයතාය අධිකරණං, සම.පා, සමථක්ඛන්ධක, **885** පිට හේ.මු.
2. චුල්ලවග්ගපාලි **1**, බු.ජ.ත්‍රි. **376** පිට

අතුරින් එකක් හෝ කිහිපයක් හෝ නිසා හටගත් විවාදාධිකරණය සංසිඳුවීම සම්මුඛාවිනය යෙභුය්‍යසිකාව යන සමථ දෙකින් සිදු කෙරේ.

## (2) අනුවාදාධිකරණ

භික්ෂුවකට යම් විපත්තියක් (ඇවැතක්) සම්බන්ධව තවත් භික්ෂුවක් චෝදනාවක්, පුනපුනා දොස් නැගීමක්, අවනත කිරීමක් සිදුකෙරේ ද එය අනුවාදාධිකරණයයි. මෙලෙස අනුවාදාධිකරණයට හේතුවන විපත්ති සතරකි.

ඒවා නම් :-

1. සීල විපත්ති
2. ආචාර විපත්ති
3. දිට්ඨි විපත්ති
4. ආජීව විපත්ති[1]

යනුවෙනි.

මෙහි සීලවිපත්ති ආදී විපත්ති අතුරින් යම් විපත්තියකින් භික්ෂුවක් තවත් භික්ෂුවකට කරන චෝදනාව හෙවත් අනුවාදාධිකරණය සංසිඳුවීම සම්මුඛාවිනය, සතිවිනය, අමූළ්හවිනය, තස්සපාපිය්‍යසිකා යන සමථ සතරෙන් සිදු කෙරේ.

## (3) ආපත්තාධිකරණ

භික්ෂුවක් ආපත්තිස්කන්ධ පස හෝ සත අතුරින් යම් ආපත්තිස්කන්ධයකට අයත් ආපත්තියකට පැමිණීම ආපත්තාධිකරණ නම් වේ.[2] පස්විධ වූ ආපත්තිස්කන්ධ නම් පාරාජිකා, සංඝාදිසේස, පාචිත්තිය, පාටිදේසනීය, දුක්කට වන අතර සත්විධ වූ ආපත්තිස්කන්ධ නම් පාරාජිකා, සංඝාදිසේස, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදේසනීය, දුක්කට, දුබ්භාසිත නම්. මෙහි යම් ආපත්තිස්කන්ධයකට අයත් ඇවැතකට පැමිණීම හෙවත් ආපත්තාධිකරණය සංසිඳවීම සම්මුඛාවිනය, පටිඤ්ඤාතකරණ, තිණවත්ථාරක යන සමථ තුනෙන් සිදු කෙරේ.

1. චු.ව.පා. 1, සමථක්ඛන්ධ, 376 පිට
2. චු.ව.පා. 1, සමථක්ඛන්ධ, 378 පිට

## (4) කිච්චාධිකරණ

සංඝයාගේ කළ යුතු යම් කාර්යයක් හෙවත් කර්මයක් (කම්ම) වේ ද එය '**කිච්චාධිකරණය**'යි. සංඝයාට අයත් සංඝයා විසින් කළ යුතු එබඳු කාර්ය සතරකි.

එනම් :-

1. අපලෝකන කම්ම
2. ඤත්ති කම්ම
3. ඤත්තිදුතිය කම්ම
4. ඤත්තිචතුත්ථ කම්ම[1]

වශයෙනි.

ඉහත දක්වූ සංඝයා විසින් කළ යුතු අපලෝකනාදී චතුර්විධ කර්ම අතුරින් යම් කර්මයක් සිදුකිරීමට ඉදිරිපත් වීම හෙවත් කිච්චාධිකරණය සංසිඳුවීම, සම්මුඛාවිනය නමැති සමථයෙන් සිදු කෙරේ. ඉහත දැක්වූ විවාදාධිකරණ ආදී සතර, අධිකරණ නාමයෙන් විනයෙහි දක්වා තිබුණ ද ඒවා සපුරා අකුසල යැයි ඉන් ගම්‍ය නොවේ. ඇතැම් අධිකරණ ඇතැම් අවස්ථාවල කුසල පාර්ශ්වයෙහි පැවැතීම මීට හේතුවයි. ඒ අනුව විවාදාධිකරණ, අනුවාදාධිකරණ, කිච්චාධිකරණ යන තුන ස්ථානෝචිතව කුසල හෝ අකුසල හෝ අව්‍යාකත හෝ විය හැකිය. ආපත්තාධිකරණ කිසි විටෙකත් කුසල නොවන අතර එය අකුසල හෝ අව්‍යාකත වේ.[2]

1. **අපලෝකන කම්ම** :- කිච්චාධිකරණයෙහි එන අපලෝකන යනු රුචිය හෙවත් කැමැත්ත විචාරීමයි.[3] සීමස්ථක සංඝයා අත්පසට කැඳවා හෝ ගණපූරක භික්ෂූන් තබා සෙසු භික්ෂූන් රුචි පරිදි සීමාවෙන් බැහැර කොට (සෝධනය කොට) හෝ ඡන්දයට සුදුසු වූවන්ගේ ඡන්දය ගෙනවුත් සමගි සංඝයාගේ අනුමැතිය පිණිස තුන්වරක් ශ්‍රාවණය කරවා (අස්සවා / දන්වා) කරනු ලබන කර්මය 'අපලෝකන කර්ම' බව විනයට්ඨකථාවෙහි දක්වේ.[4] පාලිමුත්තක විනයවිනිච්ඡයෙහි ද එය

---

1. චු.ව.පා. 1, සමථක්ඛන්ධ **378** පිට
2. චු.ව.පා. 1, සමථක්ඛන්ධකය, **386 - 90** පිට
3. තත්ථ අපලෝකීයතේ ආයාචීයතේ අපලෝකනං ...... 'විනයා. ටීකා, කම්මකම්මවිනිච්ඡය **223** පිට,
4. අපලෝකනකම්මං නාම සීමට්ඨකසංඝං සෝධෙත්වා ඡන්දාරහානං ඡන්දං ආහරිත්වා සමග්ගස්ස සංඝස්ස අනුමතිය තික්ඛත්තුං සාවෙත්වා කත්තබ්බං කම්මං ......
සම.පා **IV**, කම්මවග්ග, **1039** පිට හේ.මු )

එලෙස ම දක්වා ඇත.[1] මෙහිදී සිදුකෙරෙන ශ්‍රාවණය හෙවත් ඇස්සවීම සඳහා භාවිත කෙරෙන ශ්‍රාවණ වාක්‍යයක් විනය පාලියෙහි දක්වා නොමැති වුවත් අටුවාවෙහි '**සංඝං භන්තේ, පුච්ඡාමි ....**'[2] යනාදී ක්‍රමයෙන් ඒ ඒ කාරණානුකූලව එය දක්වා ඇත. අපලෝකන කර්මයට ඤත්තියක් හෝ අනුශ්‍රාවණයක් හෝ නොයෙදෙන බැවින් මුලින් දැක්වූ එම වාක්‍යයට ශ්‍රාවණ වාක්‍යය යැයි ව්‍යවහාර කෙරේ.

අනුශ්‍රාවණය යනුවෙන් දැක්වෙන්නේ ඤත්තියට අනුව ඇස්සවීමයි. එනම් ඤත්තියෙන් කියවුණු අදහස ම '**සුණාතු මේ භන්තේ, සංඝො ......**' යනාදී ක්‍රමයෙන් කියා ඤත්තියෙහි මෙන් අගට '**.......එසා ඤත්ති**' හෝ ...... '**උපෝසථං කරෙය්‍ය**' හෝ '**..... පවාරෙය්‍ය**' යැයි නොකියා '**......යස්සායස්මතො ඛමති .......... සො භාසෙය්‍ය**' යන්න යොදා සංඝ අනුමැතිය විචාරීම සඳහා සිදු කෙරෙන ඇස්සවීමයි. මෙලෙස මෙම ඇස්සවීම පාලි වාක්‍යානුසාරයෙන්ම සිදුකෙරෙන බැවින් එම වාක්‍යය ම අනුශ්‍රාවණය යැයි ද කර්මවාක්‍යය යැයි ද ව්‍යවහාර කෙරේ. අපලෝකන කර්මය අවස්ථා පහක දී සිදු කරණු ලැබේ.

ඒවා නම් :-

1. නිස්සාරණ
2. ඕසාරණ
3. භණ්ඩුකම්ම
4. බ්‍රහ්මදණ්ඩන
5. කම්මලක්ඛණ[3]

වශයෙනි.

කණ්ටක (තෙරුවන් කෙරෙහි වරදවා පිළිපන්) සාමණේරවරයාගේ දණ්ඩකර්ම නාසනය '**නිස්සාරණ**' නම් වේ.[4] එම සාමණේරයා තමා කළ වරද පිළිගෙන ආයති සංවරයෙහි පිහිටීමෙන් පසු ඔහු නැවත සංඝයා වෙත ඇතුළත් කරවා ගැනීම '**ඕසාරණය**'යි. පැවිදිවීමට අපේක්ෂිත කිසියම් කුලපුත්‍රයෙකුගේ කේසච්ඡේදනය සඳහා

---

1. පාලිමුත්තක විනයවිනිච්ඡය, කම්මාකම්මවිනිච්ඡය කථා **356** පිට
2. සම.පා. කම්මවග්ග, **1045** පිට හේ.මු.
3. අපලෝකනකම්මං කතමානි පඤ්ච ඨානානි ගච්ඡති: ඔසාරණං, නිස්සාරණං, භණ්ඩුකම්මං, බ්‍රහ්මදණ්ඩං, කම්මලක්ඛනඤ්ඤේව පඤ්චමං., පරිවාරපාලි, **II** බු.ජ.ත්‍රි. **306** පිට.
4. කණ්ටකසාමණේරස්ස දණ්ඩකම්මනාසනා නිස්සාරණාති වේදිතබ්බා, සම.පා. **IV**, කම්මවග්ග, **1045** පිට හේ.මු.

සංඝයාගේ අනුමැතිය ලබාගැනීම '**හණ්ඩුකම්ම**' නම්. කිසියම් භික්ෂුවක් සංඝයාට නපුරු වචනවලින් බැණවැදීමේ දී සමගි සංඝයා විසින් ඔහු නිවැරදි මගට යොමුකරලීමේ අදහසින් ඔහු හා ඇසුර වර්ජනය කිරීම් වශයෙන් කරනු ලබන කර්මය '**බ්‍රහ්මදණ්ඩනය**' නම්. භාග්‍යවතුන් වහන්සේ භික්ඛුනී ඛන්ධකයෙහි යම් අවන්දනීය (නොවැඳිය යුතු) කර්මයක් අනුදැන වදාළහු ද එය '**කම්මලක්ඛන**' නම් වේ. භික්ෂුණී සංඝයා මුල් කරගෙන මෙම කර්මලක්ෂණය පනවා වදාළ නමුදු මෙය භික්ෂු සංඝයාට ද අදාළ වේ.[1] අපලෝකන කර්මය මෙම අවස්ථා පසෙහි සිදු කරනු ලැබේ. අපලෝකන කර්මයට අයත් මෙම කර්ම පසෙන් ඕසාරණ, නිස්සාරණ, හණ්ඩුකම්ම, බ්‍රහ්මදණ්ඩන යන සතර වනාහි ගණයා (උපසපන් භික්ෂූන් තිදෙනෙකු) විසින් හෝ පුද්ගලයකු (එක් උපසපන් භික්ෂුවක) විසින් හෝ නොකරනු ලබන, සංඝයා (උපසපන් භික්ෂූන් සතර නමක්) විසින් ම කරනු ලබන කර්මයෝ ය. අපලෝකන විනය කර්මයට අයත් කම්මලක්ඛනයට සම්බන්ධ ඇතැම් කර්ම සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයාට හෝ අවස්ථානුකූලව කළ හැක.[2]

ඊට අමතරව ඤත්ති දුතිය කර්මවාක්‍යයෙන් අනුදැන වදාළා වූ ලහු කර්ම වන තෙරස සම්මුති ද අපලෝකන යෙන් සිදු කළ හැක. එම තෙරස සම්මුති නම්:

1. භත්තුද්දේසක
2. සේනාසනග්ගාහාපක
3. භණ්ඩාගාරික
4. චීවරපටිග්ගාහක
5. චීවරභාජක
6. යාගුභාජක
7. ඵලභාජක
8. ඛජ්ජභාජක
9. අප්පමත්තකවිස්සජ්ජක

---

1. සම.පා **IV**, කම්මවග්ග, **1046-47** පිට හේ.මු.
2. වජිරබුද්ධිටීකා අපලෝකනකම්මකථා, ඡට්ඨසංගායනා සංස්. **273** පිට

10. සාධියග්ගාහාපක
11. පත්තග්ගාහාපක
12. ආරාමිකපේසක
13. සාමණේරපේසක

වශයෙනි.

**2. ඤත්ති කම්ම** :- ඤත්ති කම්ම යනු සීමස්ථක සංඝයා අත්පසට කැඳවා හෝ ගණපූරක භික්ෂූන් තබා සෙසු භික්ෂූන් රුචිය පරිදි සීමාවෙන් බැහැර කොට (සෝධනය කොට) හෝ ඡන්දයට සුදුසු වූවන්ගේ ඡන්දය ගෙනවුත් සමගි සංඝයාගේ අනුමැතිය පිණිස එක් ඤත්තියකින් කළ යුතු කර්මයයි.[1] විනයාලංකාර ටීකාවෙහි ඤත්තියෙන් කළ යුතු කර්මය ඤත්ති කර්ම නම් වේ යැයි දක්වේ. එනම් අනුසාවනය නොකොට පිරිසිදු ඤත්තියෙන් ම කළ යුතු කර්මයයි.[2] ඤත්තිය තැබීමෙන්ම අදාළ විනය කර්මය සිද්ධියට පත්වීම මෙහි ලක්ෂණයයි. ඤත්තිදුතිය, ඤත්තිචතුත්ථ කර්මයන්හි මෙන් නොකියා හැරීමක්, හෝ වෙනත් කාරණයක් හෝ මෙම ඤත්ති කම්මයෙහි නැත්තේය.[3] විමතිවිනෝදනී ටීකාවෙහි මෙය තවදුරටත් විස්තර වේ.[4] ඤත්තිදුතිය හා ඤත්තිචතුත්ථ කර්මයන්හි අනුසාවනයක් (ඇස්සවීමක්) ඇති බැවින් එහි සාවනහාපනයක් හටගනී. මෙම ඤත්ති කර්මයෙහි අනුසාවනයක් නැති බැවින් සාවනහාපනයක් නොහට ගනී. එසේ වුව ද ඤත්ති කර්මය සිදු කරන විට එහි අක්ෂර පරිහීනයක් හෝ පද පරිහීනයක් හෝ වරදවා කිමක් හෝ වුවහොත් එහි ශෝධනය පිණිස නැවත නැවත කිව යුතුය. මෙයින් අකෝප්‍ය කර්මය දැඩි (දළ්හීකම්මං) වීම ද කෝප්‍ය කර්මය සිද්ධියට පත් වීම ද සිදු වේ.[5] මෙයින් කියන ලද්දේ ඤත්තියට අදාළ යම් අක්‍ෂරයක් හෝ පද ආදියක් වරදවා කීමෙන් හෝ අත්හැරීමෙන් කර්මය අසිද්ධියට පත් වන බවයි. මෙය ඤත්ති කර්මයට පමණක් නොව

1. 'ඤත්තිකම්මං නාම සීමට්ඨක සංඝං සෝධෙත්වා ඡන්දාරහානං ඡන්දං ආහරිත්වා සමග්ගස්ස සංඝස්ස අනුමතියා එකාය ඤත්තියා කත්තබ්බං කම්මං' සම.පා, **IV** කම්මවග්ග, **1039** පිට හේ.මු.
2. ඤත්තියා කත්තබ්බකම්මං ඤත්තිකම්මං, අනුස්සාවනං අකත්වා සුද්ධඤත්තියා ඒව කන්තබ්බකම්මං විනයා, ටීකා, කම්මාකම්ම විනිච්ඡය කථා, **223** පිට
3. ඤත්තිකම්මෙ ඤත්තිදුතියඤත්තිචතුත්ථේසු විය හාපනං වා අඤ්ඤථාකරණං වා නත්ථි, සම.පා **III**, චම්පෙය්‍යක්ඛන්ධක, **850** පිට හේ.මු.
4. විමතිවිනෝදනනී ටීකා,චම්පෙය්‍යක්ඛන්ධක, බේරතුඩුවේ ධම්මාධාර හිමි, සංස්, **441** පි.
5. ඉදං අකුප්පකම්මස්ස දළ්හීකම්මං හොති. කුප්පකම්මෙ කම්මං හුත්වා තිට්ඨති, සම.පා **IV**, කම්මවග්ග, **1040** පිට හේ.මු.

අපලෝකන කර්ම ඇතුළු සෙසු කර්ම වලට ද අදාළ වන බව විනයාලංකාර ටීකාවෙහි සඳහන් වේ.[1] අපලෝකන කර්මයෙහි අක්ෂර පරිහානියක් නොමැත. හෙළ බසින් වුවත් සිදු කරනු ලබන දන්වා සිටීම හෙවත් ඇස්සවීමට අදාළ සඞ්ඝයා පරාමර්ෂණය වීම් ආදී කරුණු නිවැරදිව සිදුවිය යුතුය. එසේ නොවීමෙන් අපලෝකන කර්ම ද අසිද්ධියට පත්වේ. ඤත්තිය සංක්ෂේප වශයෙන් දෙවැදෑරුම් ය.

එනම් :-

1. නිද්දිට්ඨ ඤත්ති
2. අනිද්දිට්ඨ ඤත්ති[2]

යනුවෙනි.

'නිද්දිට්ඨ ඤත්ති' යනු '........ **ඒසා ඤත්ති**' යනුවෙන් දක්වෙන ඤත්තියයි. 'කම්මපාදඤත්ති' යනුවෙන් ද මෙය හැඳින්වේ.[3] 'එසා ඤත්ති' යනුවෙන් ප්‍රකාශ නොකෙරෙන '...... **සංඝෝ පවාරෙය්‍ය**' ආදී ක්‍රමයෙන් යෙදෙන ඤත්තිය 'අනිද්දිට්ඨ ඤත්ති' නම් වේ. එය ම 'කම්මඤත්ති' නමින් ද හැඳින්වේ. මෙම කම්මපාදඤත්ති හා කම්මඤත්ති පිළිබඳව විමතිවිනෝදනී ටීකාවෙහි වැඩිදුරටත් මෙලෙස සඳහන් වේ. ඤත්තිදුතිය හා ඤත්තිචතුත්ථ කර්මයන්හි අනුසාවන සංඛ්‍යාත වූ කර්මයට ඤත්තිය පාදක වන බැවින් කම්මපාදඤත්ති නම් වේ.[4] ඤත්තියෙන් සිදු කරනු ලබන කර්ම 9 කි.

ඒවා නම්:-

1. ඕසාරණ
2. නිස්සාරණ
3. උපෝසථ
4. පවාරණ
5. සම්මුති
6. දාන
7. පටිග්ගහ

1. විනයලංකාර ටිකා, කම්මාකම්ම විනිච්ඡය කථා, **226** පිට
2. සම.පා **IV**, උපාලිපඤ්හ, **1020** පිට හේ.මු.
3. 'යා නිද්දිට්ඨා සා කම්මපාදඤත්ති නාම, සම.පා **IV**, උපාලිපඤ්හ, **1020** පිට හේ.මු.
4. කම්මඤ්ච කම්මපාදකෝ චාති යත්ථ යස්මා ඤත්තිකම්මෙසු ඤත්තිපි සයමේව කම්මං හොති, 'ඤත්තිදුතියඤත්තිචත්ථේසු කම්මේසු අනුසාවනසංඛාතස්ස කම්මස්ස ඤත්තිපාදකභාවේන තිට්ඨති,' විමතිවිනොදනී ටීකා, **506** පිට

8. පච්චුක්ඛඩ්ඪන
9. කම්මලක්ඛන[1]

යනුවෙනි.

සීමාමාලකයේ දී උපසම්පදාපේක්ෂකයාගේ කැඳවීම සිදුකිරීම සඳහා කරනු ලබන ඤත්තිය **'ඕසාරණ'** යයි උබ්බාහික විනිච්ඡයෙහි දී ධම්මකථික භික්ෂුව බැහැර කිරීම් වශයෙන් කරනු ලබන ඤත්තිය **'නිස්සාරණ'** නම් වේ. පණ්ණරසී, චාතුද්දසී පොහෝ දිනවල පොහොය කිරීම සඳහා තබනු ලබන ඤත්තිය **'උපෝසථ'** යි. පණ්ණරසී, චාතුද්දසී පවාරණයන්හි පවාරණ කර්මය සිදු කිරීම සඳහා තබන ඤත්තිය **'පවාරණ'** නමි. විනය පිළිවිසීම් ආදී තැන්හි තමා හෝ අනෙකකු හෝ සම්මත කිරීම සඳහා තබන ඤත්තිය **'සම්මුති'** යි. සංඝයාට නිස්සජ්ජනය කළ පාත්‍රසිවුරු ආදිය නැවත එම භික්ෂුවට දීම සඳහා තබන ඤත්තිය **'දාන'** නම් වේ. **'පටිග්ගහන'** යනු සංඝයා මැද ඇවැත් දෙසන ලද භික්ෂුවගේ එකී ඇවැත් පිළිගැනීම සඳහා පටිග්ගාහක භික්ෂුවක් සම්මත කිරීම් වශයෙන් තබන ඤත්තියයි. **'පච්චුක්ඛඩ්ඪන'** යනු උපෝසථ, පවාරණ විනය කර්ම දෙක පසුවට කල්දැමීම සඳහා සංඝයාගේ අනුමැතිය ලබා ගැනීමේ දී තබනු ලබන ඤත්තියයි.[2] දෙපිරිසක් අතර ඇති වූ කලහයක දී සිදු වූ ඇවැත්වලට පිළියම් කිරීමට යාමෙන් නැවත නැවත කලහය වර්ධනය වන බැවින් ථුල්ලවජ්ජ හා ගිහිපටිසංයුක්ත ඇවැත් හැර සෙසු ඇවැත් තිණවත්ථාරකයෙන් සංසිඳවීම සඳහා සියලුදෙනා එක් ස්ථානයකට රැස්වී සංඝයාගේ අනුමැතිය පිණිස එක් ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුවක් විසින් තබනු ලබන සබ්බසංගාහික ඤත්තිය **'කම්මලක්ඛන'** නම් වේ. ඤත්ති කර්ම සිදුවන්නේ ඕසාරණ ආදී මෙකී නව තැන්හි ය. ඤත්ති කර්මයට අයත් ඉහත දැක්වූ කර්ම නවය අතුරින් උපෝසථ හා පවාරණ යන කර්මද්වය අවස්ථානුකූලව සංඝයාට හෝ ගණයාට හෝ කළ හැකිය. ඕසාරණ, නිස්සාරණ ආදී සෙසු කර්ම හත කළ හැක්කේ සංඝයාට පමණි.

3. **ඤත්තිදුතිය කම්ම** :- සීමස්ථක සංඝයා අත්පසට කැඳවා හෝ ගණපූරක භික්ෂූන් තබා සෙසු භික්ෂූන් රුචිය පරිදි සීමාවෙන් බැහැර

---

1. ඤත්තිකම්මං කතමාකි නව ඨානානි ගච්ඡති, පරිවාරපාළි, **II. 306** පිට
   පාලිමුත්තක විනයවිනිච්ඡය, **358** පිට
2. සම.පා **IV, 1051 - 52** පිට හේ.මු.

කොට (සෝධනය කොට) හෝ ඡන්දයට සුදුසුවූවන්ගෙන් ඡන්දය ගෙනවුත් සමගි සංඝයාගේ අනුමැතිය පිණිස එක් ඤත්තියකින් හා එක් අනුසාවනයකින් සිදු කරනු ලබන කර්මය ඤත්තිදුතිය කර්මය නම් වේ.[1] මෙම 'ඤත්තිදුතිය කර්මය' සත් තැනක දී සිදු කරනු ලැබේ.

එනම්

1. ඕසාරණ
2. නිස්සාරණ
3. සම්මුති
4. දාන
5. උද්ධාර
6. දේසන
7. කම්මලක්ඛන[2]

වශයෙනි.

ඤත්තිදුතිය කර්මයෙහි '**නිස්සාරණ**' යනු සංඝයාට අලාභ සිදු කරන කිසියම් ගිහියකුගේ දානය ප්‍රතික්ෂේප කිරීම් වශයෙන් (වඩ්ඪ ලිච්ඡවීට සිදු කළාක් බඳු) සිදු කෙරෙන පත්තනික්කුජ්ජන කර්මයයි. කළ වරද පිළිගෙන ආයති සංවරයෙහි පිහිටීමෙන් පසු කලින් පැනවූ පත්තනික්කුජ්ජනය සංඝයා විසින් ඉවත් කරනු ලැබීම '**ඕසාරණ**' යනුවෙන් දැක්වේ. '**සම්මුති**' යනු තිචීවරඅවිප්පවාස ආදී තෙරස සම්මුතීන් අතුරින් කිසියම් සම්මුතියක් සංඝයා විසින් භික්ෂුවකට දෙනු ලැබීමයි. කඨිනචීවර, මතකචීවර ආදිය සුදුසු භික්ෂුවකට ලබාදීම '**දාන**' නම්. '**උද්ධාර**' යනු ධාර්මික කරුණක් ඇති කල්හි කඨිනානිසංස අවලංගු කිරීමයි. (උගුලාදැමීමයි). කුටිවත්ථු, විහාරවත්ථු දේශනා කිරීම '**දේසනා**' නම් වේ. '**කම්මලක්ඛන**' යනු තිණවත්ථාරක සමථයෙහි එක් පක්ෂයක එකක් බැගින් පක්ෂ දෙකෙහි ඤත්තිදුතිය කර්ම දෙකක් කිරීමයි. ඤත්තිදුතිය කර්මයට අයත් ඉහත සඳහන් ඕසාරණ ආදී කර්ම හත සිදු කළ හැක්කේ චතුවාර්ගික හෝ ඊට වැඩි සංඝයාට පමණි.

4. **ඤත්තිචතුත්ථ කම්ම** :- එනම් සීමස්ථක සංඝයා අත්පසට කැඳවා හෝ ගණපූරක භික්ෂූන් තබා සෙසු භික්ෂූන් රුචිය පරිදි සීමාවෙන් බැහැර

1. සම.පා IV, කම්මවග්ග 1039 පිට හේ.මු.
2. පරිවාරපාළි II, කම්මවග්ග 306 පිට

කොට (සෝධනය කොට) හෝ ඡන්දයට සුදුසු වූවන්ගෙන් ඡන්දය ගෙනවුත් සමගි සංඝයාගේ අනුමැතිය පිණිස එක් ඤත්තියකින් හා අනුසාවන තුනකින් යුතුව කරනු ලබන කර්මයයි.[1] මෙම ඤත්ති චතුත්ථකර්මය සත් තැනෙක්හි සිදු කරනු ලැබේ.

ඒවා නම් :-

1. ඕසාරණ
2. නිස්සාරණ
3. සම්මුති
4. දාන
5. නිග්ගහ
6. සමනුභාසන
7. කම්මලක්ඛන[2]

යනුවෙනි.

ඤත්තිචතුත්ථ කර්මයෙහි එන '**නිස්සාරණ**' යනු තජ්ජනියාදී කර්මයන්ගේ වශයෙන් කරනු ලබන දණ්ඩකර්මයයි. ඒ තජ්ජනීයාදී දණ්ඩ කර්මයන්ගේ පටිප්පස්සම්භනය (සංසිඳවීම)ම '**ඕසාරණ**' නමි. '**සම්මුති**' යනු භික්ෂුණීන්ට අවවාද කිරීම සඳහා භික්ෂුවක් සම්මත කර ගැනීමයි. පිරිවෙස්, මානත් ආදිය දීම '**දාන**' නම් වේ. '**නිග්ගහ**' යනු මූලාය පටිකස්සනයයි. භික්ෂුවක් සංඝාදිසේසයකට පත්ව එය පිළිසන් වූයේ නම් පිළිසන් දින ගණනට පිරිවෙස් පිරිය යුතුය. එම පිරිවෙස පුරන අතරතුර දී යම් අන්තරාපත්තියකට පත් වූයේ නම් නැවත එම පිරිවෙස මුලට ඇදිය යුතුය. මෙම මූලාය පටිකස්සනය පාරිවාසික, මානත්තාරහ, මානත්තචාරික, අබ්භානාරහ යන අවස්ථාවලදී සඟවෙසෙසකට පැමිණීමෙන් සිදු කෙරේ. '**සමනුභාසන**' නමින් හැඳින්වෙන්නේ උක්ඛිත්තානුවත්තක, අරිට්ඨචණ්ඩකාලිකාදී එකොළොස් තැනෙක පැනෙන ඔවුනොවුන් ගත් වැරදි මත බැහැර කරලීමේ අදහසින් කෙරෙන කර්මයයි. උපසම්පදා, අබ්භාන යන කර්මද්වය කර්මයම ලක්ෂණ කොට ඇති බැවින් '**කම්මලක්ඛන**' නම් වේ. මෙම කර්ම ලක්ෂණයට අයත් වන ඤත්තිචතුත්ථ උපසම්පදාව ශාසනික ගරු විනය

1. සම.පා, IV, කම්මවග්ග, 1039 පිට හේ.මු.
2. පරිවාරපාලි II,කම්මවග්ග, 306 පිට

කර්මයකි. ඒහි භික්ඛු උපසම්පදා ආදී අෂ්ටවිධ උපසම්පදා ක්‍රම අතුරින් වර්තමානයෙහි ලොව පවතින්නේ මෙකී ඤත්ති චතුත්ථකම්ම උපසම්පදාව පමණි. මෙම උපසම්පදාව ප්‍රත්‍යන්ත ජනපදයක සිදු කරන්නේ නම් ඒ සඳහා පංචවාර්ගික (උපසපන් භික්ෂූන් පස්නමක්) සංඝයා සහභාගී විය යුතු අතර එය මධ්‍යදේශයේ සිදු කරන්නේ නම් දසවාර්ගික (උපසපන් භික්ෂූන් දසනමක්) සංඝයා සහභාගී විය යුතුය. මෙම කර්ම ලක්ෂණයට ම අයත් අබ්භාන කර්මය තවත් ඤත්තිචතුත්ථ ගරු විනය කර්මයකි. එනම් සඟවෙසෙස් ඇවැතකට පත් වූ භික්ෂුවක් වත් මානත් පිරීමෙන් පසු වීසති වාර්ගික (උපසපන් භික්ෂූන් විසිනමක්) සංඝයා විසින් එම භික්ෂුව ප්‍රකෘති භික්ෂුවක් වශයෙන් නඟා සිටුවනු ලැබීමයි. ඤත්ති චතුත්ථ කර්මයට අයත් ඔසාරණ, නිස්සාරණ, සම්මුති, දාන, නිග්ගහ, සමනුභාසන යන කර්ම සිදුකිරීමට අවම වශයෙන් චතුවාර්ගික සංඝයා සිටිය යුතුය. කම්මලක්ඛනයට අයත් උපසම්පදා හා අබ්භාන කර්ම සඳහා සිටිය යුතු භික්ෂු සංඛ්‍යාව ඉහත දැක්වූ පරිදි දත යුතුය.

කිච්චාධිකරණයට අයත් 'අපලෝකනකර්ම හා ඤත්තිකර්ම' දෙක ලහු කර්ම වශයෙන් ද 'ඤත්තිදුතියකම්ම හා ඤත්තිචතුත්ථකම්ම' ගරු කර්ම වශයෙන් ද විනයෙහි දක්වා තිබේ.[1] ටීකාවේ සඳහන් කොට ඇති මෙම කරුණ දක්වන ලද්දේ අවිශේෂයෙනි. එයින් කිසි විටෙකත් චතුර්විධ කර්මයන්ට අදාළ සම්පත්තිකර ධර්මයන් පිරිහවීමේ ඉඩක් නොලැබේ.

කිච්චාධිකරණයට ඇතුළත්වන චතුර්විධ විනය කර්ම අතුරින් 'අපලෝකන කර්මය' අපලෝකන වශයෙන්ම කළ යුතුය. එය 'ඤත්ති කර්මාදී' වශයෙන් නොකළ යුතුය. ඤත්ති කර්මය ද එක් ඤත්තියක් තබාම කළ යුතුය. එය 'අපලෝකන කර්මාදී' වශයෙන් නොකළ යුතුය. 'ඤත්තිදුතිය කර්මයෙන් සිදු කිරීමට අනුදත් කර්ම අතුරින් අපලෝකනය කොට කළ හැකි කර්ම ද ඇත. අපලෝකනය නොකොට ඤත්තිදුතිය කර්මයෙන්ම කළ යුතු කර්ම ද ඇත. සීමා සම්මුති, සීමා සමූහන, කඨින දාන, කඨිනුද්ධාර, කුටිවත්ථු දේසන, විහාරවත්ථු දේසන යන මේ කර්ම හය ඤත්ති දුතිය කර්මයෙන් ම කළ යුතු ගරු කර්මයෝ වෙති. මේවා

1. විනයාලංකාර ටීකා, කම්මාකම්මකථා 223 පිට

අපලෝකනය කොට නොකළ යුතුය. සෙසු තෙරස සම්මුති මතකචීවරදානාදිය ලහු කර්ම වන අතර ඒවා ද අපලෝකන වශයෙන් කිරීමට සුදුසු ය.

# චතුර්විධ කර්ම අසිද්ධියට පත්වන අයුරු

ඉහත සඳහන් කළ අපලෝකන කර්මාදි චතුර්විධ විනය කර්ම අසිද්ධියට පත්වන ආකාරය පහකි.

ඒවා නම් :-

1. වස්තු වශයෙන්
2. ඤත්ති වශයෙන්
3. අනුසාවන වශයෙන්
4. සීමා වශයෙන්
5. පරිස වශයෙන් [1]

යනුවෙනි.

**වස්තු වශයෙන් කෝප්‍යවීම** යනු සම්මුඛයෙහි කළ යුතු කර්මය අසම්මුඛයෙහි කිරීම, පිළිවිස කළ යුතු කර්මය නොපිළිවිස කිරීම, ප්‍රතිඥයෙන් කළයුතු කර්මය අප්‍රතිඥාවෙන් කිරීම, සතිවිනයට සුදුසු වූවහුට අමූළ්හවිනය දීම, අමූළ්හවිනයට සුදුසු වූවහුට තස්සපාපියාසිකා කර්මය කිරීම, තස්සපාපියාසිකා කර්මයට සුදුසු වූවහුට තජ්ජනීය කර්මය කිරීම, තජ්ජනීය කර්මයට සුදුසු වූවහුට නියස්ස කර්මය කිරිම, නියස්ස කර්මයට සුදුසු වූවහට පබ්බාජනීය කර්මය කිරීම, පබ්බාජනීය කර්මයට සුදුසු වූවහුට පටිසාරණීය කර්මය  කිරීම, පටිසාරණීය කර්මයට සුදුසු වූවහුට උක්ඛේපනීය කර්මය කිරීම, උක්ඛේපනීය කර්මයට සුදුසු වූවහුට පරිවාස (පිරිවෙස්) දීම, පරිවාසයට සුදුසු වූවහුට මූලාය පටිකස්සනය කිරීම, මූලාය පටිකස්සනයට සුදුසු වූවහුට මානත දීම, මානතට සුදුසු වූවහුට අබ්භානය කිරීම, අබ්භානයට සුදුසු වූවකු උපසම්පදා කිරීම, අනුපෝසථ (නොපොහෝ) දවසෙහි උපෝසථය කිරීම, අපවාරණයෙහි (පවාරණයට නුදුසු දිනයෙහි) පාවරණය කිරීම යන අවස්ථා ය.[2]

1. ඉමානි චත්තාරි කම්මානි පඤ්චාහකාරේහි විපජ්ජන්ති, වත්ථුතෝ වා ඤත්තිතෝ වා අනුසාවනතෝ වා සීමතෝ පවා පරිසතෝ වා .... පරිවාරපාළි **II, 300** පිට
2. පරිවාරපාළි, **II 300-302** පිට

ඉහත දැක්වූ සම්මුඛයෙහි කළ යුතු කර්ම අසම්මුඛයෙහි කිරීමෙන් වස්තු විපන්න වූ අධර්ම කර්මයක් වේ. මෙහි සම්මුඛයෙහි කළ යුතු කර්ම ද ඇත. අසම්මුඛයෙහි කළ යුතු කර්ම ද ඇත. අසම්මුඛයෙහි කළයුතු කර්ම නම්ඃ **දූතෙන උපසම්පදාව, පත්තනික්කුජ්ජනය, පත්තඋක්කුජ්ජනය, උමතු භික්ෂුවට උම්මත්තක සම්මුතිය, සේඛ කුලයන්ට සේඛසම්මුතිය, බ්‍රහ්මදණ්ඩනය, පකාසනීයකර්මය, අවන්දනීය කර්මය** යන අට ය. මෙම කර්ම අට අසම්මුඛයෙහි කළේ නමුදු මනාව කරනා ලද්දේ වේ. සෙසු සියලු කර්ම සම්මුඛයෙහි ම කළ යුතුය. සම්මුඛා විනය වූ කලි සිව්වැදෑරුම් ය. එනම් **සංඝ සම්මුඛතා, ධම්මසම්මුඛතා, විනයසම්මුඛතා, පුග්ගලසම්මුඛතා** වශයෙනි.[1] **සංඝ සම්මුඛතා** යනු චතුවග්ගාදි විනය කර්මයන්ට යම් පමණ භික්ෂූහු කර්මප්‍රාප්ත වූවාහු ද ඔවුහු පැමිණියාහූ වෙති. ඡන්දයට සුදුසු වූවන්ගේ ඡන්දය ගෙනෙන ලද්දේ වේ ද සම්මුඛීභූත භික්ෂූහූ පටික්කෝසනය නොකරත් ද මෙය සංඝ සම්මුඛතා නම් වේ. යම් ධර්මයකින්, යම් විනයකින්, යම් ශාස්තෘශාසනයකින් සංඝයා කර්ම කරයි ද මෙය **ධම්මසම්මුඛතා** මෙන්ම **විනය සම්මුඛතා** ද වේ. එහි ධර්මය යනු භූත හෙවත් විද්‍යමාන වස්තුවයි. විනය යනු චෝදනාව මෙන් ම සිහි කිරීමයි. ශාස්තෘශාසනය නම් ඤත්ති සම්පත්තිය මෙන් ම අනුසාවන සම්පත්තිය ය. **පුග්ගලසම්මුඛතා** යනු සංඝයා යම් භික්ෂුවකට කර්ම කිරීමේ දී ඔහුගේ සම්මුඛභාවයයි.[2] ඉහත සඳහන් චතුර්විධ සම්මුඛා විනයෙන් කරන ලද්දාවූ කර්මයෝ මනා කොට කරන ලද්දාහු වෙති. සම්මුඛා විනයෙන් තොරව කරන ලද කර්මයෝ වස්තු විපන්න වන බැවින් '**සම්මුඛාකරණීයං කම්මං අසම්මුඛා කරෝති වත්ථුවිපන්නං අධම්මකම්මං**' යැයි කියන ලද්දේ වේ.[3]

මීට අමතරව 'විසිවයස් අඩු තැනැත්තකු හෝ පරිජි වූවකු හෝ එකොළොස් අභව්‍ය පුද්ගලයන්ගෙන් කෙනෙකු හෝ උපසපන් කිරීම' ද වස්තු වශයෙන් කෝප්‍ය වීමේ කරුණක් ලෙස විනය අටුවාවෙහි දක්වා තිබේ.[4] ඉහත දැක්වූ දෝෂවලින් යුක්ත වීම වස්තු විපත්ති නම් වේ. එකී දෝෂවලින් විනිර්මුක්ත වීම ම වස්තු සම්පත්ති නම් වේ.

---

1. සම.පා **IV**, කම්මවග්ග, **1040** පිට හේ.මු.
2. පාලිමුත්තක විනයවිනිච්ඡය සංගහටීකා, කම්මාකම්මවිනිච්ඡය, කථා **137** පිට
3. සම.පා, **IV**, කම්මවග්ග, **1040** පිට හේ.මු.
4. සම.පා **IV**, කම්මවග්ග, **1041** පිට හේ.මු.

**ඤත්ති වශයෙන් කෝප්‍යවීම** යනු 'වස්තුව පරාමර්ශනය නොකිරීම, සංඝයා පරාමර්ශනය නොකිරීම, පුද්ගලයා පරාමර්ශනය නොකිරීම, ඤත්තිය පරාමර්ශනය නොකිරීම, පසුව ඤත්තිය තැබීම' යන කරුණු පසෙකින් විපත්තියට හෙවත් අසිද්ධියට පත් වීමයි.[1] වස්තු පරාමර්ශනය නොකිරීම යන්නෙන් අදහස් කෙරන්නේ යමෙකු උපසම්පදා කිරීමේ දී ඔහුගේ නම පරාමර්ශය නොකිරීමයි. සංඝයා පරාමර්ශනය නොකිරීම යනු සංඝයාගේ නම නොගැනීමයි. එනම් '**සංඝ**' යන පදය නොකියා හැරීමයි. පුද්ගලයා පරාමර්ශනය නොකිරීම යනු උපසම්පදාපේක්ෂකයාගේ යම් උපාධ්‍යායවරයකු වේ ද ඔහු පරාමර්ශනය නොකිරීම හෙවත් ඔහුගේ නම නොකියා හැරීමයි. ඤත්තිය පරාමර්ශනය නොකිරීම යනු සියලු ආකාරයෙන් ඤත්තිය පරාමර්ශනය නොකිරීමයි. එනම් ඤත්ති දුතිය කර්මයෙහි ඤත්තිය නොතබා දෙවරක් කර්මවාක්‍යය ම අනුසාවනය කිරීමයි. ඤත්තිචතුත්ථ කර්මය පිළිබඳව ද එපරිදි ම ය. පසුව ඤත්තිය තැබීම යනු පළමුව කර්මවාක්‍යයෙන් අනුසාවන කර්මය කොට පසුව '**..... ඒසා ඤත්ති**' ති යැයි ඤත්තිය තබා ඉන්පසුව '**.....ඛමති සංඝස්ස තස්මාතුණ්හී ඒවමේතං ධාරයාමී**' යැයි අවසන් කිරීමයි.[2] ඤත්තියට අයත් ඉහත දැක්වූ දෝෂ පහෙන් යුක්ත වීම ඤත්ති විපත්ති වන අතර ඒවායින් තොරවීමම ඤත්ති සම්පත්ති නම් වේ.

**අනුසාවන වශයෙන් කෝප්‍යවීම** යනු **වස්තුව පරාමර්ශනය නොකිරීම, සංඝයා පරාමර්ශනය නොකිරීම, පුද්ගලයා පරාමර්ශනය නොකිරීම, අනුසාවනය අත්හැරීම, නොකල්හි අනුසාවනය කරවීම** යන පස් ආකාරයකින් සිදුවන අසිද්ධියයි.[3] එහි වස්තු පරාමර්ශනය නොකිරීම යනු '**සුණාතු මේ භන්තේ සංඝෝ**' යන පළමු අනුසාවනයෙහි හෝ '**දුතියම්පි ඒතමත්ථං වදාමි. තතියම්පි ඒතමත්ථං වදාමි. සුණාතු මේ භන්තේ සංඝෝ**' යන දෙවන තුන්වන අනුසාවනයන්හි හෝ '**අයං ධම්මරක්ඛිතෝ ආයස්මතෝ බුද්ධරක්ඛිතස්ස උපසම්පදාපෙක්ඛෝ**' යැයි කිව යුතු කල්හි '**සුණාතු මේ භන්තේ සංඝෝ, ආයස්මතෝ බුද්ධරක්ඛිතස්ස උපසම්පදාපෙක්ඛෝ**' යැයි කීම

1. පරිවාර පාළි II, 302 පිට
2. සම.පා IV, කම්මවග්ග, 1041 - 42 පිට හේ.මු.
3. පරිවාර පාළි II, 302 පිට

උපසම්පදාපේක්ෂකයාගේ නම නොකියා හැරීම වස්තුව පරාමර්ශනය නොකිරිම නම්. සංඝ පරාමර්ශනය නොකිරීම යනු '**සුණාතු මේ භන්තේ සංඝො, අයං ධම්මරක්ඛිතෝ**' යැයි කිය යුතු කල්හි '**සුණාතු මේ භන්තේ අයං ධම්මරක්ඛිතෝ**' යැයි කියමින් සංඝයා පරාමර්ශනය නොකිරීමයි. පුද්ගලයා පරාමර්ශනය නොකිරීම යනු '**සුණාතු මේ භන්තේ සංඝෝ අයං ධම්මරක්ඛිතෝ ආයස්මතෝ බුද්ධරක්ඛිතස්ස උපසම්පදාපෙක්ඛෝ**'[1] යැයි කියමින් පුද්ගලයා (උපාධ්‍යායයන් වහන්සේගේ නම) පරාමර්ශනය නොකිරීමයි. අනුසාවනය අත්හැරීම (අනුසාවනං හාපෙති) යනු සියල්ලෙන් සියල්ල කර්මවාක්‍යයෙන් අනුසාවනය නොකිරීමයි.[2] එනම් ඤත්තිදුතිය කර්මයෙහි දී කර්ම වාක්‍යය නොකියා දෙවරක් ඤත්තිය ම තැබීම ද ඤත්තිචතුත්ථ කර්මයෙහි දී කර්මවාක්‍යය නොකියා සිව්වරක් ඤත්තියම තැබීම ද වේ. තව ද ඤත්තිදුතිය කර්මයකදී එක් ඤත්තියක් තබා එක් කර්මවාක්‍යයක් අනුසාවනය කරන කල්හි ද ඤත්තිචතුත්ථ කර්මයකදී එක් ඤත්තියක් තබා තෙවරක් කර්මවාක්‍යයෙන් අනුසාවනය කරන කල්හි ද අකුරක් හෝ පදයක් හෝ අත්හරියි ද නැතහොත් නොමනා ලෙස උච්චාරණය කෙරේ (**අක්ඛරං වා පදං වා ඡඩ්ඩෙන්තෝපි දුරුත්තං කරොන්තෝපි**) ද මෙලෙසින් අනුසාවනය පිරිහෙළන බව අටුවාවෙහි සඳහන් වේ.[3] 'දුරුත්ත කරයි' (**දුරුත්තං කරොති**) යනු මෙහි වනාහි මේ විනිශ්චයයි. යමෙක් වනාහි අන් අකුරක් කිය යුතු තන්හි වෙනෙකක් (උච්චාරණය වරදවා) කියා ද මෙතෙමේ දුරුත්ත කරයි නම් වේ. දුරුත්තය සිදුවන ආකාර දහයක් වන අතර එය අටුවාවෙහි මෙලෙස දක්වේ.

**"සිථිලධනිතඤ්ච දීඝරස්සං - ගරුකලහුකඤ්ච නිග්ගහීතං,**
**සම්බන්ධං වවත්ථිතං විමුත්තං - දසධාබ්‍යඤ්ජනබුද්ධියා පභේදෝ."**[4]

මෙහි සිථිල යනු වර්ග පසෙහි පළමු හා තෙවන අක්ෂරයෝ (ක, ග, ච, ජ, ට, ඩ, ත, ද, ප, බ)ය. ධනිත යනු එම වර්ග පහේ ම දෙවන හා

1. **සම.පා IV, 1043** පිට හේ.මු.
2. 'අනුසාවන හාපෙතීති සබ්බේන සබ්බං කම්මවාචාය අනුසාවන නකරෝති.'
   **සම.පා. 4,** කම්මවග්ග, **1042** පිට හේ.මු.
3. **සම.පා. IV, 1042** පිට හේ.මු.
4. -එම-

සතරවන අක්ෂරයෝ (ඛ, ඝ, ඡ, ඣ, ඨ, ඪ, ථ, ධ, ඵ, භ) ය. දීඝ යනු උච්චාරණයේදී දීර්ඝ කාලයක් ගතවන එනම් මාත්‍රා දෙකක් ගතවන ආ,ඊ,ඌ යන අක්ෂරයෝ ය. රස්ස යනු ඉහත දැක්වූ දීර්ඝ ස්වරවලින් අර්ධමාත්‍රක කාලයකින් උච්චාරණය වන අක්ෂරයෝ (අ, ඉ, උ)ය. ගරුක යනු දීර්ඝ අක්ෂර ම ය. '**ආයුස්මතෝ බුද්ධරක්ඛිතත්ථේරස්ස**' '**යස්ස නක්ඛමති**'යැයි කියන කල්හි ඉරි ඇඳි මෙකී සංයෝගයකට පූර්වයෙහි ඇති විවෘත අකාරය ද ගරුක නමි. ලහුකය යනු හ්‍රස්වයමය. '**ආයස්මතෝ බුද්ධරක්ඛිතථෙරස්ස**' '**යස්ස න ඛමති**' යැයි මෙසේ අසංයෝගය පරකොට යමක් කියනු ලැබේ ද එයයි. සංයෝගයක් රහිත විටකෙ ඊට පූර්වයෙහි ඇති සංවෘත වූ අකාරය මෙලෙස ලහුක නම් වේ. නිග්ගහීත යනු කරණය හෙවත් දිව පෙළා අවිසර්ජනය කොට විවෘත නොවූ මුවින්, අනුනාසිකය හෙවත් නාසයට බරව උච්චාරණය කෙරෙන ශබ්දයයි. රේරුකානේ නාහිමියෝ එය මෙලෙස දක්වති. '**නිග්ගහීතය යනු කරණය තද කරගෙන විවෘත ද නොවූ සර්වාකාරයෙන් ද නොවැසූ මුඛයෙන් නාසියෙන් සුළං යවමින් උච්චාරණය කළ යුතු බින්දුවයි**'[1] සම්බන්ධය යනු යමක් පරපදය හා සම්බන්ධ කොට තුණ්හිස්ස යැයි හෝ තුණ්හස්ස යැයි හෝ කියනු ලැබේ ද එයයි. මුල් පදය පසුපදය සමඟ සම්බන්ධ වීම හෙවත් සන්ධි වීම සම්බන්ධ නම් වේ. වවත්ථිත යනු කිසියම පදයක් පරපදය සමඟ සම්බන්ධ නොකොට විච්ඡින්ද (වෙන්) කොට '**තුණ්හී අස්ස**' යැයි හෝ '**තුණ්හඅස්ස**' යැයි හෝ කියනු ලැබේ ද එයයි.

විමුත්ත යනු කරණය නොපෙළා විසර්ජනය කොට විවෘත මුවින් අනුනාසිකය නොකොට කියනු ලැබේ ද එයයි. ('**විමුක්තිය යනු කරණයත් තද කර නොගෙන මුඛය විවෘත කොට හුස්ම පිටකරමින් කිය යුතු අක්ෂරය**' විනය කර්ම, 256 පි). එහි '**සුණාතු මේ**' යැයි කිව යුතු කල්හි 'ත' කාරයට 'ථ' කාර කොට '**සුණාථු මේ**' යැයි කීම සිථිලයට ධනිකරණ නම් වේ. එසේ ම '**පත්තකල්ලං ඒසා ඤත්ති**' යැයි කිය යුතු කල්හි '**පත්ථකාලං, ඒසා ඤත්ථි**' යනාදී වචන එසේ සිථිලයට ධනිත කිරීම යන්නෙන් අදහස් වේ. '**භන්තෙ සංඝො**' යැයි කිව යුතු කල්හි

1. විනයකර්ම පොත, රේරුකානේ චන්දවිමල මහනාහිමි, **2007, 255 - 256** පිට

'හ' කාර 'ස' කාරයන්ට 'බ' කාර 'ග ' කාර කොට '**බන්තේ සංඝො**' යැයි කීම ධනිතයට සිථිලකරණ නම්. 'විමුත්තියට නිග්ගහීතය' යනුවෙන් අදහස් කෙරෙන්නේ විවෘත නොවූ මුඛයෙන් අනුනාසිකය කොට කීම ය. එනම්, '**සුණාතු මේ**' යැයි කිව යුතු කල්හි '**සුණන්තු මේ**' යැයි කීම හෝ '**ඒසා ඤත්ති**' යැයි කිව යුතු කල්හි '**ඒසං ඤත්තිං**' යැයි කීම ය.[1] නිග්ගහීතයට විමුත්තය'යනුවෙන් අදහස් කෙරෙන්නේ 'පත්තකල්ලං' යැයි විවෘත නොවූ මුඛයෙන් අනුනාසිකය කොට කිව යුතු කල්හි 'පත්තකල්ලා' යැයි විවෘත මුඛයෙන් අනුනාසිකය නොකොට කීමය. මෙසේ සිථිලය කිව යුතු කල්හි ධනිතය, ධනිතය කිව යුතු කල්හි සිථිලය, විමුත්තය කිව යුතු කල්හි නිග්ගහීතය, නිග්ගහීතය කිව යුතු කල්හි විමුත්තය යන මේ චතුර්විධ ව්‍යඤ්ජනයෝ කර්මවාක්‍යය තුළ කර්මය දූෂ්‍ය හෙවත් කෝප්‍ය කෙරෙති.[2]

අනෙක් දීර්ඝ, හ්‍රස්ව ආදි ෂඩ්ව්‍යඤ්ජනයන් අතුරින් දීර්ඝස්ථානයෙහි දීර්ඝය ම, හ්‍රස්වස්ථානයෙහි හ්‍රස්වය ම යැයි මෙසේ සුදුසු තැන ඒ ඒ අකුර ම කියන්නා විසින් අනුක්‍රමාගත ප්‍රවේණිය විනාශ නොකරන්නාහු විසින් කර්ම වාක්‍යය කටයුත්තේ ය. මෙහි 'අනුක්‍රමාගත ප්‍රවේණිය පිළිබඳව **විමතිවිනෝදනී ටීකාවෙහි** මෙලෙස සඳහන් වේ. යම් වචනයක් වනාහි '**සච්චිකත්ථ පරමත්ථේන**' යැයි කිය යුතු කල්හි '**සච්චිකට්ඨ පරමට්ඨේන**' යැයි ද '**අත්ථකථා**' යැයි කිව යුතු කල්හි '**අට්ඨකථා**' යැයි ඒ ඒ තැන කියනු ලැබේ ද එබඳු වූ පාලි අර්ථකථාවන්හි දුෂ්ට ප්‍රයෝගයක් තදනුරූපයක් කීම් වශයෙන් කිරීමට සුදුසුය. එයින් අනිකක් නුසුදුසුය. එබැවින් '**අනුක්කමාගත පවේණිං අවිනාසන්තේන**' යනාදිය කීහ.[3] ඉදින් මෙසේ නොකොට දීර්ඝය කිව යුත්තෙහි හ්‍රස්වය ද හ්‍රස්වය කිව යුත්තෙහි දීර්ඝය ද කියා නම් එසේ ම ගරුකය කිව යුත්තෙහි ලහුකය ද ලහුකය කිව යුත්තෙහි ගරුකය ද කියා නම් සම්බන්ධය කිව යුත්තෙහි ව්‍යවත්ථිතය ද ව්‍යවත්ථිතය කිව යුත්තෙහි සම්බන්ධය ද කියා නම් මෙසේ කී කල්හි කර්ම වාක්‍යය කෝප්‍ය නොවේ. මේ ෂඩ්ව්‍යඤ්ජනයෝ

1. සම.පා **IV 1043** පිට හේ.මු.
2. -එම-
3. යං හි සච්චිකත්ථ පරමත්ථේනා' ති වත්තබ්බේ සච්චිකට්ඨ පරමට්ඨේනා ති ච අත්ථකථාති වත්තබ්බේ අට්ඨකථාති ච තත්ථ තත්ථ වුච්චති, තතො අඤ්ඤං න වට්ටති, තෙනාහ අනුක්කමාගත පවේණිං අවිනාසෙන්තේනාති ආදි ...... විමතිවිනෝදනී, සංස්, බේරතුඩුවේ ධම්මාධාරතිස්ස ථෙර **1937, 510** පිට

කර්ම වාක්‍යය දූෂ්‍ය නොකරති.[1] සූත්‍රාන්තික තෙරහූ වනාහි 'ද ' කාරය 'ත' කාරයට පැමිණේ. 'ත' කාරය 'ද' කාරයට පැමිණේ. 'ච' කාරය 'ජ'කාරයට පැමිණේ. 'ජ. කාරය 'ච' කාරයට පැමිණේ. 'ය' කාරය 'ක' කාරයට පැමිණේ. 'ක' කාරය 'ය' කාරයට පැමිණේ. එබැවින් 'ද ' කාරාදිය කිව යුතු තන්හි 'ත' කාරාදිය කීම විරුද්ධ නොවේ යැයි කියති. ඒ කීම කර්ම වාක්‍යය සම්බන්ධව නොවටී. එබැවින් විනයධරයා විසින් 'ද ' කාරය 'ත' කාරය නොකට යුතුය, 'ත' කාරය 'ද ' කාරය නොකට යුතුය. 'ච' කාරය 'ජ' කාරය නොකට යුතු ය, 'ජ' කාරය 'ච'කාරය නොකට යුතුය. 'ය' කාරය 'ක' කාරය නොකට යුතුය. 'ක' කාරය 'ය' කාරය නොකට යුතුය. පෙළට අනුකූලව නිරුක්තිය ශෝධනය කොට දසවිධ ව්‍යඤ්ජන නිරුක්තියෙහි දොස් දුරු කරන්නාහු විසින් කර්ම වාක්‍යය කටයුත්තේය. වෙනස් අයුරකින් කීම 'සාවනය පිරිහෙළා නම්'යි දත යුතුය.[2] නොකල්හි අනුසාවනය කිරීම යනු පළමුව අනුසාවන කර්මය කොට පසුව ඤත්තිය තැබීමයි. අනුසාවනයට අයත් ඉහත දැක්වූ දෝෂ පහෙන් යුක්ත වීම 'අනුසාවන විපත්ති' වන අතර ඒවායෙන් තොර වීම ම'අනුසාවන සම්පත්ති' නම් වේ.

**සීමා වශයෙන් කෝප්‍යවීම යනු** 'අතිඛුද්ධික, අතිමහති, ඛණ්ඩනිමිත්ත, ඡායානිමිත්ත, අනිමිත්ත, බහිසීමෙඨිතසම්මත, නදීසම්මත, සමුද්දසම්මත, ජාතස්සරසම්මත, සීමායසීමං සම්භින්දන, සීමායසීමං අජ්ඣොත්තරණ' යන එකොළොස් ආකාරයෙන් සිදුවන සීමා විපත්තියයි.[3] එහි අතිඛුද්ධිකසීමාව නම් යම් සීමාවක යටත් පිරිසෙයින් කර්මාරහ භික්ෂුව සමඟ භික්ෂූන් 21 නමකට පරිමණ්ඩලාකාරයෙන් හිඳීමට නොහැකි වේ ද එයයි.[4] කුරුන්දි අටුවාවෙහි වනිහා 'යත්ථ එකවීසති භික්ඛු නිසීදිතුං න සක්කොන්ති' යැයි කියන ලද්දේය.[5] එබැවින් මෙබඳු යම් සීමාවක් වේ ද එය සම්මත කර තිබුණ ද සම්මත නොවේ. ග්‍රාමක්ෂේත්‍රයක් බඳු ම වේ. එහි කරන ලද විනය කර්ම කෝප්‍ය වේ. අතිමහතිසීමා නම් යම් සීමාවක් කෙසඟක්

1. සම.පා IV, 1043 පිට හේ.මු.
2. සම.පා. IV, 1043 - 1044 පිට හේ.මු.
3. පරිවාරපාළි II 302 පිට
4. විනයත්ථමඤ්ජුසා ටීකා, සංස්. යූ.පී. ඒකනායක, 1912. 16 පිට
5. සම.පා. IV, 1044 පිට හේ.මු.

පමණකිනිදු තුන්යොදුන ඉක්මවා සම්මත කරයි ද එයයි.[1] සීමාවේ උපරිම ප්‍රමාණය විශාලත්වයෙන් තුන් යොදුනකි. කෙසඟක් පමණ හෝ එම යොදුන් තුන් ඉක්මවා සීමාවක් සම්මත කරන්නේ නම් එය අතිමහති යන විපත් සීමා සංඛ්‍යාවට අයත් වේ. 'ඛණ්ඩනිමිත්තසීමා' යනු නිමිති නොගැටීම යැයි කියනු ලැබේ. බද්ධ සීමාවක් සම්මත කිරීමේ දී නැගෙනහිර දිසාවෙහි නිමිත්ත කීර්තනය කොට පිළිවෙළින් දකුණු දිසාවෙහි බටහිර දිසාවෙහි උතුරු දිසාවෙහි නිමිත් කීර්තනය කොට නැවත නැගෙනහිර දිසාවෙහි පළමුව කීර්තනය කළ නිමිත්ත කීර්තනය කොටම අවසන් කළ යුතුය. මෙසේ අඛණ්ඩ නිමිත්ත වෙයි. ඉදින් පිළිවෙළින් අවුත් උතුරු දිසාවෙහි නිමිත්ත කීර්තනය කොට එහි ම තබයි ද ඛණ්ඩ නිමිත්ත වේ.[2] එබැවින් නැගෙනහිර දිසාවෙන් පටන් ගෙන යම් යම් දිසාවන්ට අභිමුඛව නිමිති පිහිටුවා තිබේ ද ඒ ඒ දිසාවන් ට අභිමුඛව ඇති නිමිති පිළිවෙළින් කීර්තනය කොට අවුත් නැවත නැගෙනහිර දිසාවේ ඇති මුලින් කීර්තනය කළ නිමිත්ත කීර්තනය කටයුතුය. එසේ සිදු කිරීමෙන් නිමිති කීර්තනය නිවැරදි ලෙස සිදු කළා වේ. නැවත නැගෙනහිර දිසාවෙහි ඇති පළමුව කීර්තනය කළ නිමිත්ත කීර්තනය නොකිරීමෙන් ඛණ්ඩනිමිත්ත යන විපත් සීමාව හටගනී. තව ද නිමිත්තුපග නොවූ අරටුව නැති ගසක් හෝ කණුවක් හෝ පස්ගොඩැලි වැලිගොඩැලි අතුරින් එකක් අතරතුර ඒකි නිමිත්තක් කොට සම්මත කරන ලද්දේ වේ ද මෙය ද ඛණ්ඩ නිමිත්ත නම් වේ.[3] ඡායානිමිත්තසීමා නම් පර්වතඡායාදීන් අතුරින් යම් කිසි ඡායාවක් නිමිත්ත කොට සම්මත කරන ලද්දේ වේද එයයි.[4] එබැවින් සීමාසම්මත කරන්නවුන් විසින් පබ්බත, පාසාන, වන, රුක්ඛ, මග්ග, වම්මික, නදී, උදක යන නිමිති අට දත යුතුය. ඒවා අතුරින් නිමිති එක ම වර්ගයකින් හෝ වර්ග දෙකතුනකින් හෝ මිශ්‍ර කොට සීමාව සම්මත කිරීමට සුදුසු ය. සීමාව බඳිනු ලබන කල්හි එක් නිමිත්තකින් හෝ දෙකකින් හෝ බැඳීමට නුපුළුවන. නිමිති තුනේ පටන් බැඳීමට පුළුවන. නිමිති පිළිබඳව

1. සම.පා. **IV, 1044** පිට හේ.මු.
2. -එම-
3. සම.පා. **IV, 1044** පිට හේ.මු.
   කංඛාවිතරණී මාතිකට්ඨකථා, සංස්. කරඳන ජිනරතන හිමි, **1930 04** පිට හේ.මු.
4. කංඛාවිතරණී මාතිකට්ඨකථා, සංස් කරඳන ජිනරතන හිම **1930, 05** පිට හේ.මු.

උපෝසථක්ඛන්ධක අටුවාවෙහි හා පාලිමුත්තක විනයවිනිච්ඡයෙහි වැඩිවිස්තර ඇතුළත් වේ.[1] අනිමිත්තසීමා නම් යම් සීමාවක් සියල්ලෙන් සියල්ල නිමිති කීර්තනය නොකොට සම්මත කරන ලද්දේ වේ ද එයයි.[2] බහිසීමෙඨිතසම්මතසීමා යනු නිමිති කිර්තනය කොට නිමිතිවලින් බැහැර සිට සම්මත කිරීමයි.[3] එබැවින් නිවැරදි ලෙස නිමිති කීර්තනය කරගත් පසු එම කීර්තනය කළ නිමිති ඇතුළත ම සිට කර්මවාක්‍ය කියා සම්මත කටයුතුය. එම නිමිතිවලින් බැහැර සිට කර්මවාක්‍යය කීමෙන් සීමාව සම්මත නොවේ. නදියෙහි සම්මත, සමුද්‍රයෙහි සම්මත, ජාතස්සරයෙහි සම්මත සීමා යනු නදී ආදියෙහි යම් බද්ධ සීමාවක් සම්මත කරයි ද එම බද්ධසීමාව සම්මත කළේ වුව ද **"සබ්බා භික්ඛවේ, නදී අසීමා සබ්බෝ සමුද්දෝ අසීමෝ සබ්බෝ ජාතස්සරෝ අසීමෝ"**[4] යන බුද්ධවචනයෙන් සම්මත නොවේ. නදීසමුත්තජාතස්සරයන්හි බද්ධසීමා සම්මත කිරීමට නුපුළුවන. එම නදී ආදිය බද්ධ සීමාවන්ට ස්ථානයෝ නොවෙති. ඒවා අබද්ධ සීමා සංඛ්‍යාත වූ උදකුක්ඛෙප සීමාවට ස්ථානයෝ වෙති. 'සීමාවෙන් සීමාව සම්භින්දනය කිරීම' යනු තමන්ගේ සීමාවෙන් වෙනත් සීමාවක් සම්බන්ධ කොට සම්මත කිරීමයි. බද්ධසීමාවක් සම්මත කර ඇති පැරැණි විහාරයක අභිනව සීමාවක් සම්මත කිරීමේදී පැරණි සීමාවෙන් කොටසක් නොදැනුවත්ව හෝ සටා සම්මත කරන්නේ නම් එය විපත් සීමාවක් වේ. සම්මත කරන ලද අභිනව සීමාව සම්මත නොවේ.[5] "සීමායසීමං අජ්ඣොත්තරණ සීමා' යනු තමන්ගේ සීමාවෙන් වෙනත් බද්ධ සීමාවක් යට කොට සම්මත කිරීමයි. එනම් වෙනත් බද්ධසීමාවක් මුළුමනින් ම හෝ කොටසක් හෝ ඇතුළත් කොට අභිනව බද්ධ සීමාවක් සම්මත කරයි ද එය සීමාය සීමං අජ්ඣොත්තරණත්තේන සම්මතා සංඛ්‍යාවට යයි. සීමා පිළිබඳ වැඩි විස්තර උපොසථක්ඛන්ධ අටුවාවෙහි සහ එම ටීකාවන්හි දැක්වේ. ඉහත දැක්වූ එකොළොස් විපත් සීමාවන්හි සිදුකරනු ලබන සියලු ම විනයකර්මයෝ අසිද්ධියට පත් වෙති.

---

1. සම.පා. **III, 776** පිට හේ.මු.
   පාලිමුත්තක විනයවිනිජ්ඡය, සංස්. දෙහිගස්පේ පඤ්ඤාසාර හිමි, **1931, 174.**
2. කංඛාවිතරණී මාතිකට්ඨකථා, සංස්. කරඳන ජිනරතන හිමි, **1930, 05** පිට හේ.මු.
3. සම.පා **IV, 1044** පිට හේ.මු. / මහාවග්ග, උපොසථක්ඛන්ධක.
4. මහාවග්ග **I**, උපොසථක්ඛන්ධක.
5. කංඛාවිතරණී මාතිකට්ඨකථා, සංස්. කරඳන ජිනරතන හිමි, **1930, 05** පිට හේ.මු.

**පිරිස වශයෙන් කෝප්‍ය වීම** යනු විනය කර්ම සඳහා '**චතුවාර්ගික, පංචවාර්ගික, දසවාර්ගික, වීසතිවාර්ගික, අතිරේක වීසතිවාර්ගික**' යන භික්ෂූන් පිරිසිදු සීලයෙන් සමන්විතව නොසිටීම හෙවත් පරිජි ඇවතකට පත්ව සිටීමයි. පිරිස වශයෙන් කෝප්‍ය වීමේදී විනය කර්ම දොළොස් අයුරකින් අසිද්ධියට පත් වේ.

1. චතුවාර්ගික කර්මයෙහි යම් පමණ භික්ෂූහු කර්මප්‍රාප්ත වේ ද ඔවුහු නොපැමිණියාහු වෙති. ඡන්දයට සුදුසු වූවන්ගේ ඡන්දය නොගෙනෙන ලද්දේ වේ. සම්මුඛීභූත භික්ෂූහු පටික්කෝසනය (වැළැක්වීම) කෙරෙත්.

2. චතුවාර්ගික කර්මයෙහි යම් පමණ භික්ෂූහු කර්මප්‍රාප්ත වෙත් ද ඔවුහු පැමිණියාහු වෙති. ඡන්දයට සුදුසුවූවන්ගේ ඡන්ද ගෙන නොඑන ලද්දේ වේ. සම්මඛීභූත භික්ෂූහු පටික්කෝසන කෙරෙත්.

3. චතුවාර්ගික කර්මයෙහි යම් පමණ භික්ෂූහු කර්මප්‍රාප්ත වෙත් ද ඔවුහු පැමිණියාහු වෙත්. ඡන්දයට සුදුසු වූවන්ගේ ඡන්දය ගෙනෙන ලද්දේ වේ. සම්මුඛීභූත භික්ෂූහු පටික්කෝසනය කරන ලද්දාහු වෙති.

පංචවාර්ගික, දසවාර්ගික, වීසතිවාර්ගික කර්මයන්හිදී ද මේ ආකාරයෙන් ම දත යුතු අතර මෙලෙස දොළොස් අයුරකින් පිරිස වශයෙන් කර්ම කෝප්‍ය වේ.[1]

චතුවාර්ගික කර්මයකදී භික්ෂූහූ සතර නමක් කර්මප්‍රාප්ත වන අතර එම සතර නම පිරිසිදු සීලයෙන් සමන්විත විය යුතුය. පිරිසිදු සීලයෙන් සමන්විත වීම යනු පරිජි ඇවැතකට පත්ව නොසිටීමයි. එම හතර නම චතුවාර්ගික කර්මයට ස්වාමීහු වන බැවින් ඔවුන්ගේ ඡන්දය හෝ පාරිශුද්ධිය හෝ නොපැමිණෙත්.[2] විහාරසීමාව තුළ සෙසු භික්ෂූන් සියනමක් පමණ සිටිය ද ඔවුහු සමාන සංවාසක නම් ඡන්දයට සුදුසු වෙති.[3] එම ඡන්දයට සුදුසු වූවන්ගෙන් ඡන්දය හෝ ගත යුතුය.

1. පරිවාරපාලි **II**, කම්මවග්ග, **302** පිට
2. සම.පා **IV**, කම්මවග්ග, **1045** පිට හේ.මු.
3. - එම -

නොඑසේ නම් එම සීමාවෙන් හෝ බැහැර කළ යුතුය. මෙලෙස එම සීමාව තුළ ඡන්දයට සුදුසු වූ භික්ෂූන්ගෙන් ඡන්දය නොගෙන විනය කර්ම සිදු කිරීමෙන් සංඝයා වර්ගවීමෙන් විනය කර්ම අසිද්ධියට පත් වේ. මහාවග්ගපාලි උපොසථක්ඛන්ධයෙහි ඒ බව **'නත්වේව වග්ගේන සංඝේන කම්මං කාතබ්බං කරෙය්‍ය චේ, ආපත්ති දුක්කටස්ස'**[1] යනුවෙන් සඳහන් වේ.

## ඡන්දපාරිවාසිය

විනය කර්මයනට ඡන්දදීමේදී සහ ගෙනඒමේදී විශේෂයෙන් දතයුතු කරුණු ඇත. ඡන්දය දෙන සහ ගන්නා භික්ෂුව ඔවුනොවුන් අත්පස (රියන් දෙකහමාරක දුරකින්) සිටිය යුතුය. ඡන්දය දිය යුත්තේ උපසපන් භික්ෂුවකට වන අතර ඡන්දය ගත යුත්තේ ද උපසපන් භික්ෂුවකගෙන් ම ය. ඡන්දය ගන්නා වූ භික්ෂුවකට ඡන්දාරහ භික්ෂූන් සියනමකගෙන් වුව ද ඡන්දය ගත හැකිය. ඡන්දය දීම කයින් ද වචනයෙන් ද කයින් හා වචනයෙන් ද සිදුකළ හැක.[2] ඡන්දය ගත් භික්ෂුව සඟමැදට පැමිණීමෙන් ම ඡන්දය පැමණියා වේ. භික්ෂුවක් වෙනත් භික්ෂුවකගෙන් ඡන්දය ගත් විට එම ගත් ඡන්දය අන් භික්ෂුවකට දීමට නුපුළුවන. එම ඡන්දය ගත් භික්ෂුවගේ සිය ඡන්දය වෙනත් භික්ෂුවකට දීමට හැකි වුව ද තමන් මුලින් ගත් වෙනත් භික්ෂුවකගේ ඡන්දය සඟ මැදට නොපැමිණෙයි. මෙය **'බිළාල සංඛලික ඡන්දදාන'** නමින් හැඳින්වේ.[3] විනයවිනිච්ඡයෙහි 2664 ගාථාවෙහි ද මේ බව සඳහන් වේ.

> **"ඡන්දේකේන බහුන්නම්පි හාතබ්බෝ පාරිසුද්ධිපි,**
> **පරම්පරාහටෝ ඡන්දෝ න ගච්ඡති විසුද්ධියා."** [4]

ඡන්දහාරක භික්ෂුව ඡන්දය ගෙනවුත් සඟ මැදදී දැන දැන එය ප්‍රකාශ නොකරයි නම් ඡන්දහාරක භික්ෂුවකට දුකුලා ඇවැතක් වේ. නමුත් ඡන්දය සඟ මැදට පැමිණියේ වේ.[5]

---

1. මහාවග්ග **I,** උපොසථක්ඛන්ධක, **290** පිට
2. -එම -
3. සම.පා. **III, 792** පිට හේ.මු.
4. විනිශ්වයාර්ථදීපනී නම් විනයවිනිච්ඡය විස්තරාර්ථ වාක්‍යානය
   ලංකාගොඩ ශ්‍රී ධීරානන්ද හිමි, **1957, 586** පිට
5. මහාවග්ග **I,** උපොසථක්ඛන්ධක, **292.** පිට, **74** වජිරබුද්ධිටීකා, පාරිවාසික ඡන්දදාන සික්ඛාපද.

චතුවාර්ගික කර්මයකදී ඡන්ද පැමිණවීමට අවම වශයෙන් උපසපන් භික්ෂූන් සතර නමක් ද පංචවාර්ගික කර්මයකදී උපසපන් භික්ෂූන් පස්නමක් ද සිටිය යුතුය. එයින් එක් නමක් හෝ අඩු වුවහොත් ඡන්දය නොපැමිණේ. දසවාර්ගික කර්මයකදී ඡන්දය පැමිණවීමට උපසපන් භික්ෂූන් දස නමක් සිටිය යුතුය. දශවාර්ගික සංඝයාට පැමිණෙන ඡන්දය චතුවාර්ගික හා පංචවාර්ගික සංඝයාට නොපැමිණේ. වීසතිවාර්ගික කර්මයකදී ඡන්දය පැමිණවීමට අවම වශයෙන් උපසපන් භික්ෂූන් විසිනමක් සිටිය යුතුය.[1]

පාරිවාසික ඡන්දයෙන් විනය කර්ම සිදු කරන්නේ නම් එයින් ද කර්ම අසිද්ධියට පත් වනු ඇත. පාරිවාසික ඡන්දය යනු කල් ඉකුත් වූ (විගත) ඡන්දයයි. පාරිවාසිය සිව්වැදෑරුම් වේ. එනම් පරිස, රත්ති, ඡන්ද, අජ්ඣාසය පාරිවාස යනුවෙනි.[2] මෙම පාරිවාසිය ක්‍රම සතර අතුරින් එකක්ම වූ ඡන්දපාරිවාසියෙන් විනය කර්ම අසිද්ධියට පත් වන අතර වජිරබුද්ධි ටීකාවෙහි මේ පිළිබඳ වැඩි විස්තර සඳහන් වේ.[3]

චතුවාර්ගික කර්මයක භික්ෂුණියක, සාමණේරියක, සාමණේරයකු ශික්ෂමානාවක, පරිජි වූවකු, මාතුඝාතකයකු, පීතුඝාතකු, ලෝහිතුප්පාදකයකු, සංඝභේදකයකු භික්බුනී දූෂකයකු අරහන්තඝාතකයකු, ත්‍රිවිධ උක්ඛිත්තකයන් අතුරින් එකකු (කම්මනානාසංවාසකයකු), නානාසංවාසකයකු (ලබ්ධි), තිත්ථිය පක්ඛන්තකයකු, උභතෝ බ්‍යඤ්ජනකයකු, පණ්ඩකයකු ථෙය්‍යසංවාසකයකු, තිරච්ඡානගතිකයකු, නානාසීමාවක සිටියකු, ඍද්ධියෙන් අහසෙහි සිටියකු යන මොවුන්ගෙන් කවුරුන් හෝ ගණපූරණය කොට කර්ම කරන්නේ නම් එම කර්ම, සිද්ධියට පත් නොවේ.[4]

පිරිවෙස් මානත් දෙන, මූලායපටිකස්සනය කරනු ලබන, අබ්භානය කරනු ලබන, විනය කර්මයන්හි දී පාරිවාසික (පිරිවෙස් පුරන), මානාන්තාරහ, මානත්තචාරික, මූලාය පටිකස්සනාරහ, අබ්භානාරහ යන භික්ෂූන් සිව්වැනි කොට හෝ විසිවැනි කොට එම විනය කර්ම සිදු

1. වජිරබුද්ධිටීකා, පාරිවාසික ඡන්දදාන සික්ඛාපද.
2. 'තත්ථ චතුබ්බිධං පාරිවාසියං පරිසපාරිවාසියං, රත්තිපාරිවාසියං, ඡන්දපාරිවාසියං අජ්ඣාසයපාරිවාසියන්තිත සම.පා. **II,** භික්ඛුනී විභංග, **702** පිට හේ.මු., අජ්ඣාසපාරිවාසින්ති ත
3. වජිරබුද්ධිටීකා, පාරිවාසික ඡන්දදාන සික්ඛාපද
4. මහාවග්ග **II,** චම්පෙය්‍යක්ඛන්ධක, **774** පිට

කිරීමෙන් අසිද්ධියට පත් වේ. එබැවින් එබඳු වූ කර්මයන්හි දී ඉහත කී භික්ෂූන් ගණ පූරණය කොට විනය කර්ම නොකළ යුතුය.[1] සෙසු කර්මයන්හි දී ගණ පූර්ය වේ.[2]

## පටික්කෝසනය

සම්මුඛීභූත භික්ෂූන්ගේ පටික්කෝසනයෙන් ද සිදුකරනු ලබන විනය කර්ම කෝප්‍ය වේ. සවග (ඡබ්බග්ගිය) භික්ෂූහු සඟ මැද අධර්ම කර්ම කළහ. ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ '**න භික්ඛවේ, අධම්මකම්මං කාතබ්බං යෝ කරෙය්‍ය, ආපත්ති දුක්කටස්ස**' යනුවෙන් අධර්මකර්ම නොකළ යුතු බවත් යමෙක් කරන්නේ ඔහුට දුකුළා ඇවැතක් වන බවත් පණවා වදාළ සේක. පසුව ද සවග භික්ෂූන් සඟ මැද අධර්ම කර්ම සිදු කළ හෙයින් '**අනුජානාමි භික්ඛවේ, අධම්මකම්මේ කයිරමානේ පටික්කෝසිතුං**' යනුවෙන් මහණෙනි, අධර්මකර්ම කරනු ලබන කල්හි වළකාලන්නට අනුදනිමි යැයි දෙසූහ. සුපේසල භික්ෂූහු සවග භික්ෂූන් අධර්මකර්ම කරනු ලබන කල්හි පටික්කෝසනය කරති. මෙහි දී සවග භික්ෂූහු කෝප වූහ. ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ '**අනුජානාමි භික්ඛවේ, දිට්ඨිම්පි අවිකාතුං**' යනුවෙන් මහණෙනි, දෘෂ්ටිය ප්‍රකාශ කිරීමට අනුදනිමි යයි දෙසූ සේක. එසේ ද කරනු ලබන කල්හි සවග භික්ෂූහු කිපුණාහ. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ '**අනුජානාමි භික්ඛවේ, චතූහි පංචහි පටික්කෝසිතුං. ද්වීහි තීහි දිට්ඨිං ආවිකාතුං එකේන අධිට්ඨාතුං න මේ තං ඛමති**' යනුවෙන් සතර පස්දෙනකුන් විසින් වළකාළන්නටත් දෙතුන් දෙනෙකුන් විසින් දෘෂ්ටිය ප්‍රකාශ කිරීමටත් එකකු විසින් මෙය මට රුචි නොවේ යැයි ඉටන්නටත් අනුදන වදාළ සේක.[3] එහි '**පටික්කෝසිතුං**' යනු වැළැක්වීමටය. **(පටික්කෝසිතුන්ති වාරෙතුං) දිට්ඨිම්පි ආවිකාතුං** යනු මෙම අධර්ම කර්මය මට රුචි නොවේ යැයි මෙසේ අනෙකකුගේ සමීපයෙහි තමාගේ දෘෂ්ටිය ප්‍රකාශ කිරීමය. **(දිට්ඨිම්පි ආවිකාතුන්ති 'අධම්මකම්මං ඉදං න මේ ඛමතී' ති ඒවං අඤ්ඤස්ස සන්තිකේ අත්තනෝ දිට්ඨිං පකාසේතුං)** චතූහි පංචහි යනාදිය ඔවුන්ට උපද්‍රවයන් නොවනු පිණිස කියන

1. මහාවග්ග II, චම්පෙය්‍යක්ඛන්ධක, 778 පිට
2. සම.පා IV, පාරිවාසිකක්ඛන්ධක වණ්ණනා, 867 පිට හේ.මු.
3. මහාවග්ග I, උපොසථක්ඛන්ධක, 276 පිට

ලද්දේය. (**චතුහිපංචහීති ආදි තේසං අනුපද්දවත්ථාය වුත්තං**)[1.] මේ බව විනය විනිච්ඡයෙහි 3100 ගාථාවෙහි ද මෙලෙස සඳහන් වේ.

"**අධිට්ඨානං පනේ'කස්ස ද්වින්නං වා තිණ්නමේව වා,**
**දිට්ඨාවිකම්මමුද්දිට්ඨං තතෝ උද්ධං නිවාරණං.**"[2] යනුවෙනි.

විනයවිනිච්ඡයෙ සඳහන් මෙම ගාථාව පිළිබඳව විනය විනිච්ඡය ටීකාවෙහි මෙලෙස විස්තර වේ. සංඝයා විසින් අධාර්මික කර්ම කරනු ලබන කල්හි එය වැළැක්වීමට නොහැකි වන්නකු විසින් හෝ නොහැකි වන්නවුන් විසින් පිළිපැදිය යුතු ආකාරය දැක්වීමට '**අධිට්ඨානං**' යනාදිය කීහ. අධාර්මික කර්ම කරනු ලබන භික්ෂූන් අතරෙහි හිඳ අධාර්මික කර්මයක් යැයි දන එය වැළැක්වීමට නොහැකි වන්නාවූ එක් භික්ෂුවකට '**න මේතං ඛමති**' යැයි සිතින් අධිෂ්ඨානය කිරීමට භාග්‍යවතුන් වහන්සේ විසින් උදෙසන ලද්දේ වෙයි. '**ද්වින්නං වා තිණ්ණමේව වා**' යනු එබඳු වූ අධාර්මික කර්මයක් වැළැක්විමට නොහැකි වන්නාවූ භික්ෂූන් දෙදෙනෙකුට හෝ තුන් දෙනෙකුට එකිනෙකා '**න මේතං ඛමති**' යැයි දිට්ඨාවිකම්මය හෙවත් ස්වකීය අදහස (දෘෂ්ටිය) ප්‍රකාශ කිරීමට උදෙසන ලද්දේ ය යන අදහසයි. '**තතෝ උද්ධං**' යනු තුන්නමකට වඩා වැඩි වීමය. භික්ෂූන් තුන්නමට වඩා වැඩි වූ කල්හි '**ඉදං අධම්මකම්මං මා කරෝථ**' යැයි ප්‍රතික්ෂේපනය උදෙසන ලද්දේ ය යන අරුතයි.[3] භික්ඛුනී විභංගයෙහි සිව්වැනි සංඝාදිසේස සික පදයේ නිදානයෙහි කලහ විවාද කරන, සංඝයා වෙත අධිකරණ ඇතිකරන, චණ්ඩකාලී භික්ෂුණියට සංඝයා කර්ම කරනු ලබන කල්හි ථුල්ලනන්දා භික්ෂුණිය එම කර්ම පටික්කෝසනය කළ බව සඳහන් වේ. ඉන්පසු ථුල්ලනන්දා භික්ෂුණිය කිසියම් කටයුත්තක් සඳහා ගමට ගිය අවස්ථාවකදී භික්ෂුණී සංඝයා රැස් ව චණ්ඩකාලී භික්ෂුණියට ඇවැත් නොදකීමෙහි උක්ඛේපනීය කර්මය කළහ.[4] මෙම සිදුවීමට අනුව එක් පුද්ගලයකුගේ වුව ද පටික්කෝසනයෙන් විනය කර්මය අසිද්ධියට පත්වන බව දත යුතුය.

---

1. සම.පා. **III** උපොසථක්ඛන්ධක **790** පිට හේ.මු.
2. විනිශ්චයාර්ථදීපනී නම් විනයවිනිච්ඡය විස්තරාර්ථ ව්‍යාඛ්‍යානය
   ලංකාගොඩ ශ්‍රී ධීරානන්ද හිමි, **1957, 688** පිට
3. විනය විනිච්ඡය ටීකා, පකිණ්ණකනය විනය විනිච්ඡය, ඡට්ඨසංගායනා, **352 - 353** පිට
4. පාචිත්තිය පාලි **II**, භික්ඛුනී විභංග. **48 - 50** පිට

ධාර්මික විනය කර්ම පටික්කෝසනය නොකළ යුතු අතර ඡන්දය හෝ කාය සාමග්‍රිය නොදී සිටිය නොයුතුය. ධාර්මික විනය කර්ම පටික්කෝසනය කිරීමෙන් දුකුළාවකට පත් වන අතර ඡන්දය හෝ කායසාමග්‍රිය නොදී සිටීමෙන් ද දුකුළා ඇවැතකට පත් වේ. ඒ බව විනය විනිච්ඡයෙහි 2600 ගාථාවෙහි පැහැදිලිව සඳහන් වේ.

**"කොපෙතුං ධම්මිකං කම්මං පටික්කෝසෙය්‍ය දුක්කටං,**
**ඡන්දං වා කායසාමග්ගිං අදෙන්තස්සපි දුක්කටං."[1]**

සඟ මැද ඇතැමකුගේ පටික්කෝසනය රුහනය වේ. ඇතැමකුගේ පටික්කෝසනය රුහනය නොවේ. (භික්ඛුනියකගේ, සික්ඛමානාවකගේ, සාමණේර යනාදීන්ගේ පටික්කෝසන සඟ මැද රුහනය නොවේ.) කවරකුගේ පටික්කෝසනය සඟ මැද රුහනය වේ ද යත් : විනය කර්මයක් සඳහා සංඝයා රැස්ව සමාන සංවාසක සීමාවක සිට එය සිදු කරනු ලබන කල්හි ප්‍රකෘති භික්ෂුවක් යටත් පිරිසෙයින් තමන් අසල සිටින භික්ෂුවකට හෝ දන්වයි නම් ඔහුගේ පටික්කෝසනය රුහනය වේ.[2] ඉහත සඳහන් කළ ඇතැමකුගේ පටික්කෝසනය සඟ මැද රුහනය වේ ය යන්න සමන්තපාසාදිකා විනය අටුවාවෙහි **'එකස්ස භික්ඛවේ සංඝමජ්ඣෙධ පටික්කෝසනා රුහතීති ආදි පටිකුට්ටකටකම්මස්ස කුප්පාකුප්පභාවදස්සනත්ථං වුත්තං'**[3] යනුවෙන් 'පටික්කෝසනය කරන ලද කර්මයාගේ කෝප්‍ය අකෝප්‍ය භාවය දැක්වීම පිණිස කියන ලද්දේ' යැයි සඳහන් කොට ඇත. අටුවාවෙහි එන **'කුප්පාකුප්පදස්සනත්ථං'** යන ප්‍රකාශයට අනුව එක් භික්ෂුවකගේ පටික්කෝසනයෙන් වුව ද විනය කර්ම අසිද්ධියට පත් වන බව මනාව පැහැදිලිය.

ඉදින් කර්මය පටන් ගෙන නොනිමි කල්හි යමෙක් එය පටික්කෝසනය කරයි ද ඔහුට කරුණු හඟවා (අවබෝධ කරවා) එම කර්මය නැවත කළ යුතුය.[4] මේ බව විනයවිනිච්ඡයෙහි ද (1669 ගාථාවෙහි) සඳහන් වේ.

1. විනිශ්චයාර්ථදීපනී නම් විනයවිනිච්ඡය විස්තරාර්ථ ව්‍යාඛ්‍යානය ලංකාගොඩ ශ්‍රී ධීරානන්ද හිමි, **1957, 575** පිට
2. මහාවග්ග **II**, චම්පෙය්‍යක්ඛන්ධක **780**, පිට
3. සම.පා. **III** චම්පෙය්‍යක්ඛන්ධක, **851** පිට හේ.මු.
4. කංඛාවිතරණී මාතිකට්ඨකථා, සංස්. කරදන ජිනරතන හිමි, **1930, 126** පිට හේ.මු.

"සචේ විප්පකතේ කම්මේ පටික්කෝසති තං පුන,
සඤ්ඤාපෙත්වා'ව කාතබ්බාං න පන'ඤ්ඤතා."[1]

මෙහිලා කරුණු හැඟවීම යන්නෙන් අදහස් කෙරෙන්නේ කළ කර්මයාගේ නිවැරදි බව හෙවත් ධාර්මික බව එම පටික්කෝසනය කළ භික්ෂුවට දන්වා කර්මය නැවත කිරීමයි.[2] ඉහත දක්වන ලද ආකාරයට පිරිස හේතුකොට ගෙන කර්මයෝ කෝප්‍ය වෙති.

නමුත් මෙහිලා විශේෂයෙන් දත යුත්තක් ඇත. එනම් පටික්කෝසනයෙහි ලා අවම සීමාව දක්වන භාග්‍යවතන් වහන්සේ චම්පෙය්‍යක්ඛන්ධකයේදී **'අන්තමසෝ ආනන්තරිකස්සාපි භික්ඛුනෝ විඤ්ඤාපෙන්තස්ස සංඝමජ්ඣේ පටික්කෝසනා රූහති'**[3] යැයි දේශනා කළ හෙයින් හුදෙක් **'න මේතං ඛමති'** යැයි අධිෂ්ඨාන වශයෙන් කරනු ලබන පටික්කෝසනය මගින් පමණක් කර්මය කෝප්‍ය වන බවක් පෙනෙන්නට නැත. එසේ නම් අධිෂ්ඨාන වශයෙන් කරනු ලබන පටික්කෝසනය නිරර්ථක දැයි කෙනෙකුට ප්‍රශ්නයක් පැන නැඟිය හැකිය. අධිෂ්ඨාන වශයෙන් දැක්වෙන පටික්කෝසනය දේශනා කොට ඇත්තේ අධාර්මික කර්මයන්ට කායසාමග්‍රිය දීම හේතුවෙන් සිදුවන ආපත්තියෙන් මිදීමේ උපායක් වශයෙනි.

අපලෝකන කර්මාදී චතුර්විධ විනය කර්ම සිද්ධියට පත්වීමට නම් ඒවා ඉහත දැක්වූ වස්තු ආදී කෝප්‍යවීමකින් තොරව සිදු කළ යුතු අතර එසේ නොමැතිව හුදෙක් විනය කර්ම සිදු කළ පමණින් ඉන් අපේක්ෂිත ක්‍රියාවලිය විනයානුකූලව සිද්ධියට පත් නොවනවා සේ ම විනය ප්‍රඥප්තීන් පැනවීමෙන් භාග්‍යවතුන් වහන්සේ අපේක්ෂා කළ පරමාර්ථ ද එමගින් ඉටු නොවන බවත් විශේෂයෙන් දත යුතුය.

---

1. විනිශ්චයාර්ථදීපනී නම් විනයවිනිච්ඡය විස්තරාර්ථ ව්‍යාඛ්‍යානය, ලංකාගොඩ ශ්‍රී ධීරානන්ද හිමි, **1957**, **368** පිට
2. 'සඤ්ඤාපෙත්වාති තනකම්මස්ස අනවජ්ජභාවං ඤාපෙත්වා,' විනයවිනච්ඡය ටීකා. **1669** ගාථාව
3. මහාවග්ග **II**, චම්පෙය්‍යක්ඛන්ධක, **780** පිට

# අටුවාව පිළිබඳ කෙටි හැඳින්වීමක්

බුදුසසුන වූ කලී පරියත්ති ශාසනය, ප්‍රතිපත්ති ශාසනය, ප්‍රතිවේද ශාසනය යනුවෙන් තෙවැදෑරුම් වන්නකි. පිටකත්‍රය සංගෘහිත වූ සියලු ම බුද්ධවචනය එහි පරියත්තිය බැව් ප්‍රකට ය. තෙලෙස් ධුතගුණ, තුදුස් කඳුවත්, සීල, සමාධි විපස්සනාවෝ ප්‍රතිපත්ති ශාසනය වන අතර සතර මග ඵල නිවන වනාහි ප්‍රතිවේධ ශාසනය නම් වෙති.

පරියත්ති ශාසනයෙහි ඇතුළත් බුද්ධ භාෂිතය වනාහි රස වශයෙන් එක්විධ ය, ධර්ම විනය වශයෙන් දෙවැදෑරුම් ය, ප්‍රථම මධ්‍යම, පශ්චිම වශයෙන් ත්‍රිවිධ ය, එසේ ම පිටක වශයෙන් ද ත්‍රිවිධ ය, නිකාය වශයෙන් පංචවිධ ය. අංග වශයෙන් නව විධ ය.[1] සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වේදල්හ යනුවෙන් පිටකත්‍රය පරියාපන්න වූ නවංගසත්ථු ශාසනය හැදෑරීමෙහි ආනිසංස හතරක් අංගුත්තර චතුක්ක නිපාතයෙහි සෝතානුධත සූත්‍රයෙහි දක්වා ඇත.[2] එබැවින් සසුන්බට කුල පුත්‍රයන් කොයි කවුරුත් පාහේ හැකි හැකි අයුරින් ත්‍රිපිටක පරියප්ති ශාසනය පෞරාණික ථෙරවාදී මහාවිහාරීය ක්‍රමවේදයට අනුව හැදෑරීමට උත්සාහවත් විය යුතුය. එය වූ කලී සසුන් දියුණුවට ඍජුව ම හේතුවන්නක් බැව් ද දත යුතුය.

## අටුවාව

**"ආචරියවාදො නාමෝ ධම්ම සඞ්ගාහකේහි පංඤ්චහි අරහන්තසතේහි ඨපිතං පාළි විනිම්මුත්තා ඔක්කන්තික විනිච්ඡයපවත්තා අට්ඨකථාතන්ති"**[3] යනුවෙන් සමන්තපාසාදිකාවෙහි "ආචාර්යවාදය නම් ධර්ම සංගාහක පන්සියයක් මහරහතන් වහන්සේලා විසින් තබන ලද පෙළෙන් මිදුණු බැසගත් විනිශ්චය පවත්නා අට්ඨකථා තන්තිය යනුවෙන් අටුවාව හෙවත් ආචාර්යවාදය පිළිබඳ එන්නා වූ විස්තර විවරණයකි මේ. සුත්ත, සුත්තානුලෝම, ආචාර්යවාද,

1. සුමංගලවිලාසිනී I පිට 11-12 හේ.මු.
2. අංගුත්තරනිකාය II පිට 358 බු.ජ.ත්‍රි.
3. සම.පා I පිට 162 හේ.මු.

අත්තනෝමති යනුවෙන් පැවසෙන චතුර්විධ විනයෙහි දැක්වෙන තුන්වැන්න ආචාර්යවාදය නම් වූ අටුවාවයි. මිලින්ද ප්‍රශ්නයෙහි **ආහච්ච පද, රස, ආචරිය වංස, අධිප්පාය**[1] යනුවෙන් පැවසෙන්නේ ද ඉහතින් කී චතුර්විධ විනය මැයි. එහි ආචරියවංස නම් යථෝක්ත අටුවාව බැව් නිශ්ශිත ය. විනය පාළියෙහි නොයෙක් තැන පැවසෙන "**උද්දේස පරිපුච්ඡා**"[2] දෙකින් පවා කියවනුයේ පෙළ, අටුවා දෙක ය. අටුවාවෙහි "**උද්දේසේති පාළි පරියාපුනනේ පරිපුච්ඡායාති අත්ථ සවනේ**"[3] යනුවෙන් පවසන ලද්දෙන් උක්ත කාරණය ප්‍රකටය. එබැවින් පෙළ දහමෙහි අරුත් තැබීම හෙවත් අත්ථසංවර්ණණා ක්‍රමය බුදු පියාණන් වහන්සේ දිවමන් කල්හි ම පැවැත්තක් බැව් දත යුතුය.

යථෝක්ත අර්ථ සංවර්ණණාව සිදුකරන බැවින් නිරුත්ති නයින් "**අත්ථෝ කථීයති ඒතායාති අත්ථකථා ත්ථකාරස්ස ට්ඨකාරං කත්වා**" යනුවෙන් එය කරනකොට අර්ථය කියන්නේ නුයි අත්ථකතා (අර්ථකතා) නම්. 'ත්ථකාරයට' 'ට්ඨකාරය' කොට එය ම අට්ඨකථා වේ යැයි පවසන ලදී.[4] ඒ ඒ තැන භාග්‍යවතුන් වහන්සේ විසින් පවත්වන ලද ප්‍රකීර්ණක දේශනය අටුවාව බැව් "**තත්ථ තත්ථ භගවතා පවත්තිත පකිණ්නක දේශනාව අට්ඨකථා**"[5] යනුවෙන් සඳහන් ය. එ අටුවාව වනාහී ධර්ම සංගාහක 500ක් මහරහතන් වහන්සේලා විසින්, පළමුව තුන් පිටකය සංගායනා කොට එහි අර්ථ සංවර්ණානුරූප වූ වාචනාමාර්ගය ආරෝපිත බැවින් ආචාර්යවාද යනුවෙන් සාරත්ථදීපනියෙහි ම සඳහන් ය.[6]

වජිරබුද්ධි ටීකාවෙහි ද සියලු අටුවාවන් සංගීතයට නංවා පෙළෙන් වෙන්කොට වෙන ම තබන ලද්දක් බව සඳහන් ය.[7] සංගීතිත්‍රයට ම නංවන ලද බුද්ධ වචනයාගේ අර්ථ සංවර්ණනාව වූ කතාමාර්ගය මිහිඳු මහරහතන් වහන්සේ විසින් තම්බපණ්ණි දීපයට ගෙන එන ලදුව පසුව තම්බපණ්ණි දීපයෙහි මහතෙරවරු විසින් නිකායතන්තර සංකර ලබ්ධි දුරු කිරීම පිණිස සිහළ භාෂාවෙන් තබන

1. මිලින්ද පඤ්හ පිට **135** හේ.මු.
2. මහාවග්ග පාළි **I** පි. **176** බු.ජ.ත්‍රි.
3. සම.පා. **III** පිට **741** හේ.මු.
4. සංයුක්ත ටීකා, ග්‍රන්ථාරම්භක කතා වණ්ණනා, (ම.ෂ.සං)
5. සාරත්ථදීපනී ටීකා පිට **18**, සංස්. මාබෝපිටියේ මේධඞ්කර හිමි **1933**
6. සාරත්ථදීපනී ටීකා පිට **16**, සංස්. මාබෝපිටියේ මේධඞ්කර හිමි **1933**
7. වජිරබුද්ධි ටීකා, ග්‍රන්ථාරම්භක වර්ණනා

ලද්දක් බැව් සාරත්ථදීපනියෙහි පැවසේ. දීඝාගම අටුවා ආදියෙහි පවා බුද්ධඝෝෂ මහාස්වාමීන් යථෝක්ත කාරණය දක්වන ලද්දේ මෙසේ යැ.

**"අත්තප්පකාසනත්ථං අට්ඨකථා ආදිතෝ වසීසතේහි -**
**පඤ්චහි යා සංගීතා අනුසංගීතාච පච්ඡාපි,**
**සීහලදීපං පන ආභතා'ථ වසිනා මහාමහින්දේන -**
**ඨපිතා සීහළ භාසාය දීපවාසීන මත්ථාය."**

සව්කෙලෙසුන් නැසූ ප්‍රභින්න ප්‍රතිසම්භිදාප්‍රාප්ත මහරහතුන් වහන්සේලා බුදුරදුන් නොම දෙසූවක් නොම පවසන්නාහ. බුදු හිමියන් සමීපයෙහි වූ ආනන්දාදී ඕරස පුත්‍රයෝ බුද්ධ ආධ්‍යාසය මැනවින් දත් බැවින් අටුවාවෙහි **"බුද්ධානං හි පරිසා අජ්ඣාසය කුසලාහොන්ති"**[1] යනුවෙන් බුදුරජාණන් වහන්සේලාගේ පිරිස වනාහි අදහස් දැනගැනීමට දක්ෂ වෙත් යැයි පවසන ලද්දාහ. එබැවින් අර්ථ සංවර්ණනාව හෙවත් අටුවාව වූ කලී බුද්ධ ආධ්‍යාශය දන්නා වූ සිව්පිළිසිඹියා මහරහත් උතුමන්ගේ ම යැ. එසේ ම භාග්‍යවතුන් වහන්සේ තබන ලද නය ක්‍රමය ඔස්සේ පවසන ලද බැවින් බුද්ධභාෂිතයක් ම යැ. භාග්‍යවතුන්වහන්සේ නොකියන ලද්දාවූ තන්ති පදයක් නම් නොමැත. නයක්‍රම සියල්ල තබා ඇති බැවින් ඒ අනුසාරයෙන් සියලු ම අර්ථය ද කියන ලදී. එබැවින් බුදුරජාණන් වහන්සේ විසින් ම තුන් පිටකයේ අර්ථ සංවර්ණනා ක්‍රමය කියන ලද්දේ යැයි සාරත්ථ දීපනියෙහි **"නහි භගවතෝ අබ්‍යාකථං නාම තන්ති පදං අත්ථි, සබ්බේසංයේව අත්ථෝ කථිතෝ, තස්මා සම්බුද්ධේන තිණ්ණං පිටකානං අත්ථසංවණ්ණනා කමෝපි භාසිතෝහෝති දට්ඨබ්බං."**[2] යනුවෙන් පවසන ලදී.

එසේ ම විමතිවිනෝදනියෙහි ද "භාග්‍යවතුන් වහන්සේගේ වචනයක් වචානුලෝමයක් නොමැතිව අග්‍රශ්‍රාවකාදී මහරහතුන් වහන්සේලාට ද තමන්ගේ ඥාන බලයෙන් සූත්‍රාභිධර්ම විනයෙහි කිසිඳු සම්මුති පරමාර්ථ භේද සංඛ්‍යාත වූ අර්ථයක් කීමට නොහැකි බවත් එබැවින් සියලු ම අර්ථවාක්‍යානය සූත්‍රයේත් සූත්‍රානුලෝමයේත් සංගෘහිත බවත් පවසා ඇත. එනම් **"නහි භගවතෝ වචනං වචනානුලෝමඤ්ච අනිස්සාය අග්ගසාවකාදයෝපි අත්තනෝ**

1. සම.පා. III පිට 734 හේ.මු.
2. සාරත්ථ දීපනී ටීකා පිට 18, සංස්. මාබෝපිටියේ මේධඞ්කර හිමි 1933

**ඤාණබලේන සුත්තාභිධම්මවිනයේසු කඤ්චි සම්මුතිපරමත්ථභේදං අත්ථං වත්තුං සක්කොන්ති, තස්මා සබ්බම්පි වචනං සුත්තේ සුත්තානුලෝමේච සංගහන්ති”**[1] යනුවෙනි.

පූර්ව කී කරුණු අනුව බලන කලැ. අටුවාව සඞගීතිකාරක මහඋතුමන් පෙලෙන් වෙන් කොට තැබූවක් වුවත් එය බුද්ධ දේශනයක් බැව් පැහැදිලි ය. භාග්‍යවතුන් වහන්සේගේ වචනයක් වචනානුලෝමයත් නොතිබුණේ නම් සංගීතාකාරක මහරහතුන්ටද එය සිදුකළ නොහැකිය. බුදුපියාණන් වහන්සේ නයක්‍රම තබා ඇති බැවින් සූතාභිධර්මවිනයෙහි අරුත් වැනුම් එම න්‍යාය ක්‍රමයන් ඔස්සේ ම මහාකාශ්‍යපාදී පෞරාණික ආචාර්යවරු සිදු කළහ.[2] එබැවින් වජිරබුද්ධි ටීකාවෙහි “**භගවතෝ අදිප්පායං අනුගන්ත්වා තංතං පායේ අත්ථං භාවති විභායති, තස්ස තස්ස වා අත්ථස්ස භාවනා විභාවනාති අනුභාවෝ වුච්චති අට්ඨකථා**” යනුවෙන් පවසන ලදී.[3] එම අරුත් තැබීම භාග්‍යවතුන් වහන්සේ ම සිදුකරන ලද්දේ නම් උන්වහන්සේ පවා පවසන්නේ එලෙස ම යැ. ඒ එසේ මැයි. එබැවින් “**භගවතෝ පකිණ්ණකදේසනභූතාච සුත්තානුලෝමභූතාච අට්ඨකථා**”[4] යනුවෙන් විමතිවිනෝදනයෙහි පවසන ලදී. තවද මැදුම් සඟියෙහි මූලපණ්ණාසකයෙහි එන මධුපිණ්ඩික සූත්‍රය[5] සේ මැ උපරිපණ්ණාසකයෙහි එන සච්චවිභඞ්ග සූත්‍රය[6] ද මෙහි සාධකයැ.

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්ම විනය එපරිද්දෙන් ම උන්වහන්සේගේ බුද්ධපුත්‍රයන් දරන ලදුව අර්ථ සංවණ්ණනාව ද සිදු කරන ලදී. එම බුද්ධ පුත්‍ර පරම්පරම්පරාවෙන් පැවත එන සීහල අටුවා ඇදුරන් හෙළටුවා කරන ලද්දේ යැ. බුදුගොස් මහාස්වාමීන් ද ඒබැව්

> **“බුද්ධේන ධම්මෝ විනයෝච වුත්තෝ**
> **යෝ තස්ස පුත්තේහි තථේව ඤාතෝ,**
> **සෝ තේ හි තේසං මතිමච්ඡ ජන්තා**
> **යස්මා පුරේ අට්ඨකථා අකංසු.”**[7]

---

1. විමතිවිනෝදනී ටීකා පිට 103 සංස්. බේරතුඩුවේ ධම්මාධාර හිමි 1935
2. සාරත්ථ දීපනී ටීකා පිට 18, සංස්. මාබෝපිටියේ මේධඞ්කර හිමි 1933
3. වජිරබුද්ධි ටීකා ග්‍රන්ථාරම්භක වණ්ණනා (ම.ජ.සං)
4. විමතිවිනෝදනි ටීකා පිට 103 සංස්. 1935
5. මජ්ඣිම නිකාය I, පිට 272 බු.ජ.ත්‍රි.
6. මජ්ඣිම නිකාය III, පිට 512 බු.ජ.ත්‍රි.
7. සම.පා I, පිට 2 හේ.මු

යනුවෙන් විනය අටුවාවෙහි පවසන ලදී. එහි එන හෙළටුවා නම් මහාඅට්ඨකථා, මහාපච්ඡරිය, කුරුන්දි ආදී අටුවාවන් යැ. එබැවි විමතිවිනෝදනයෙහි "**මහාඅට්ඨකතා මහාපච්ඡරිආදිකා සීහල අට්ඨකථායෝ අකංසු**"[1] යනුවෙන් පැවසූහ. මහාඅට්ඨකථාව නම් සියල්ලන්ට ම ප්‍රධානවූ හෙළටුවාව යැ. මහාපච්ඡරිය දෙවැනි හෙළටුවාව වන අතර පච්ඡරිය යන්නෙන් පහුර අදහස් කරන ලදී. එහි හිඳ කළ බැවින් එම නාමය මැ හටගත් බව සාරත්ථදීපනියෙහි "**මහාපච්ඡරියන්ති එත්ථ පච්චරිතී උළුම්පං උච්චති, තස්මිං නිසීදිත්වා කතත්ථා තමේවනාමං ජාතං**"[2] යනුවෙන් සඳහන් ය. තෙවැනි හෙළටුවාව කුරුන්දිය නමින් හැඳින්වෙන අතර පූර්වේ කුරුන්දිවල්ලි නම් වූ විහාරයක් තිබූ බවත් එම අටුවාව එහි සිට සිදු කළ බැවින් කුරුන්දි නාමය හටගත් බැව් එහි ම සඳහන් ය. එනම් "**කුරුන්දිවල්ලි විහාරෝනාම අත්ථි, තත්ථ කත්ථා කුරුන්දීති නාමං ජාතං ති වදන්ති**"[3] යනුවෙනි. තවද චූලපච්ඡරිය, අන්දක, අරිය නම් වූ අටුවා ගැන වජිරබුද්ධියෙහි සඳහන් ව ඇත.[4] අන්දක අටුවාව මෙන් ම සංඛේප අටුවාව ගැන ද සමන්තපාසාදිකාවෙහි නොයෙක් තැන සඳහන් ව ඇත.[5] අන්දක අටුවාව අන්දක රටේ නොහොත් ආන්ද්‍රා දේශයේ ලිවූවක් බව විනය අටුවාවේ එන ඇතැම් කරුණුවලින් පෙනේ. එනම් "**අන්දකඅට්ඨකථායං අපරික්ඛිත්තේ පමුඛේ අනාපත්තීති භූමියං විනා ජගතියා පමුකං සන්ධාය කතිතන්ති වුත්තං**" "**තං අන්දක රට්ඨයේ පාථෙක්කං සන්නිවේසා ඒකච්ඡදනා ගබ්භපාලියෝ සද්ධාය වුත්තං**"[6] යනුවෙන් සඳහන්ව ඇත.

සංඛේප අටුවාව සංක්ෂිප්තව සිදුකරන ලද්දක් බව පෙනුනත් නිශ්චිත නිගමනයක් ප්‍රකරණයන් තුළින් දිය නොහැක. බාගදා මෙය හෙළටුවාවක් ද විය හැකිය. චූලපච්චරිය සහ අරිය අටුවා දෙක ගැන ප්‍රකරණයන්ගෙන් ප්‍රතිෂ්ටා නොලබන අතර නාමිකව වජිරබුද්ධියෙහි පමණක් සඳහන් ව ඇත. මහාපච්චරිය හෙළටුවාවක් බැවින් මෙය ද හෙළටුවාවක් බව ද නිශ්චය කළ හැක. අරිය අටුවාව පිළිබඳ ව්‍යඤ්ජනය දෙස බලා මගධ බසින් සිදුකර ඇති එකක් සේ පෙනුණත් ස්ථිර නිගමනයකට අපිදු පොහොසත් නොවම්හ.

1. විමතිවිනෝදනී ටීකා. පිට 06 සංස්. 1935
2. සාරත්ථදීපනී ටීකා පිට 17 සංස්. 1933
3. සාරත්ථ දීපනී ටීකා පිට එම
4. වජිර බුද්ධි ටීකා ග්‍රන්ථාරම්භක වර්ණනා (ම.ෂ.සං)
5. සම.පා පිට 111, 724, 725, 224, 260, 276 හේ.මු.
6. සම.පා II පිට 544-545 හේ.මු.

බුදුගොස් මහාස්වාමීන් ලක්දිවට පැමිණෙනුයේ 4 වන සියවසේ මුල් භාගයේ දි යැ. එනම් මහානාම රජු දවස බව ප්‍රකට කරුණකි. මහාවංශයේ 37 වන පරිච්ඡේදයේ එන;

**"ඒවං වුත්තෝ පසන්තෝ සෝ නික්ඛමිත්වාන ඉතො ඉමං,**
**දීපමාගා ඉමස්සේව රඤ්ඤෝ කාලේ මහාමති."**[1]

යන ගාථාවෙහි **"ඉමස්සේව රඤ්ඤෝ කාලේ"** යන්නෙන් දක්වන ලද්දේ මහානාම රජු විසින් ය. විස්තර මහාවංශයෙන් දත යුතුයැ. අනතුරුව මහාවිහාරයට පැමිණ එහි පධානඝරයෙහි වැඩ සිටි සංඝපාල මහාස්වාමීන් සමීපයෙහි හෙළටුවා සහිත සියලු ම ථෙරවාදය උගෙන පසුව සංඝයා රැස්කොට සීහල අටුවා මගධ බසින් තැබීමට පොත් ඉල්ලූ පසු සමත්කම් දැක්වීමට සංඝයා දෙගයක් දීමෙන් අටුවා සහිත පිටකත්‍රය සංගෘහිත කොට විශුද්ධිමාර්ගය කළ බැව් එහි ම සඳහන් ය.

මාහාවිහාර වැසියන්ගේ දේශනා නය නිශ්ශ්‍රිත වූ විශුද්ධිමාර්ගය බුද්ධඝෝෂ මහාස්වාමීන් හෙළදිව්හිදී මගධ බසින් සිදුකළ පළමු ග්‍රන්ථය බැව් මහාවංශයෙන් ම ප්‍රකට යැ. අනතුරුවැ සමන්තපාසාදිකාව නම් වූ විනය අටුවාවත් සුමංගලවිලාසනීය, පපඤ්චසූදනිය, සාරත්ථප්පකාසනීය, මනෝරථපූරණිය යන අටුවාවෝත් මගධ බසට නංවන ලද්දාහු ය. විජම් අටුවා වන අත්ථසාලනී, සම්මෝහවිනෝදනී, පඤ්චප්පකරණය යන අටුවාවත් හෙළ බසින් මගධ නිරුත්තියට නංවන ලද ඒවා ය. තවද ඛුදුගොත් සඟියෙහි එන පරමත්ථජෝතිකා නම් වූ ඛුද්දකපාඨ අටුවාව ද යථෝක්ත නාමය ම ලත් ධම්ම පද, සුත්තනිපාත, ජාතක යන අටුවාවනුත් හෙළ බසින් මගධ බසට නංවන ලද්දේ උන්වහන්සේ ම.

තවද උභයමාතිකාවන්ට සිදුකළ කංඛාවිතරණී නම් වූ මාතික අටුවාව ද බුදුගොස් මහාස්වාමීන් හෙළුවෙන් තන්තියට නංවන ලද්දක් ම යැ. මෙය බුද්ධඝෝෂ මහාස්වාමීන් නොම සිදුකරන ලද්දක් බවට සැක උපදවමින් විනය අටුවාවට පූර්වේ සිදුකරන ලද්දක් බවත් පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ 'පාලි සාහිත්‍යයේ' දී මෙලෙස පවසති.

1. ඨාණපූරණ සහිතො මහාවංසෝ, බුද්ධදත්ත හිමි පොල්වත්තේ, පිට **222 -1959**

**"ඒ ප්‍රාතිමෝක්ෂයට ලියූ අටුවාව කංඛාවිතරණී නැමැත්තී ය. එය ද බුද්ධඝෝෂා ආචාර්යයන් විසින් ලියන ලද්දක් යැයි එහි අග සඳහන් වී ඇතත් එය එසේ ම යැයි හෝ එසේ නොවේ යැයි කීම අපහසුයි."** යනුවෙනුත් **"සමන්තපාසාදිකාව ලියූ පසු මෙය සම්පාදනය කළා නම් සීහළ අටුවා බැලිමට ඕනෑ කමක් නැත. එසේ ම විස්තර බලාගත යුතු තැනදී සමන්තපාසාදිකාවෙන් ලබා ගත යුතු යැයි කීමත් ද මෙහි පෙනෙන්නට නැත. එබැවින් මෙය බුද්ධඝෝෂ කාලයට පෙර තිබූ අටුවාවක් විය යුතුය."**[1] යනුවෙන් කියා ඇත.

බුද්ධදත්ත හිමියන්ගේ යථෝක්ත ප්‍රකාශනය දොස් සහිතය. අවිචාරවත් වැ ප්‍රකාශිත බැවින් සාර වශයෙන් නොගෙන බැහැර කිරීමට සිදුවේ. මාතික අටුවාවෙහි අගට ඇති බුදුගොස් මහාස්වාමීන්ගේ ශිෂ්‍ය වූ බුද්ධමිත්ත තෙරුන් ප්‍රකාශිත **"පරමවිශුද්ධසද්ධාබුද්ධිවිරියපතිමණ්ඩිතේන"** යන ආදීහු ගුණ නාම කෙළවර **"බුද්ධඝෝසෝති ගරුහි ගහිතනාමදෙය්‍යෙන ථේරේන කතායං කංඛාවිතරණී නාම පාතිමොක්ඛවණ්ණනාති"** යනුවෙන් ප්‍රකාශිත බැවින් ගුරුන් සිදුකළ ගත සන්තිකාවචර වූ අතවැසියා ම පවසා තිබියදී එය ප්‍රතික්ෂේප කිරීම හෝ සැක උපැද්දවීම යුක්ති යුක්ත නැත. බුද්ධඝෝෂ මහාස්වාමීන් මගධ බසට නැගූ සියලු අටුවාවන්හි අගට මෙම ගුණ වැනුම ඇත. එය සිදු කරන ලද්දේ උන්වහන්සේ නොවැ. **"බුද්ධඝෝෂ හිමිතුමන් පමණ තමන්ගේ නමට ගුණ පද යොදා ගත් වෙන කෙනෙකුන් මේ ශාසනයේ නැති බව"**[2] අටුවා පරීක්ෂණයෙහි ප්‍රකාශිත බුද්ධදත්ත හිමියන්ගේ යථෝක්ත කාරණය ද දෝෂ දර්ශිත බැවින් එය ද බැහැර කළ යුතු යැ. පණ්ඩිත ද්විතීය පරාක්‍රමබාහු නරේන්ද්‍රයන් රචිත විශුද්ධිමාර්ග සන්නයෙහි "දූන් බුද්ධඝෝෂ ස්ථවිරයන්ගේ අතවැසි වූ බුද්ධමිත්ත තෙරහූ **"පරමවිශුද්ධසද්ධාබුද්ධිවිරියපතිමණ්ඩිතේන"**[3] යනාදීන් ස්ථවිරයන්ට ගුණ කියා විසුද්ධිමග්ග තෙරුන් විසින් කළ බව කීහු" යනුවෙන් පවසා ඇති බැවින් බුද්ධදත්ත හිමියන්ගේ යථෝක්ත කියමන දූෂිත බැව් පැහැදිලි ය. එබැවින් කඞ්ඛාවිතරණී ආදී අනෙක් අටුවාවන්හිත් එම ගුණනාමයෝ යොදා තෙරුන් සිදු කළ බැව් පවසා ඇත්තේ අතවැසි වූ බුද්ධමිත්ත තෙරුන් බව දත යුත්තාහ.

1. පාලි සාහිත්‍ය. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, පිට **193-194-195 - 2010**
2. අටුවා පරීක්ෂණය. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, පිට **28 - 2002**
3. විශුද්ධිමාර්ග සන්නය පිට **1753.** බෙන්තර සද්ධාතිස්ස හිමි සංස්. **1957**

තවද මාතික අටුවාව බුද්ධඝෝෂ ස්වාමීන් මගධ බසට නංවමින් සිදුකරන ලද්දක් බැව් කංඛාවිතරණී පූරාණ සහ අභිනව ටීකා දෙක ම පවසා ඇති බැවින් සැකයට බඳුන් කිරීම උචිත නොවේ. එම පුරාණ ටීකාවේ **"භදන්ත බුද්ධඝෝසේන මාතිකා අට්ඨකථා සුභා"**[1] යනුවෙන් ග්‍රන්ථාරම්භයේදී ම පවසා ඇත. අභිනව ටීකාවෙහි ද

> **"යා කථා බුද්ධඝෝසේන - ථේරේන චිරචේතසා,**
> **කංඛාවිතරණී නාම - මාතිකා අට්ඨකථා සුභා."**[2]

යනුවෙන් සඳහන් ය. ටීකා කරණයට තරම් දක්ෂ වූ පිටකත්‍රය කෝවිද වූ ඇදුරන් මෙය පවසා ඇති විට එය ප්‍රතික්ෂේප කිරීම යුක්ති සහගත නැත.

තවද මෙම මාතික අටුවාව බුද්ධඝෝෂ මහාස්වාමීහු විනය අටුවා අර්ථසාරයත් සිහල මාතිකඅටුවා අර්ථසාරයත් ගෙන මගධ බසින් තබන ලද්දක් බව පැහැදිලි ය. අභිනව ටීකාවෙහි **"සීහළ අට්ඨකථානයන්ති සීහලමාතිකාට්ඨ කථා නයං අට්ඨකථා සාරන්ති සීහල මාතිකාට්ඨකථායං අත්ථසාරං, අථ ච විනයට්ඨකථාසු අත්ථසාරං"**[3] යනුවෙන් සඳහන් ව ඇත. එබැවින් හෙළ බසින් මාතික අටුවාවක් තිබූ බවත් එය සහ විනය අටුවාව ගෙන කංඛාවිතරණය සිදු කළ බවත් පැහැදිලිය. ඒ එසේ මැයි මාතික අටුවාවෙහි නොයෙක් තැන **"විත්ථාරෝ පන සමන්තපාසාදිකායං විනයසංවණ්ණනාය වුත්තනයේමේව වේදිතබ්බෝ"**[4] **"විනිච්ඡය කථා පන විත්ථාරතෝ සමන්තපාසාදිකායං වුත්තා"**[5] **"උභින්නම්පි පනේ තේසං දානවිධි විනිච්ඡය කථාච සමන්ත පාසාදිකායං වුත්තනයේනේව වේදිතබ්බා"**[6] **"අබ්භානකම්මං පාලිවසේන ඛන්ධකේ විනිච්ඡයවසේන සමන්පාසාදිකා යං වුත්තං"**[7] **"තත්ථ විත්ථාරවිනිච්ඡයෝ සමන්තපාසාදිකා යං වුත්තනයේනේව වේදිතබ්බෝ"**[8] යනුවෙන් විස්තරය සමන්තපාසාදිකාවෙන් ගතයුතුයැයි

1. කංඛාවිතරණී පුරාණ ටීකා ග්‍රන්ථාරම්භක කථා වණ්ණනා (ම.ඡ.සං)
2. කංඛාවිතරණී අභිනවටීකා පිට 1 යූ.පී. ඒකනායක සංස්. - 1912
3. කංකාවිතරණී අභිනවටීකා පිට 205 යූ.පී. ඒකනායක සංස්. - 1912
4. කංඛාවිතරණී පිට 59 කාරවිල ඉන්දරතන හිමි සංස්. - බෞ.ස.ම. 2012
5. -එම-
6. -එම- පිට 61
7. -එම-
8. පිට 64

කියා ඇති බැවින් බුද්ධදත්ත හිමියන් පවසා ඇති කරුණු දොස් සහිත බැවින් නොපිළිගත යුතුය.

බුදුගොත් සඟියෙහි එන අනෙක් හෙළටුවාවන්ගෙන් වැඩි කොටසක් මගධ බසින් තබන ලද්දේ බදරතිත්ථීය විහාරවාසී වූ ධම්මපාල ආචාර්යන් විසිනි. පරමත්ථදීපනී නමින් උදාන, ඉතිවුත්තක, විමානවත්ථු, පේතවත්ථු ථේරථේරී ගාථා, චරියාපිටක නම් වූ අටුවාවන් ද නෙත්තිපකරණ අටුවාව ද සද්ධම්මප්පකාසිනී නමින් පටිසම්භිදාමග්ග අටුවාව ද තන්තියට නන්වන ලද්දේ උන්වහන්සේ යැ.

සද්ධම්මපජ්ජෝතිකා නමින් නිද්දේශ අටුවාව මගධ බසට උපසේන ආචාර්යයන් විසින් තබන ලදී. විසුද්ධජනවිලාසනී නමින් අපදාන අටුවාව මහානාම ආචාර්යන් ද මධුරත්ථප්පකාසනී නමින් බුද්ධවංස අටුවාව බුද්ධදත්ත ආචාර්යන් ද හෙළුවෙන් තන්තියට තබන ලද්දා වූ අටුවාවන් බැව් දත යුතුය. මෙතැකින් කියන ලද්දේ අටුවා ගැන කරුණු ස්වල්පයකි.

## අටුවා පිළිබඳ ටීකාවෙන් පිළිබිඹුවන කරුණු

බදරතිත්තිය විහාරවාසී වූ ධම්මපාල ආචාර්යන් වූ කලි තන්තියට නංවන ලද්දේ බුදුගොත් සඟියෙහි අටුවා පොත් පමණක් නොවැ, මුල්සඟි තුනේ අටුවාවන්ට ටීකා ග්‍රන්ථ සම්පාදනය කරන ලද්දෙත් පරමත්ථමංජුසා නමින් විසුද්ධිමග්ගටීකාව කරන ලද්දෙත් මුන්වහන්සේ විසින් යැ. විජම් අටුවාවන්ට අනුටීකා සහ සත්‍යසංක්ෂේප ප්‍රකරණය ද නිපදවන ලද්දේ මෙම මහාස්වාමීන් වහන්සේ ම යැ.

අටුවාවන්හි ගණ්ඨිට්ඨාන හෙවත් ලීනාර්ථයන් විස්තර කරමින් සම්පාදනය කරන ලද්ද ටීකාව වන අතර චතුර්විධ විනයෙහි අත්තනෝමතික වශයෙනුත් මිළින්දප්‍රශ්නයෙහි අධිප්පාය වශයෙනුත් හඳුන්වනු ලබන්නේ එය ම යැ. අත්තනෝමති නම් හුදෙක් තමන්ගේ මතිභ්‍රමයක් නොව පෙළ දහමත් මහාපදේස ආදිය අනුව යමින් එයින් ලද නය ක්‍රම ඔස්සේ ම කියන ලද්දාවූ කරුණු මේවායෙහි ඇතුළත් ය. ඒවා පෙළටුවාවන්ට මනාව ගැළපෙන බවත් ධර්ම විනය නය දන විමසිලිවත් වැ බලන්නෙකුට නොපෙනෙන්නේ නොවේ. ටීකා ඇදුරෝ

සබ්බපරියත්තිධරයෝ යැ. අටුවා සහිත වූ තෙවලා දහම පිළිබඳ එතුමෝ වූ කලී සුනිපුණ විනිශ්චය ඇත්තෝ යැ. ධම්මපාල ආචාර්යයන් වනාහි ටීකා පමණක් නොවැ, අටුවාවනුත් තන්තියෙන් තබන ලද බව ඉහත කියන ලදී.

"**සම්මාසම්බුද්ධෙනේව හි විනයසුත්තාභිධම්මානං පකිණ්ණකදේසනාදිවසේන යෝ පඨමං අත්ථෝ විභත්තෝ, සෝ ඒව පච්ඡා තේසං අත්ථසංවණ්ණනාවසේන සංගීතිකාරකේහි සංගහං ආරෝපිතෝති**"[1] සම්මාසම්බුදු රජාණන් වහන්සේ විසින් ම විනය සූත්‍ර අභිධර්මයන්ගේ ප්‍රකීර්ණක දේශනය වශයෙන් පළමුව යම් අර්ථයක් බෙදන ලද්දේ ද පසුව එය ම ඒවාගේ අර්ථසංවණ්ණනා වශයෙන් සංගීතිකාරක උතුමන් විසින් සංගායනයට නංවන ලද්දේ ය යනුවෙන් අටුවාව පිළිබඳ සංයුත්ත ටීකාවෙහි එන්නාවූ විස්තර විවරණයකි මේ. ස්වසමය පමණක් නොවැ, පරසමය, ඉතිහාසය, භාෂාව, ග්‍රන්ථකරණය අතින් පරතෙරට ගිය සියුම් නුවණක් ඇති එබඳු උතුමන්ගේ යථෝක්ත කියමන් තෙවලා දහමෙහි තබා එක් පිටකයක්වත් අටුවා සහිත ප්‍රගුණ කොට නැති මෙකල මද නුවණ ඇත්තන් ප්‍රතික්ෂේප කිරීම හාස්‍යයට කරුණක් නොවන්නේ ද?

සංයුක්ත සඟියේ සේ ම කුදුගොත් සඟියෙහි ද එන ඇතැම් සූත්‍ර දේශනාවන් කරුණු වශයෙන් එක හා සමාන යැ, දෙසූ පුද්ගලයන්ගේ වශයෙන් නානත්වයක් ඇතත් ධර්මාර්ථ වශයෙන් ඒවායෙහි වෙනසක් නැත. ධර්මාර්ථ වශයෙන් එක හා සමාන වූ එබඳු සූත්‍ර දේශනා සූත්‍ර පිටකයෙහි සංගෘහීත වූයේ කුමකට ද යන්න සංයුක්ත ටීකාවේ පවසා ඇත. නිධාන වග්ගයේ එන පඤ්චවේර භය සූත්‍රය සහ දුතියපඤ්චවේර භය සූත්‍රය එක හා සමාන යැ. දුතියපංචවේර භය සූත්‍ර අටුවාවෙහි "**දුතියේ භික්ඛූනං කථිතභාවමත්තමේව විසේසෝ**"[2] යනුවෙන් දෙවැන්නෙහි භික්ෂූන්ට දෙසූ බව ම විසේස ලෙස පවසා ඇත. ටීකාවෙහි "**භික්ඛූනං කථිතභාවමත්තමේවවිසේසෝති ඒතේන යා සත්තාරා ඒකච්චානං දේසිතදේසනා පුන තදඤ්ඤේසං වේනෙය්‍යදමකුසලේන කාලන්තරේ තේනේව දේසිතා, සා ධම්මසංගාහකේහි" "මා නෝ සත්තුදේසනා සම්පටිග්ගහං විනා නස්සතූ"ති විසුං සංගහං ආරෝපිතාති දස්සෙති**"[3] "භික්ඛූනං

1. සංයුක්ත ටීකා ග්‍රන්ථාරම්භක වණ්ණනා ඡට්ඨ සංගායනා (ම.ඡ.සං)
2. සංයුක්ත අටුවා II පිට. 56 සංස්. බෞ.ස.ම. 2009
3. සංයුක්ත ටීකා දුතියපඤ්චවේර භය සූත්‍ර වර්ණනා

කථිතභාවමත්තමේවවිසේසෝ යන මෙයින් ශාස්තෘන් වහන්සේ ඇතැමුන්ට දෙසූ යම් දේශනා, වේනෙය්‍යාදමකුසල වූ භාග්‍යවතුන් වහන්සේ විසින් නැවත ඒයින් අන්‍යයන්ට ද කාලයාගේ ඇවෑමෙන් එය ම දේශනා කරන ලද්දේ ය, එය ධර්ම සංග්‍රාහකයන් වහන්සේලා විසින් අප, ශාස්තෘන් වහන්සේගේ දේශනා පිළිගැනීමක් නැතිව විනාශ නොවේවා'යි වෙන ම සංග්‍රහයට නංවන ලද්දේයැයි දක්වයි." යනුවෙන් යථෝක්ත අටුවා පාඨයට අර්ථ දක්වා ඇත.

සංයුක්ත සඟි ආදියෙහි එක හා සමාන දෙසුම් කවර අර්ථයකින් සංගෘහිත දැයි ටීකා විස්තරයෙන් සිතාගත හැකිය. එසේ ම ත්‍රිපිටක සංගායනාව පමණක් නොවැ, මහාකාශ්‍යප ආදී සංගීතිකිකාර මහරහතුන් වහන්සේලා අටුවාවන් ද වෙන ම සංගායනා කොට පවසන ලද උක්ත අටුවා පාඨයට ටීකා කරන ටීකාචාර්ය උතුමන් තුළ භාග්‍යවතුන් වහන්සේගේ දේශනා විලාසය ගැනත් අටුවා ඇදුරන්ගේ අදහස පිළිබඳවත් තිබූ අවබෝධය මෙයින් කවරකුට නම් නොවැටහෙන්නේ ද?

තවද නිරය පාලකයින් නිරයෙහි උපන් සත්වයන්ට දඬුවම් පමුණුවන විට දෝමනස්ස සහගත අකුසල් සිත් ඔවුන්ට ද ඇතිවන බව පඤ්චවේර භය සූත්‍ර අටුවාවෙහි එන්නා වූ කරුණුවලින් පැහැදිලි වනු ඇත. එනම් "**යා පන තං නිරයේ උප්පන්නං දිස්වා ඒතං පහරිස්සාමීති ජාලිතං අයමුග්ගරං ගණ්හතෝ නිරයපාලස්ස චේතනා උප්පජ්ජති. ඉධමස්ස සම්පරායිකං බාහිර වේරං නාම**" යනුවෙන් "යම් ඒ නිරයේ උපන්නාවූ සත්වයකු දැක ඔහුට පහර දෙන්නමේ යැයි ගිනිගත් අයමුගුරක් ගැනීමෙන් නිරය පාලකයා හට චේතනා (සිතුවිලි) උපදී ද, මේ මොහුගේ සාම්පරායික වූ බාහිර වෛරය යැයි කියා ඇත." එසේ ම **නිරය පාලස්සචේතනා උප්පජ්ජති** යන අටුවා පාඨයට විස්තර සපයන සංයුත්ත ටීකාව "**ඒතේන අත්ථි නිරයේ නිරයපාලස්සාති දස්සේති**" මෙයින් නිරයෙහි නිරය පාලකයෝ ඇත්තේ යැයි දක්වයි යනුවෙන් පවසා ඇත. අට්ඨකථාවෙහි එන්නා වූ ප්‍රකාශ අනුව යමින් විස්තර විවරණය සපයන ටීකා ඇඳුරන් කිසිවිටක අටුවාවට විරුද්ධ ව යෑමක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් සිදුකර නොමැති බව උක්ත කරුණුවලින්

පැහැදිලි වනු ඇත. තවද ටීකාවෙහි **"න හි නේරයිකා නිරයපාලේසු පටිපහරිතුම් සක්කොන්ති"** යනුවෙන් නිරය පාලකයන් කෙරෙහි ප්‍රතිපහර එල්ල කිරීමට නේරයිකයන්ට නොහැකි බවත් පවසා ඇත.

විටෙක සංයුක්ත ටීකාවෙහි ඇතැම් කරුණු සාධනයෙහිලා විජම් අටුවාවන්ගෙන් සහ අනෙක් ආගම අටුවාවන්ගෙන් කරුණු දක්වූ වාර බොහෝ ගණනක් පෙනෙන්නට ඇත. එසේ ම සූත්‍ර විනය අභිධර්මසංඛ්‍යාත ත්‍රිපිටක පාලියෙහි ද ඇතැම් කරුණු සාධනයට ඒ ඒ තැන බහාලමින් ගන්නාවූ නොයෙක් සූත්‍ර කාණ්ඩ ද ඇත. විටෙක අටුවා පාඨවල ද විස්තර විවරණ සැපයිය යුත්තේ ඇතැම් විජම්ටීකා හා විසුද්ධිමග්ග ටීකා ආගම ටීකාවන්හි කළ යුතු ආකාරයෙන් ද එවිට යථෝක්ත විස්තර විවරණය එම ටීකා ආදියෙහි කියූ අයුරින් දත යුතු යැයි පැවසූ වාර ද පෙනෙන්නට නැත්තේ නොවේ.

ඉහත දක්වූ සංයුක්ත ටීකාකරණයට ගත් විජම් සහ ආගම අටුවාපාඨ නම් මෙසේ යැ කෝසල සංයුක්තයේ එන පඤ්චරාජ සූත්‍ර ටීකාවෙහි **"යං පන සම්මෝහවිනෝදනීයං කුසලකම්මජං අනිට්ඨං නාම නත්ථීති එත්තකමේව වුත්තං"**[1] ධාතු සංයුක්තයේ එන පඤ්චසික්ඛාපද සූත්‍ර ටීකාවෙහි **"තථා වුත්තං සම්මෝහ විනෝදනීයං යානිසික්ඛාපදානි එත්ත සත්තාරම්මණානීති වුත්තානි තානි යස්මා සත්තෝති තී සංඛං ගතේ සංඛාරේයේව ආරම්මනං කරෝතීති"**[2] යනුවෙන් ද දක්වන ලද විභංග අටුවාපාඨ ටීකාවෙහි පවසන ලද කරුණු සාධනයෙහි ලා දක්වන ලද්දාවූ අපදේසයෝ ය.

එහි දක්වා ඇති ආගම අටුවාපාඨ නම් දේවතා සංයුක්තයේ පළමු ඕගතරණ සූත්‍ර ටීකාවෙහි **"සුමංගලවිලාසිනි අදීසු පන සස්සතදිට්ඨිසහගතරාගෝවාති වුත්තං"**[3] යනුවෙන් ද සච්චසංයුත්තයේ එන නච්චගීත සූත්‍ර ටීකාවෙහි **"තථාහි වුත්තං පරමත්ථජෝතිකායා ඛුද්දකඅට්ඨකථාය" "ධම්මූපසංහිතං ගීතං වට්ඨති, ගීතූපසංහිතෝ ධම්මෝ න වට්ටති'තී"**[4] යනුවෙන් ද එසේ ම බ්‍රහ්ම සංයුක්තයෙහි බ්‍රහ්මායාචන සූත්‍ර ටීකාවෙහි **"පපඤ්චසූදනීයං පන "ද්වාදස පුඤ්ඤකිරියවසේනා"ති වුත්තං"**[5] යනුවෙන් ද එන්නා වූ අපදේශ කරුණු සාධනයෙහි ලා ම දක්වන ලද්දාවූ ඒවා ය.

---

1. සංයුත්ත ටීකා, පඤ්චරාජ සූත්‍ර වණ්ණනා
2. සංයුත්ත ටීකා, පඤ්ච සික්ඛාපද සූත්‍ර වණ්ණනා
3. සංයුත්ත ටීකා, ඕගතරණ සූත්‍ර වණ්ණනා
4. සංයුත්ත ටීකා, නච්ඡගීත සූත්‍ර වණ්ණනා
5. -එම- බ්‍රහ්මායාචන සූත්‍ර වණ්ණනා

සංයුක්ත ටීකාවෙහි ඇතැම් තැන මෙලෙසැ අනෙක් ආගම අටුවා සහ විජම් අටුවාවන්ගේ පාඨ ගෙනහැර දක්වමින් සූත්‍ර විස්තර කරනු ලබන්නේ කුමකට ද යත් එම අටුවා ගණ්ඨිට්ඨානවලට ලීනාර්ථ සැපයීම සිදුකරන විට අනෙක් අටුවාවල එන නය ක්‍රමය ඔස්සේ සිදු කළ යුතු බැවිනි. එසේ මැ ධර්මාර්ථ වශයෙන් ඒවාට විරුද්ධ නොවන අයුරින් ද සිදු කළ යුතු බැවිනි.

ඇතැම් සූත්‍රවලට අදාළ අටුවාවන්හි යම් යම් කරුණු විස්තර කළ යුතුව ඇතත් ඒවා විස්තර නොවී වෙනත් සූත්‍ර අටුවාවන්හි විස්තර වී ඇති නම් එවිට එබඳු කරුණු විස්තර නොකොට අදාළ අටුවාවන්ගෙන් ගතයුතු යැයි පැවසූ වාර ද සංයුක්ත ටීකාවෙහි දැකිය හැකිය. ඒ එසේ මැයි බ්‍රහ්ම සංයුක්තයේ ගාරව සූත්‍ර ටීකාවෙහි **"එත්ථ යං වත්තබ්බං තං සුමංගලවිලාසිනියා දීඝනිකායට්ඨකථාය වුත්තමේව"**[1] යනුවෙන් ද ඛන්ධසංයුක්තයේ එන සීහසූත්‍ර ටීකාවෙහි ද **"උදානට්ඨකථාදිසුපි තථාගතපදස්ස අත්ථෝ වුත්ථෝ ඒව, තස්මා තත්ථ වුත්තනයේන අත්ථෝ වේදිතබ්බෝ"**[2] යනුවෙන් ද සච්චසංයුක්තයේ ආමක මංස සූත්‍ර ටීකාවෙහි **"තස්මා සමන්තපාසාදිකාය විනයට්ඨකථාය වුත්තනයෙන්නෙත්ත විනිච්ඡයෝ වේදිතබ්බෝ"**[3] යනුවෙන් ද සඳහන් ය. එසේ ම නිදාන සංයුක්තයේ එන දුතියදසබල සූත්‍ර ටීකාවෙහි ද **"අයමෙත්ථ සංඛේපෝ විත්ථාරෝ පන පරමත්ථදීපනියං උදානට්ඨකථායං වුත්තනයේන වේදිතබ්බෝ"**[4] යනුවෙන් පවසන ලදී. මෙලෙසැ ටීකාවෙහි ඇතැම් කරුණු එම සූත්‍ර වර්ණනාවලදී විස්තර නොකොට අනික් සූත්‍රවිනය අටුවාවන්ගෙනුත් දත යුතු යැයි පැවසූ වාර ද ඇත.

ඉහත කී නිදන සංයුක්තයේ එන දසබල සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ සංක්ෂිප්තව දේශනා කොට දුතියදසබල සූත්‍රය විස්තර වශයෙන් දෙසූ බැවින් අටුවාවෙහි **"දසබලස්ස පඨමං දුතියස්සේව සංඛේපෝ"**[5] යනුවෙන් පැවසූහ. එයට විස්තර සපයන ටීකාව පළමු සූත්‍රය සංක්ෂිප්තව ධර්ම ඇසීම රුචි කරන පුද්ගලයන්ගේ අදහස පරිදි දෙසූ බවත්, දෙවැන්න භාග්‍යවතුන් වහන්සේගේ රුචිය පරිදි විස්තර

1. සංයුත්ත ටීකා, ගාරව සූත්‍ර වණ්ණනා
2. -එම- සීහසූත්‍ර වණ්ණනා
3. -එම- ආමක මංස සූත්‍ර වණ්ණනා
4. සංයුත්ත නිකාය II බු.ජ.ත්‍රි. පිට 44
5. සංයුත්ත අටුවා II පිට 33 සංස්. බෞ.ස.ම. 2009

වශයෙන් දෙසූ බවත් පවසා ඇත. එම ටීකා පාලිය මෙසෙ යැ "**පඨමං දුතියස්සේව සංඛෙපො පඨමසුත්තේන සංඛෙපවුත්තස්ස අත්ථස්ස විත්ථාරවසේන දුතියසුත්තස්ස දේසිතත්තා, තඤ්ච පන භගවා පඨමසුත්තං සංඛෙපතෝ දේසේසි, දුතියං තතෝවිත්ථාරතෝ. පඨමං වා සංඛිත්තරුචීනං පුග්ගලානං අජ්ඣාසයේන සංඛෙපතෝ දෙසෙසි, දුතියම්පන අත්ථනෝ රුචියා තතෝ විත්ථාරතෝ. සීහසමානවුත්තිකා හි බුද්ධා භගවන්තෝ, තේ අත්තනෝ රුචියා කථෙන්තා අත්තනෝ ථාමං දස්සෙන්ථාව කථෙන්ති, තස්මා දුතියසුත්තවසේන චෙත්ථ අත්ථවණ්ණං කරිස්සාම, තස්මිං සංවණ්ණිතෙ පඨමං සංවණ්ණිතමේව හෝ තීති අධිප්පායයො**"[1] යනුවෙනි. අර්ථය සුකර බැවින් හෙළ බසින් නොතබමු.

සංයුත්ත සඟියෙහි කස්සප සංයුක්තයේ එන සද්ධම්මපතිරූපක සූත්‍රය[2] භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන ලද්දේ කස්සප මහරහතන් වහන්සේ විමසූ ප්‍රශ්නයකට යැ. එනම් "ස්වාමීනි පෙර සික්ෂාපද මද කල බොහෝ භික්ෂූහූ රහත්වූහ. දැන් ශික්ෂා පද බොහෝ ය. රහත් වූ භික්ෂූන් මද ය. මෙයට හේතුව කුමක් ද ප්‍රත්‍ය කුමක් දැයි" කියා විමසූ විට ශාස්තෘන් වහන්සේ "සත්වයන් පිරිහෙන කල්හි දහම අතුරුදහන් වන කල්හි සිඛපද වැඩිවන බවත් එසේ ම රහත්හු ද අඩුවන බවත් දෙසූහ." නැවත ද බුදුපියාණන් වහන්සේ "යම්තාක් කල් ලෝකයෙහි ධර්මය වැනි වූවක් නූපදී ද ඒ තාක් සද්ධර්මයාගේ අතුරුදහන් වීමක් නොවන බවක් දෙසූහ."(**න තාව කස්සප, සද්ධම්මස්ස අන්තරධානං හෝති, යාව න සද්ධම්මපතිරූපකං ලෝකේ උප්පජ්ජති**)

යථෝක්ත සද්ධර්ම ප්‍රතිරූපකත්වය සංයුත්ත අටුවාවෙහි මෙලෙසැ විස්තර වේ. "**සද්ධම්මපතිරූපකන්ති චෙ සද්ධම්මපතිරූපකානී අධිගම සද්ධම්මපතිරූපකඤ්ච පරියත්ති සද්ධම්මපතිරූපකඤ්ච**"[3] යනුවෙන් අධිගම සද්ධර්මප්‍රතිරූපකය ද පර්යාප්ති සද්ධර්මප්‍රතිරූපකයදැයි සද්ධර්මප්‍රතිරූපක දෙකක් සඳහන් යැ ඉහත කී පර්යාප්ති සද්ධර්මප්‍රතිරූපකත්වය ගැන එහි මැ මෙලෙසැ සඳහන් වේ. "**තිස්සෝ සංගීතියෝ අනාරුළ්හං ධාතුකථා ආරම්මණකථා අසුභකථා ඤාණවත්ථුකථා විජ්ජා කදම්බකෝති ඉමේහි පඤ්චහි**

1. සංයුත්ත ටීකා, දසබල සූත්‍ර වණ්ණනා
2. සංයුත්ත නිකාය II බු.ජ.ත්‍රි. පිටු 338
3. සංයුත්ත අටුවා II පිට 150 සංස්. බෞ.ස.ම. 2009

**කථාවත්ථූහි බාහිරං ගූල්හවිනයං, ගූල්හවෙස්සන්තරං ගූල්හමහෝසධං වණ්ණ පිටකං අංගුලිමාල පිටකං රට්ඨපාල ගජ්ජිතං ආලවක ගජ්ජිතං වේදල්හ පිටකංති ඉධං අබුද්ධ වචනං පරියත්ති පතිරූපකං නාම**"[1] යනුවෙනි. කියන ලද ධාතු කථා ආදිය සේ ම ගූල්හ විනයාදියං බුද්ධවචන නොවූ පර්යාප්ති සද්ධර්ම ප්‍රතිරූපක දේවල් වශයෙන් පවසන ලදී.

අටුවාවෙහි සඳහන් වේදල්හ පිටකය වෛතුල්‍ය පිටකය ලෙසැ මෙම සංයුත්ත ටීකාවෙහි "**වේදල්හපිටකන්ති වේතුල්ලපිටකං**"[2] යනුවෙන් සඳහන් ය. එසේ මැ එය නාග භවනින් ගෙන එන ලද්දක් යැයි කියත් යනුවෙන් "**තං නාග භවනතෝ ආනිතන්ති වදන්ති**" අනෙකෙක් වාද භාෂිතයක් යනුවෙන් කියත් යැයි ද පවසා ඇත. තවද අටුවාවෙහි සඳහන් අබුද්ධවචනං යන්නට බුද්ධ වචනය හා විරුද්ධ වන බැවින් අබුද්ධ දේශනයක් යනුවෙන් "ටීකාව "**අබුද්ධවචනං බුද්ධවචනේන විරුජ්ඣනතො**" "අයුරින් ලීනාර්ථ සපයා "**න හි සම්බුද්ධෝ පුබ්බාපර විරුද්ධං වදති**" යනුවෙන් එහි ම කියා ඇත.

මෙලෙසැ අර්ථවිවරණ සපයන ටීකා ඇදුරන් කිසිවිටෙක අටුවාවට විරුද්ධ යෑමක් හෝ විරුද්ධ ප්‍රකාශයක් සිදුකොට නොමැත. සංයුත්ත ටීකාවෙහි "බුදුරජාණන් වහන්සේ පූර්වාපර විරෝධයක් නොදෙසයි" යන යථෝක්ත කියමන ඉතා වැදගත් යැ සූත්‍ර, විනය, අභිධර්ම සංඛ්‍යාතවූ ත්‍රිපිටක බුද්ධවචනයෙහි කිසිදු වචනයක් තවත් වචනයක් හා අර්ථ වශයෙන් හෝ ව්‍යඤ්ජන වශයෙන් විරුද්ධවීමක් නොමැත. එබැවි මහාකාශ්‍යපාදී සංගීතිකාරක ඇදුරන් සේ ම සිහල අටුවා ඇදුරෝ ද මනාව දත්හ. බුදුගොස් හිමියන් මගධ බසට නැගූ අටුවා ආදියෙහි දු කිසිඳු පූර්වාපර විරෝධයක් නැති පිරිසිඳු බුද්ධවචන අර්ථවාක්‍යානය මැ ඇතුළත් බවට සාක්ෂි දීමට අප වැනි මඳ නුවනැත්තන්ගේ ප්‍රකාශ නොවැ, අටුවා සහිත තෙවලාදහමෙහි පරතෙරට ගිය දැනුමැති අනුමාත්‍ර වරදෙහි පවා බිය දුටු ශ්‍රද්ධාදී ධර්මයන්ගෙන් අනූන වූ ථෙරවාදී මහාවිහාර ප්‍රවේණියෙහි උත්තම වූ පුරුෂයන්ගේ කියමන් ප්‍රමාණවත් නොවන්නෙහි ද?

1. සංයුත්ත අටුවා II පිට 150 සංස්. බෞ.ස.ම. 2009
2. සංයුත්ත ටීකා, සද්ධම්ම පතිරූපක සුත්‍ර වණ්ණනා

**"පරිවත්තේති සබ්බාපි සීහළට්ඨකථා තදා**
**සබ්බේසං මූලභාසාය මාගධාය නිරුත්තියා,**
**සත්තානං සබ්බ භාසානං සාඅහෝසිහිතා වහා**
**ථේරියා චරියා සබ්බේ පාලිං විය තමග්ගහුං."**[1]

"එකල්හි සියල්ලන්ගේ මූල භාෂාව වූ මාගධ නිරුක්තියෙන් අටුවාකතා පරිවර්තනය කළ සේක. සත්වයන්ගේ සර්වභාෂී වූ ඕතොමෝ හිත පිණිස වීය. සියලු ම ථේරිය ආචාරීහූ එය පෙළ සෙයින් පිළිගත්හ." යනුවෙන් මහාවංශයෙහි සඳහන් ය. එහි එන "**ථෙරියාචරියා සබ්බේ පාලිං විය කමග්ගහුං**" යන්න මෙකල අටුවා ගැන විවේචනය එල්ල කරන්නන් හොඳින් විමසිය යුතුය. අටුවා ප්‍රතික්ෂේප කිරීමක් හෝ විවේචනයක් එල්ලකරන ඔවුන් නොකියා පවසන්නේ බුදුගොස් හිමියන් සිටි කලැ වැඩ සිටි මහවෙහෙර වැසි ථේරීය ඇදුරන්ට වඩා තමන් නුවණැතියන් බව නොවේ ද? සත්‍ය නම් එය නොවැ. ඒ ඔවුන්ගේ අඥනකම බැව් දත යුතුය.

## වැදගත් කරුණු කිහිපයක්

දේවතා සංයුක්තයේ එන කාම සූත්‍රය වූ කලී දේවතාවකු විමසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් දෙසූ දෙගයක් ඇති කෙටි සූත්‍ර දේශනාවකි.

එනම්,

**"කිමත්තකාමො න දදේ කිමච්චෝ න පරිච්ඡජෙ,**
**කිංසු මුඤ්චෙයිය කල්‍යාණං පාපිඤ්ච න මෝචයේති."**

යනුවෙන් දෙවියා විමසයි.

භාග්‍යවතුන් වහන්සේ එයට මෙසේ,

**"අත්තානං න දදේ පොසො අත්තානං න පරිච්ඡජෙ,**
**වාචං මුඤ්චෙය්‍ය කල්‍යාණං පාපිකංඤ්ච න මෝචයේති."**[2]

යනුවෙන් පිළිතුරු ගය දෙසූහ.

1. ඌනපූරණ සහිතොමහාවංසො පිට 222 සංස්. 1952
2. සංයුත්ත නිකාය I පිට 82

ඉහත කී 'අත්තානං න දදේ' යන්නට අටුවාවෙහි **"අත්තානං න දදේති පරස්ස දාසං කත්වා අත්තානං න දදෙය්‍ය, ඨපෙත්වා සබ්බබෝධිසත්තේති වුත්තං**[1] අත්තානං න දදෙ යනු වෙනෙකෙකුට තමන්ව දාස කොට නොදෙන්නේ ය, සියලු බෝධිසත්වයින් හැර යැයි කියන ලදී." යනුවෙන් සඳහන් ය. සංයුක්ත ටීකාවෙහි **"අත්තකාමොති පාළියං වුත්තත්තා ආහ "ඨපෙත්වා සබ්බබෝධිසත්තේ"ති. තේහි සබ්බසෝ පරත්ථාය ඒව පටිපජ්ජමානා මහාකාරුණිකා පරත්ථකාමා, අත්තකාමා නාම න හෝති, යාව තේසං අත්තත්ථාවහා පටිපත්ති, සාපි යාවදේව පරත්ථා ඒවාති වුත්තං පෝරාණ අට්ඨකථායං"** "අත්තකාමෝ යැයි පෙළෙහි කී බැවින් **"ඨපෙත්වා සබ්බබෝධිසත්තෝ"** යැයි කීහ. බෝධිසත්වයින් සර්වප්‍රකාරයෙන් පරහිත පිණිස ම පිළිපදින්නා වූ මහාකාරුණික වූ පරාර්ථකාමියෝ ය. ආත්මාර්ථකාමීහු නම් නොවෙත්, බෝධිසත්වයන්ගේ යම් ආත්මාර්ථය එලවන්නා වූ ප්‍රතිපත්තියක් වේ නම් එය ද යම් පමණකින් හෝ පරහිතකාමී ම යැයි පුරාණ අටුවාවෙහි කියන ලදී." යනුවෙන් පවසා ඇත.

සංයුත්ත ටීකාවෙහි යථෝක්ත පුරාණ අටුවා පාඨය ඉතා වැදගත් යැ. මන්ද යත් ටීකාවෙහි බොහෝ තැන්හි දැකිය හැක්කේ **"අට්ඨකතායං වුත්තං"** යන පාඨ පමණි. **"පෝරාණ අට්ඨකථායං වුත්තං"** කී පාඨ ඉතා විරල ය. උඩ කී පුරාණ අටුවා පාඨය සංයුක්ත අටුවාවෙහි දැකිය නොහැකිය. ධම්මපාල ආචාර්යන් වහන්සේ සංයුක්ත ටීකාවට ගත්තාවූ පුරාණ අටුවා පාඨය සැබැවින් ම හෙළ මහටුවා පාඨයකි. සංයුක්ත අටුවාවේ එන;

> **"මූලට්ඨකථාසාරං ආදාය මයා ඉමං කරොන්තේන,**
> **යං පුඤ්ඤමුපචිතං තේන හෝතු සබ්බෝ සුඛී ලෝකෝ."**[2]

යන ගාථාවෙහි එන මූලට්ඨකථා සාරං යන්න විස්තර කරමින් **"මූලට්ඨකථාය සාරන්ති පුබ්බේ වුත්තසංයුත මහාඅට්ඨකථාය සාරමේව පුන නිගමන වසේන වුත්තන්ති. අථ වා මූලට්ඨකථාය සාරන්ති**

1. සංයුක්ත අටුවා I පිට 80 සංස්. බෞ.ස.ම. 2009
2. සංයුක්ත අටුවා III පිට 235 සංස්. බෞ.ස.ම. 2009

**පෝරාණට්ඨකථාසු අත්ථසාරං. තේන ඒතං දස්සේති. "සංයුත්ත මහාට්ඨකථාය අත්ථසාරං ආදාය ඉමං සාරත්ථප්පකාසනීනි කරොන්තේන සේසා මහානිකායානම්පි මූලට්ඨකථාසු ඉධ යෝගක්ඛමං අත්ථසාරං ආදාය අකාසින්ති."**[1]

'මූලට්ඨකථාය සාරං' යනු පූර්වේ කියන ලද සංයුක්ත මහාඅටුවාවෙහි සාරය ම ය. නැවත නිගමන වශයෙන් කීවේ යැයි නොහොත් 'මූලට්ඨකථාය සාරං යනු පුරාණ අටුවාවන්හි අර්ථ සාරයයි. එයින් මෙකරුණ කියැවෙයි. සංයුක්ත මහාඅටුවාවෙහි අර්ථ සාරය ගෙන මෙම සාරත්ථප්පකාසනිය කරන්නා වූ (මම) මෙහි සෙසු මහානිකායන්ගේ ද මූලට්ඨකථාවන්හි අර්ථසාරය වෙන්කරගෙන කෙරුවෙමි." යනුවෙන් සංයුක්ත ටීකාවෙහි සඳහන් යැ. අටුවාවෙහි දක්වූ මූලඅට්ඨකථාව නම් පුරාණ සීහල අටුවාව බැව් පැහැදිලි ය. එවිට කාමසූත්‍ර ටීකාවෙහි එන පුරාණ අටුවා පාඨය පාලි සංයුත්ත අටුවාවේ නැතත් පුරාණ සීහල මහාඅටුවා පාඨයක් බැව් උක්ත කරුණු වලින් මනාව පැහැදිලි වනු ඇත. එයින් ද පුරාණ හෙළටුවා පාඨයෝ විටෙක දී ධම්මපාලාචාර්යන් වහන්සේගේ සංයුක්ත ටීකාකරණයට ද යොදා ගත් බවට සාක්ෂි වෙත්. තවද බුදුගොස් හිමියන් හෙළටුවා ගිනි තැබූ බව කියන ඇතැමුන්ගේ මුග්ධ ප්‍රලාපයන් බිඳී යන්නේ සංයුක්ත ටීකාකාර උතුමන්ගේ සමය වන විටත් හෙළටුවා තිබූ බව පසක් කරමිනි.

අටුවා පිළිබඳව විවේචන එල්ල කිරීමටත් විවේචනාත්මක ලිපිලේඛන මෙන් ම ග්‍රන්ථ පරිශීලනයටත් මෙකල සරසවි ඇදුරන් සේ මැ, නවීන ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබන ඡාත්‍රයෝ ද මහත් වූ අභිරුචියක් දක්වති. වසර කිහිපයක් ඇතුළත එහෙන් මෙහෙන් ලද අධ්‍යාපන ක්‍රමකින් උපාධි කිහිපයක් ලබා මානයෙන් ඔලුව උදුම්මවා එලෙසැ සිදුකිරීමට යෑම හෝ සිදුකිරීම මහත් වූ අනුවණ කමක් බැව් දත යුතුයැ. එබඳු ග්‍රන්ථයන්ගෙන් සහ එබඳු ලිපිලේඛන තුළින් ද සම්බුදු සසුනට මෙන් ම මානව සමාජයට ද සිදුවන්නේ මහත් වූ හානියකි. ලොව්තුරු සසුන පසුබැස්සවීමටත් ගිහිපැවිද්දන් බොහෝ අකුසල් රැස්කොට අපාගාමී කරවීමටත් එබඳු එක ලිපියක් එක ග්‍රන්ථයක් වුව ද හේතු වනු ඇත.

1. සංයුත්ත ටීකා නිගමනකතාවර්ණනා

'අටුවා පරීක්ෂණය' නමැති ග්‍රන්ථය වූ කලී ඉන් එකකි. මෙයින් සිදු වූ ශාසනික හානිය වනාහි දන්නෝ දනිති. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ගරු සිසුන් අතර ඉහළින් වැජඹෙන මෙය සාහසික ලෙස ථෙරවාදී මහාවිහාරීය ප්‍රවේණියෙහි අටුවාවන් විවේචනය කරන්නේ හරියාකාර කරුණු දැන නොවේ. විටෙක ස්වකීය මතය ස්ඵුට කර ගැනීමට එතුමන් මැදුම් සඟියේ එන සූත්‍ර පවා ප්‍රතික්ෂේප කිරීමට අදූරදර්ශී වී ඇත.[1] එපමණක් නොවැ මෙහි නොයෙක් තැන ඇත්තා වූ තවත් දුර්මත බොහෝ යැ. බාගදා මෙය දකින ඇතැමෙක් මෙකරුණු පිළිගැනීමට ද නුපුළුවන. කරුණු මෙසේ හෙයින් බුද්ධඝෝෂ මහාස්වාමීන් වහන්සේ පවා විනය අටුවාවෙහි '**අථ ඛෝ සබ්බට්ඨකථාසු වුත්තත්තා අට්ඨකථාචරියාව එත්ථ පමාණං, න අඤ්ඤවිචාරණා. පුබ්බේපි ච අවෝචුම්හ. "බුද්ධේන ධම්මෝ විනයෝ ච වුත්තෝ, යෝ තස්ස පුත්තේහි තථේව ඤාතෝ"ති ආදී. අට්ඨකථාචරියා හි බුද්ධස්ස අධිප්පායං ජානන්ති.**'[2] යනුවෙන් ද **අට්ඨකථාචරියානං වා සද්ධාය ගහෙතබ්බන්ති**'[3] යනුවෙනුත් කී බැවින් අටුවා පිළිබඳව ශ්‍රද්ධාව උපදවා ත්‍රිපිටක පරියත්තිය පෞරාණික ථෙරවාදී මහාවිහාරීය ක්‍රමවේදයට අනුව හැදෑරීමට උත්සාහවත් විය යුතුය.

---

1. අටුවා පරීක්ෂණය. පිට **53** පොල්වත්තේ බුද්ධදත්ත හිමි, සංස්. **2002**
2. සම.පා. **II** පිට **549** හේ.මු.
3. සම.පා. **II** පිට **561** හේ.මු.

## ආශ්‍රිත ග්‍රන්ථ :


අඞ්ගුත්තර නිකාය 2, බු.ජ.ත්‍රි
කංඛාවිතරණී අභිනවටීකා, සංස්. ඡට්ඨසංගායනා
කංඛාවිතරණී අභිනවටීකා, සංස්. යූ.පී. ඒකනායක, 1912
කංඛාවිතරණී පිටපොත, සංස්. කළුකොඳයාවේ පඤ්ඤාසේකර හිමි, 1936
කංඛාවිතරණී පුරාණටීකා, සංස්. ඡට්ඨසංගායනා
කංඛාවිතරණී-මාතිකඅට්ඨකථා, සංස්. කරඳන ජිනරතන හිමි හේ.මු, 1930
කුදුසික හා පුරාණ විස්තරසන්නය,
සංස්. මොරගල්ලේ ඤාණොභාස තිස්ස හිමි, 1954
චන්දවිමල මහනාහිමි, රේරුකානේ, විනයකර්ම පොත
චුල්ලවග්ගපාලි 1 බු.ජ.ත්‍රි
චුල්ලවග්ගපාලි 2 බු.ජ.ත්‍රි
පරිවාරපාලි 2, බු.ජ.ත්‍රි
පාචිත්තිපාලි 2, භික්ඛුණී විභංගය, බු.ජ.ත්‍රි
පාරාජිකපාලි , බු.ජ.ත්‍රි
පාරාජිකපාලි ගැටපදය, සංස්. පණ්ඩිත අමිතිරිගල පඤ්ඤාවංස හිමි, 1942
පාලිමුත්තක විනයවිනිශ්චය සංග්‍රහය,
සංස්. දෙහිගස්පේ පඤ්ඤාසාර හිමි, 1931
පාලිමුත්තක විනයවිනිශ්චය සංග්‍රහටීකා,
සංස්. කහඳාමුවදුර පඤ්ඤාසාර හිමි, 1917
බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, අටුවා පරීක්ෂණය, 2002
බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, ඌනපූරණ සහිතොමහාවංසො, 1952
බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලිසාහිත්‍ය, 2010
මජ්ඣිම නිකාය 1, බු.ජ.ත්‍රි
මජ්ඣිම නිකාය 3, බු.ජ.ත්‍රි
මහාවග්ගපාලි 1, බු.ජ.ත්‍රි
මහාවග්ගපාලි 2, බු.ජ.ත්‍රි
මිලින්දපඤ්හො සංස්. බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය හිමි හේ.මු. 2013
මුලුසික වර්ණනාව, සංස්. සීනාවත්තේ ගුණාලංකාර තිස්ස, 1935
වජිරබුද්ධිටීකා, සංස්. ඡට්ඨසංගායනා
විනයකෝෂය, මොරටුවේ සාසන රතන හිමි, 1955

විනයවිනිච්ඡය, සංස්. ඡට්ඨසංගායනා

විනයවිනිච්ඡයටීකා, සංස්. ඡට්ඨසංගායනා

විනයාලංකාරටීකා, සංස්. ඡට්ඨසංගායනා

විනිශ්චයාර්ථදීපනී නම් විනයවිනිච්ඡය විස්තාර්ථ ව්‍යාඛ්‍යානය, ලංකාගොඩ ශ්‍රී ධීරානන්ද හිමි, 1957

විමතිවිනෝදනීටීකා, සංස්. ඡට්ඨසංගායනා

විමතිවිනෝදනීටීකා, සංස්. බේරතුඩුවේ ධම්මාධාර හිමි, 1935

විශුද්ධිමාර්ගය, සංස්. පමුණුවේ බුද්ධදත්ත හිමි හේ.මු. 2006

විශුද්ධිමාර්ග සන්නය, සංස්. බෙන්තර සද්ධාතිස්ස හිමි, 1957

සංයුත්ත ටීකා, සංස්. ඡට්ඨසංගායනා

සංයුත්ත නිකාය 1 බු.ජ.ත්‍රි

සංයුත්ත නිකාය 2 බු.ජ.ත්‍රි

සමන්තපාසාදිකා-විනයඅට්ඨකථා 1 හේ.මු, 1950

සමන්තපාසාදිකා-විනයඅට්ඨකථා 2 හේ.මු, 1945

සමන්තපාසාදිකා-විනයඅට්ඨකථා 3 හේ.මු, 1946

සමන්තපාසාදිකා-විනයඅට්ඨකථා 4 හේ.මු, 1948

සාරත්ථදීපනීටීකා, සංස්. ඡට්ඨසංගායනා

සාරත්ථදීපනීටීකා, සංස්. මාබෝපිටියේ මේධඞ්කර හිමි, 1933

සාරත්ථප්පකාසිනී-සංයුත්තනිකායඅට්ඨකථා 1 බෞ.ස.ම, 2009

සාරත්ථප්පකාසිනී-සංයුත්තනිකායඅට්ඨකථා 2 බෞ.ස.ම, 2009

සාරත්ථප්පකාසිනී-සංයුත්තනිකායඅට්ඨකථා 3 බෞ.ස.ම, 2009

සුමඞ්ගලවිලාසිනී-දීඝනිකායඅට්ඨකථා 1 හේ.මු, 2006




**"ස්ථවිරවාදී ශාසනයේ ප්‍රතිෂ්ඨාව හා ප්‍රවෘත්තිය විනය"** බැව් අර්ථකථාචාර්යයන් වහන්සේලා විසිනුදු සුභාවිත සත්‍යයකි. ඓතිහාසික දෘෂ්ටිකෝණයෙන් පිරික්සා බැලුව ද ථෙරීය සම්ප්‍රදාය විනයවාදී වූ බැව් දක්නට හැකිය. මේ හේතුවෙන් ථෙරවාද විනය සාහිත්‍යයට පාලි හා සිංහල යන දෙබසින් ම උත්පන්න වූ විස්තර විවරණ, ටීකා ප්‍රකරණ ආදි ග්‍රන්ථ රාශිය අතිමහත් ය. ගරුතර මකුලෑවේ සුදස්සන ස්වාමින් වහන්සේ විසින් සම්පාදිත මෙම කුදු ගත එකී විනයවාදී ප්‍රවණතාව අදටත් ලාංකේය ථෙරීය සම්ප්‍රදාය තුළ ආරක්ෂිත ව ඇති බවට කදිම නිදසුනකි.

ගත් කතුවර සුදස්සන ස්වාමින් වහන්සේ වනාහි අතීතයේ වුසූ විනයධර යතිවරයන් වහන්සේලාගේ වර්තමාන ප්‍රතිබිම්බයක් බව දිගු කලක පටන් අපගේ සදාශ්‍රය තුළින් අකුටිලව ප්‍රකාශ කළ හැකිය. උන්වහන්සේ ගැන දතුවෝ මා හා සාකල්‍යයෙන් ම එකඟ වන බැව් සුස්ථිර ය. ධර්ම විනයෙහි බැසගත් නිපුණතා ඇති සුදසුන් හිමියෝ මෙගත කෙරුමට සුනිසි යතිවරයන් වහන්සේ නමක් වෙති. විනය පිළිබඳ කලුෂයන්ගෙන් තොරව ඉතා වැදගත් මැය කිහිපයක් යටතේ ප්‍රතිපාදිත ව ඇති මෙගත විනයගරුකයන්ට හස්තසාර වස්තුවෙකි. විනය ගරුක ලක්දිව් සඟ සබයකින් **"විනය වෙසරද"** ගරු නමකින් වහ වහා මුන්වහන්සේ පුදත්ව'යි අපගේ අවංක පැතුමයි.

මේ වගට,

මෙත් සිතැති,

පූජ්‍ය ඌරුපැලැව්වේ හේමාරාම ස්ථවිර,

B.A (SJP), M.A (B.P.U), Ph.D (Candidate)

Dip.in Dhamma communication, Dip.in Buddhism and Pali

බෙල්ලන්විල රාජමහා විහාරය,

බෙල්ලන්විල, බොරලැස්ගමුව.

2559 / 2015.12.21

ප්‍රකාශනය
**ශ්‍රී සද්ධර්ම මන්දිරය**
'සදහම් සෙවණ'
134/A, ගලගෙදරවත්ත,
වැල්හේන පාර, මාතම්මන,
මිනුවන්ගොඩ.

පොත් ලබා ගැනීම සහ නැවත මුද්‍රණය සඳහා සියලු විමසීම්,
**දහම් මැදුර භාවනා මධ්‍යස්ථානය**
නෙළුම් පෙදෙස,
කලපළුවාව, රාජගිරිය.
දුරකතන: 071-9374002, 071-4417813
විද්‍යුත් ලිපිනය: info@sadaham.net
වෙබ් අඩවිය: www.sadaham.net

පටිගත කරන ලද ධර්මදේශනා, වැඩසටහන් සහ ශ්‍රී සද්ධර්ම මන්දිරය මඟින් ප්‍රකාශිත/සංරක්ෂිත දහම්පොත් www.sadaham.net යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.